# පෙරදිග සංගීතය

## 8 වන ශ්‍රේණිය

### ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය



Graphic designed : Ravindra Thenuwara

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරදිග සංගීතය

## 8 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2009 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

නව සහශ්‍රයේ දී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ දැනට පවතින ගැටලු කිහිපයක් නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකි ය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ සමාජීය හා පුද්ගල දුර්වලතා මඟහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේ ය. නමුදු වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක් තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීම මෙම පසුබෑමට එක් හේතුවකි.

මෙම තත්ත්වය මඟහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂය මාලා සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂයමාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණත් මඟින් අනාගතය ගොඩනඟා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්ය භාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු පූර්ණ විශ්වාසයයි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මඟපෙන්වීම පිළිපැදීම් මඟින් ඔබට සාර්ථක ගුරු භවතකුවීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයින් ඇගයීමේ දී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදවුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙස ම එය විදුහල්පතිවරුනට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් සේ උපකාරී වනු නොඅනුමාන ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම කළ යුතු ය. මක්නිසාදයත්, මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුන්ට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගි වූ සියලු දෙනාටම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

## සංඥාපනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහි වූහ.

නව විෂය මාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගේ කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ දන්නා දේ ඔවුන්ට කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි ව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්වයකට ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ ක්‍රියාකාරකම් හා තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව ක්‍රියාකාරකම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන් ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මෙසේ ක්‍රියාකාරකමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායී ඉගෙනුමකට හේතු වේ.

මෙමඟින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම එයටම ගැළපෙන ගුරු භූමිකාවක් හා පංතිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

මාර්ගෝපදේශය :

| | | |
|---|---|---|
| මහාචාර්ය ලාල් පෙරේරා | - | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| විමල් සියඹලාගොඩ මහතා | - | සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| සුදත් සමරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (සෞන්දර්ය)<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

විෂය සම්බන්ධීකරණය :

| | | |
|---|---|---|
| ජානකී පතිරණගේ මහත්මිය | - | ව්‍යාපෘති නායිකා (සංගීත)<br>ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**විෂය උපදේශනය** :

| | | |
|---|---|---|
| මහාචාර්ය අමරා රණතුංග මහත්මිය | - | සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය. |
| ගුණපාල විතානගේ මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>රත්නපුර. |

විෂයමාලා කමිටුව :

අභ්‍යන්තර

| | | |
|---|---|---|
| සුදත් සමරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (සෞන්දර්ය)<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ජානකී පතිරණගේ මහත්මිය | - | ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

බාහිර

| | | |
|---|---|---|
| ගුණපාල විතානගේ මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>රත්නපුර. |
| ශාන්තා රමණී ඩයස් මහත්මිය | - | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ගම්පහ. |
| කේ. කේ. එස්. ජයවික්‍රම මහත්මිය | - | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>පිළියන්දල. |
| ආර්. ඩී. පෙරේරා මහතා | - | ගුරු සේවය-පුෂ්පදාන බාලිකා විද්‍යාලය<br>මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි මහතා | - | ගුරු සේවය-තක්ෂිලා මධ්‍ය මහා<br>විද්‍යාලය, හොරණ. |
| ජී. රංජිත් ප්‍රියන්ත සිල්වා මහතා | - | ගුරු සේවය-ජනාධිපති විද්‍යාලය<br>මීනුවන්ගොඩ. |

ඇගයීම් මණ්ඩලය

| | | |
|---|---|---|
| මහාචාර්ය සනත් නන්දසිරි මහතා | - | සංගීත අංශය,<br>සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය ,<br>කොළඹ. |
| ආචාර්ය දයාරත්න රණතුංග මහතා | - | හිටපු අධ්‍යක්ෂ<br>සංගීත හා පර්යේෂණ අංශය<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව. |
| එඩ්වඩ් ජයකොඩි මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |
| නිහාරි සමන් කුමාරි මුණසිංහ මිය | - | ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ශ්‍රී ජයවර්ධනපුර |
| කමණී නාරංගොඩ මෙනවිය | - | කලාප අධ්‍යාපන කාර්යාලය,<br>හෝමාගම. |
| චිත්‍රානන්ද ෆොන්සේකා මහතා | - | ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය,<br>හොරණ. |
| ජී. කේ. ලීනා මාග්‍රට් මිය | - | ගුරු සේවය, බෞද්ධ බාලිකා විද්‍යාලය,<br>ගල්කිස්ස. |

| | | |
|---|---|---|
| පිටකවර නිර්මාණය<br>හා සිතුවම් | - | රවීන්ද්‍ර තේනුවර මයා<br>සහකාර ව්‍යාපෘති නිලධාරී -<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිගණක වචන සැකසීම | - | ආර්. ආර්. කේ. පතිරණ මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විවිධ සහාය | - | මාලනී වික්‍රමසිංහ මිය<br>ලක්ෂ්මි පෙරේරා මිය<br>ඩයස් අමරසිංහ මයා |

# 1.0 විෂය නිර්දේශය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1.0 | විෂය නිර්දේශය | |
| | 1.1 හැඳින්වීම | 1 |
| | 1.2 සංගීත විෂයයේ අරමුණු | 2 |
| | 1.3 පෙරදිග සංගීත විෂයයේ පොදු නිපුණතා | 3 |
| | 1.4 8 ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | 4 |
| | 1.5 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය හා කාලච්ඡේද | 5-6 |
| | 1.6 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායන් | 7 |
| | 1.7 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 8 |
| 2.0 | ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය | 9 |
| | 2.1 හැඳින්වීම | 10-12 |
| | 2.2 ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ගුරු භවතුන්ට උපදෙස් | 13 |
| | 2.3 ක්‍රියාකාරකම් සන්තතිය | 14-169 |
| 3.0 | තක්සේරුව හා ඇගයීම | 170 |
| | 3.1 හැඳින්වීම | 171 - 172 |
| | 3.2 ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණය | 173 - 182 |
| | 3.3 වාර විභාග සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍රය | 183 - 187 |

# හැඳින්වීම

2009 වර්ෂයේ සිට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක වන නිපුණතා පාදක විෂය මාලාවට අනුකූලව 8 වන ශ්‍රේණියේ දී මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක වේ.

මෙතෙක් ක්‍රියාත්මක වූ අරමුණු පාදක විෂය නිර්දේශ වෙනුවට නිපුණතා පාදක නව විෂය නිර්දේශයක් හඳුන්වා දීමෙන් ගුරුවරයාගේ සම්ප්‍රේෂණ භූමිකාව පරිණාමන භූමිකාවකට පරිවර්තනය වේ.

මෙහි දී ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ ශිෂ්‍යයා විෂය කරුණු ගවේෂණයට යොමු කොට ක්‍රියාකාරකම් මගින් ලබන ඉගෙනුම ජීවිත පුරුද්දක් බවට පත්වනු ඇත. එය නිපුණතාවක් ලෙස හැඳින්වේ.

රසාස්වාදය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ප්‍රායෝගික සිද්ධාන්ත හා සංස්කෘතික පසුබිම වශයෙන් විෂය ක්ෂේත්‍ර 5 ක් මීට පෙර ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයෙහි වෙන් වෙන්ව දක්වා තිබුණ ද ඒවා නිපුණතා පාදක ක්‍රියාකාරකම් ලෙස ප්‍රායෝගික ස්වරූපයෙන් ඉගෙනුමට යොමු කිරීම නව විෂය නිර්දේශය මගින් සිදුවේ.

දැනුම කුසලතා වලින් යුතු පුද්ගලයන් පමණක් නොව, මානව හිතවාදී, නිර්මාණාත්මක චින්තනයෙන් හෙබි, සංවේදී රසිකත්වයක් ඇති පුරවැසියකු බිහි කිරීම ද පාසල් විෂය මාලාවෙන් ඉටුවිය යුතු ය. ඒ සඳහා දායක වන සෞන්දර්ය විෂයයට වැදගත් ස්ථානයක් හිමි වේ.

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ සංගීත විෂයය ඉගෙනුමෙන් ශිෂ්‍යයාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවනු ඇත. මෙහි දී පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 8 ක් හඳුන්වා දී ඇත. එම නිපුණතාවන්ට අනුව එක් එක් ශ්‍රේණියේ දී ලඟාවිය යුතු යැයි අපේක්ෂිත නිපුණතා මට්ටම් පෙළ ගස්වා ඇත.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගොඩනගා ඇති වුවද කිසියම් ශිෂ්‍යයකු වාදනය මූලික කොටගෙන මෙම විෂයයන් හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මගින් සියළුම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැක.

## 1.2 විෂය අරමුණු

පරිසරය ඇසුරින් වින්දන ශක්ති වර්ධනය

පරිසරයෙහි සියලු සංසිද්ධින් මිනිස් ජීවිතය හා බැඳී පවතී. ශිෂ්‍යයා තුළ පරිසරය හා බැඳි සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳ අවධියක් ඇතිකිරීමෙන් පරිසරයානුබද්ධ ව වින්දන ශක්ති වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය

ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු හා අවස්ථාවන්හි දී නිර්මාණශීලී ව කටයුතු කිරීම සඳහා අවශ්‍ය චින්තන ශක්තිය වර්ධනය හා ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා උසස් නිර්මාණ කෘති බිහිකිරීමේ හැකියා වර්ධනය මෙහි දී අපේක්ෂා කෙරේ.

ඵලදායි දිවි පැවැත්මට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය

ජීවිතය ඵලදායි ලෙස ගත කිරීමේ හැකියාව මෙන් ම යම් කාර්යයක දී කාර්යක්ෂම ව කටයුතු කිරීමේ හැකියාව ද අවශ්‍ය වේ. එමෙන් ම අන්‍යෝන්‍ය සුහදතාවය සහ එකිනෙකා පිළිබඳ ගෞරවණීය හැඟීමකින් යුතු ව කටයුතු කිරීමේ හැකියාව ලැබීම වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය මෙහි දී අපේක්ෂා කෙරේ.

දේශීය අනන්‍යතාවයන් හඳුනා ගැනීම හා අගය කිරීම

දේශීය සංස්කෘතික අංග හඳුනාගැනීමෙන් දේශාභිමානී හැඟීමකින් යුතුව සහ දේශීය අනන්‍යතාවයකින් යුතු ව කටයුතු කිරීම පිළිබඳ උදාර හැඟීම් සමුදායක් වර්ධනය කිරීම වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය සෞන්දර්ය විෂයානුබද්ධ දැනුම ලබාදීම මෙහි දී අපේක්ෂා කෙරේ.

විචාර ශක්ති වර්ධනය

විවිධ සන්නිවේදන මාධ්‍යයක් ඔස්සේ විවිධ වැඩසටහන් ප්‍රචාරය කරන අතර හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීමට හැකි උසස් රසඥතා වර්ධනයක් මෙහි දී අපේක්ෂා කෙරේ.

මාර්ගෝපදේශනය උපකරණයක් ලෙස භාවිත කිරීම

ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සම්පාදනය කරන්නන්ට ගුරු දෙගුරුන්ට හා පාසල් ශිෂ්‍යයන්ට සහ මින් ඔබ්බට ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කරන්නන්ට මෙම විෂය නිර්දේශය මාර්ගෝපදේශයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.3 පෙරදිග සංගීත විෂයයේ පොදු නිපුණතා

1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

3.0 සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

4.0 දේශීය ජනසංගීතාංග පිළිබඳ  ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

5.0 ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

6.0 සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

7.0 සංකේතානුසාරයෙන්  සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු  කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

8.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ එහි භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර, ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

## 8 ශ්‍රේණියට අදාළ **නිපුණතා මට්ටම්**

1.1 ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

1.2 මාත්‍රා තුනේ සහ හතරේ තාල පද අධ්‍යයනය කරයි.

2.1 ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

3.1 අද්‍යතන සරල ගීත රසාස්වාදයේ පුහුණු වෙයි.

3.2 සම්භාව්‍ය සංගීත රසාස්වාදයට හුරුවෙයි.

3.3 ගීතයේ ප්‍රබලතාවය සාකච්ඡා කරමින් රස විඳියි

4.1 මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

5.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනාගනිමින් අගය කරයි.

6.1 ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි..

7.1 විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.

7.2 බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි..

## 1.5 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය හා කාලච්ඡේද

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාල ඡේද |
|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි. | • බිලාවල්, භූපාලි, කාෆි යන රාග විස්තර<br>• එම රාගවල ස්වර අභ්‍යාස<br>• එම රාගවල සර්ගම්<br>• එම රාගවල මධ්‍යලය ගීත බිලාවල්, කාෆි, භූපාලි රාගවලට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය | 25 |
| | 1.2 මාත්‍රා තුනේ සහ හතරේ තාලපද අධ්‍යයනය කරයි. | • මාත්‍රා තුනේ සහ හතරේ හින්දුස්ථානී,දේශීය තාලපද සහ බටහිර තාලපද 3/4, 4 x4 Rhythm<br>• හින්දුස්ථානි තාලයක කොටස් ( මාත්‍රා, විභාග, තාලස්ථාන, ආවර්ත) | |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් ගීත වාදනය කරයි. | • ස්වර පුවරුව සඳහා කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• හස්ත සාධන අභ්‍යාස<br>• සිතාර්, එස්රාජ් භාණ්ඩවල ස්වභාවය, ස්වර පිහිටීම් සහ ඉතිහාසය | 10 |
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කරගැනීමට හුරුවෙයි. | 3.1 අද්‍යතන සරල ගීත රසාස්වාදයේ පුහුණුවෙයි. | • සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය<br>• සරල ගීත ගායනය<br>• සරල ගීත රසාස්වාදය | 22 |
| | 3.2 සම්භාව්‍ය සංගීත රසාස්වාදයට හුරුවෙයි. | • රාගධාරී සංගීතයේ ඛ්‍යාල් ගායන ශෛලීය, ආකෘතිය විශේෂතා සහ එහි ස්වභාවය(මුකඩා සමග්‍රහයට වැටීම, තාලයේ වැදගත්කම) | |

| | | | |
|---|---|---|---|
| | | • ගීත ශ්‍රවණය සහ රසාස්වාදය<br>• තබ්ලා වාදනයක සුවිශේෂ, අංග (කායදා, පල්ටා, ගත්, පරන්, තිහායි, චක්‍රදාර්)<br>• තබ්ලා වාදන රසාස්වාදය<br>• තබ්ලාවේ ව්‍යුහය, ආරම්භය, භාවිතය. | |
| 4.0 දේශීය ජනසංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි. | 4.1 මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි. | • වන්නම් හා ප්‍රශස්ති පිළිබඳ තොරතුරු<br>• උකුසා වන්නම්, නෛයඩි වන්නම් සහ ප්‍රශස්ති ගායනය | 12 |
| 5.0 ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 ශ්‍රී ලංකාවේ පැවැති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනාගනිමින් අගය කරයි. | • නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා.<br>• නාඩගම් සහ නූර්ති ගීත ගායනය.<br>• මද්දලය හා පද | 10 |
| 6.0 සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි. | 6.1 ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | • රිද්ම රටා<br>• රිද්මරටාවකට ස්වර යෙදීම<br>• පද කොටස්වලට තනු යෙදීම | 08 |
| 7.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත, කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි. | 7.1 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.<br><br>7.2 බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි. | • මූලික මත් ගණ තුන හා බැඳි රිද්ම රටා<br>• යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාර<br>• සදෘස්මත් සහ ගීමත්<br><br>• රේඛා මණ්ඩලය සහ ඒ මත ස්වර පිහිටීම<br>• ප්‍රස්තාරයක දි ස්වර සඳහා යොදාගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම් | 10 |
| 8.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | | • මෙම නිපුණතාවයෙහි 1 වන මට්ටම 9 ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වේ. | |

## 1.6 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මූලික ව සිසුන් ගවේෂණයට යොමු කිරීම අපේක්ෂා කෙරේ. හුදෙකලාව දැනුම ගවේෂණයට වඩා යුගල හෝ කුඩා කණ්ඩායම් වශයෙන් මෙම කාර්යයේ සිසුන් යෙදවීම අර්ථවත් වේ. මේ අනුව සමාජ හැකියා වර්ධනය කිරීමට මෙම ක්‍රමය දායක වේ.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයට ක්‍රම ශිල්ප රාශියක් ඇතුළත් කළ හැකි වේ.

ප්‍රවේශය සඳහා

- ❖ බුද්ධි කලම්බනය
- ❖ සංවාද
- ❖ භූමිකා රංගන
- ❖ පටිගත කළ ගීත ඇසුරෙන් ප්‍රවේශවීම
- ❖ පින්තූර ඇසුරෙන්

ගවේෂණය සඳහා

- ❖ කණ්ඩායම් සාකච්ඡා
- ❖ නිර්මාණ ක්‍රියාකාරකම්
- ❖ තොරතුරු අධ්‍යයනය
- ❖ ප්‍රායෝගික ක්‍රියාකාරකම්
- ❖ ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක ආශ්‍රිත ක්‍රියාකාරකම්
- ❖ ක්ෂේත්‍ර චාරිකා
- ❖ ගායන වාදන ප්‍රසංග
- ❖ නාට්‍ය නිර්මාණ නැරඹීම.

## 1.7 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ළමයාගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව ආදි විෂයයන් අවශ්‍ය වන්නාසේම ඔවුන්ගේ වින්දන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම අත්‍යාවශ්‍ය වේ. නිපුණතා පාදක ක්‍රියාකාරකම් පංති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයාගේ සංගීත විෂයය හා බැඳි ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම මෙන්ම යහපත් ආකල්ප වර්ධනයෙන් සුසමාහිත පෞරුෂයක් ගොඩනැගෙනු ඇත.

මෙම කාර්යයෙහිලා පහත දැක්වෙන පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ.

1. ළමා ගීත ගායන වාදන තරඟ
2. ළමා නාට්‍ය තරඟ
3. ගායන, වාදන ප්‍රදර්ශන
4. සෞන්දර්ය කලා සංගම් පිහිටුවීම
5. පන්ති මට්ටමේ කෙටි විවිධ ප්‍රසංග
6. වාර්ෂික විවිධ ප්‍රසංග
7. නව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් ආදේශ භාණ්ඩ නිර්මාණ
8. බැති ගී ප්‍රසංග
9. පරිගණක තාක්ෂණය ඇසුරෙන් නිර්මාණ
10. උදෑසන රැස්වීම ආශ්‍රිතව කරනු ලබන ගායන වාදන ක්‍රියාකාරකම්.
11. පාසල අවට ප්‍රදේශයේ පැවැත්වෙන විශේෂ සංගීත උත්සව හා ශාන්තිකර්ම.
12. රාජ්‍ය උත්සව හා බැඳි ගායන වාදන අංග
13. පාසල් තූර්ය වාදන කණ්ඩායම්.

# 2.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## 2.1 හැඳින්වීම

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීනව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANS-ACTION ROLE) වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැරයන දරු දැරියන්ගේ චින්තන කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනාගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවධි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් අන්දමින් දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතරව සිසු- සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළෙයි. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන්ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්ය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අවම වශයෙන් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය පරිදි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීමද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්ය වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමුවන කොටස මඟින් හඳුන්වා දෙනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගතහැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි මේ සෑම ක්‍රියාකාරකමක් ම සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමුවන පියවර මඟින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGE-MENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන්, සංවර්ධනය කරගතයුතු මූලික නිපුණතා හා සම්බන්ධ විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන්, සංවර්ධනය කරගතයුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරු සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදාගැනීම ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය. දෙබස්, භූමිකා රංගන, කවි, ගීත ආදර්ශන (DEMONSTRATIONS) වැනි දෙයක් සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ගනිමින් ක්‍රියාකාරකම්වල පළමුවන පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කරගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වාදීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබාදීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් සහ පැවරුමක් පදනම් කරගෙන ය. ගැටලුවට සම්බන්ධ වීමට පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුන්ට හැකිවන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින් ශක්තිමත් බවෙන් යුතුව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කරගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහ යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශය පසුබිම

පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුණු හැකියා පදනම් කරගනිමින් අවස්ථාවෝචිතව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළයුත්තේ සමූහ ඉදිරිපත් කිරීම සඳහා සිසුන් ඉරිපත් කිරීමයි. සෑම සාමාජිකයෙකුටම වගකීම පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතුවීමට අවස්ථා සම්පාදනය වී තිබීම ය.

ක්‍රියාකාරකම්වල සිව්වන පියවරේ දී සොයා ගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුනගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුවද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබාදීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාරවන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරතවූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත්, සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදුකිරීම ගුරුවරයාගෙන් අපෙක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටුවන්නේ දැයි නිරතුරුව සොයාබැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබාගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන්ට පැහැදිලි කිරීම හා විස්තාරණයට යොමු වනවිට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ ලැබේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල්තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථාව ඇති අතර, අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමුවන විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත්වන මෙම විෂය මාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැළකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

## 2.2 ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ගුරු භවතුන්ට උපදෙස්

11 ශ්‍රේණියේ ක්‍රියාකාරකම් වාරවලට බෙදීම

1 වන වාරය සඳහා නිපුණතා - 1.0, 2.0 (2.13 දක්වා)
2 වන වාරය සඳහා නිපුණතා - 2.0 (2.1.4) සිට 4.0
3 වන වාරය සඳහා නිපුණතා - 5.0, 6.0, 7.0

ආවරණය වන සේ ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගන්න

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් කාලච්ඡේද කිහිපයකට සකසා ඇති අතර ඔබට අභිමත පරිදි කාලච්ඡේදයට අදාළ කොටස සීමා කර ගත හැකි ය.

- ක්‍රියාකාරකම ක්‍රියාත්මක කළයුතු ආකාරය පියවර වශයෙන් සඳහන් කර ඇති පරිදි සංවිධානය කර ගන්න.

- පන්ති කාමරයේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේ දී එහි සිසුන් සංඛ්‍යාවට අනුපාතිකව කුඩා කණ්ඩායම් වශයෙන් සැලසුම් කර ගන්න.

- ක්‍රියාකාරකම්වල යෝජනා කර ඇති ක්‍රමවේදයට අමතර ව ගුණාත්මක සංවර්ධනය සඳහා ගැලපෙන, සුදුසු වෙනත් ක්‍රමවේදයක් භාවිත කිරීමේ නිදහස ගුරුවරයා සතු වේ.

- ගුරුවරයා විසින් ඉගෙනුම්- ඉගැන්වීම් සම්පත්, ගුණාත්මක යෙදවුම් හා වෙනත් උපකරණ ආදිය ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර සූදානම් කර ගත යුතු ය.

- ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා වෙන් වෙන් වශයෙන් සිසුන්ට හෝ කණ්ඩායම් වලට ලබා දිය නොහැකි අවස්ථාවලදී පත්‍රිකාව ප්‍රදර්ශනයට සැලැස්වීම වැනි සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරන්න.

- ක්‍රියාකාරකමක් අවසානයේ දී, දී ඇති තක්සේරු හා ඇගයීම් නිර්ණායක භාවිතයෙන් හෝ එම නිර්ණායක ඇසුරෙන් විෂය බද්ධ නිර්ණායක ගොඩනගා සුදුසු පරිදි ලකුණක් ප්‍රදානය කිරීමට සහ ඉහළ කළමණාකරණයේ අවශ්‍යතාවලදී ලකුණු පරිවර්තනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

නිපුණතාවය 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.1 : 'බිලාවල් රාගයෙන් ස්වර අභ්‍යාස ගයමු - රාගාංග හඳුනාගනිමු.'

කාලය : කාලච්ඡේද 02 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.1.1.1 හි දැක්වෙන බිලාවල් රාගයේ ස්වර ස්ථාපන ගීතය ලියන ලද පත්‍රිකාව
- කාර්ය පත්‍රිකාවල ඡයා පිටපත්
- සර්පිනාව/ ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර. 1.1.1.1
- පෙර ගයා ඇති ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක්, ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ඇමුණුම 1.1.1.1 හි දැක්වෙන බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- එම ගී වර්ග දෙකෙහි දැක්වෙන ස්වර පිළිබඳව, පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - ගී වර්ග දෙකෙහිම ශුද්ධ ස්වර යෙදෙන බව.
  - ගී වර්ග දෙකෙහිම යෙදෙන ස්වරයන්ගේ වෙනස්කම් දැකිය හැකි බව.
  - ප්‍රදර්ශනයකර ඇති ගීතයෙහි, විශේෂ ස්වර සංගති ඇතුළත් වන බව.
  - එම ස්වර සංගති බිලාවල් රාගයට අයත් වන බව.

(මිනිත්තු 10 යි)

පියවර 1.1.1.2 :
- බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය රසවත් ව ගායනය කර දක්වමින් සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයෙහි ස්වර සංගති යෙදී ඇති අයුරු සිසුන්ගෙන් විමසන්න.
- එම ගීතය පාදයෙන් පාදය ගායනයට යොමු කරවමින්, නාද මාලාව තහවුරු කරවන්න.
- පන්තිය කණ්ඩායම් කරන්න.
- කාර්ය පත්‍රිකාවෙහි පිටපත් බෙදා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ස්වයං අධ්‍යයනයට මග පෙන්වන්න.

(මිනිත්තු 50 යි)

පියවර 1.1.1.3
- සකස් කළ තොරතුරු කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ගායනයට අවස්ථාව දෙන්න.
- සදොස් තැන් නිදොස් කරමින් නිවැරදි ස්වර ස්ථාපනය පිළිබඳ ව අවධාරණය කරන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
    - බිලාවල් රාගය ශුද්ධ ස්වර 7 යෙදෙන සම්පූර්ණ රාගයක් බව.
    - රාගවලට විශේෂිත වූ ස්වර සංගති යෙදෙන බව.
    - ස්වර ස්ථාපන ගීත ගැයීමෙන් රාග පිළිබඳ ව අවබෝධය ලැබීමට රුකුලක් වන බව.
    - රාගවලට අයත් ස්වර අභ්‍යාස වෙන් වෙන් වශයෙන් යෙදෙන බව.
    - ස්වර අභ්‍යාස සහ රාග සංගති (කෙටි ස්වර ඛණ්ඩ) පුහුණුව, මධ්‍යලය ගීත ගැයීමට වැයීමට, තානාලංකාර ගායනයට පන්නරයක් වන බව.
    - ස්වර සංගති නිවැරදිව ගායනය කිරීමට එම ක්‍රියාකාරකම් වැදගත් වන බව

(මිනිත්තු 20යි)

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- බිලාවල් රාගයෙහි ස්වර සංගති නම් කරයි.
- රාගවලට සුවිශේෂිත වූ විවිධ රාග සංගති, ස්වරූපයන් ඇති බව පිළිගනියි.
- රාගා ශ්‍රිත ගීත ගායනය කරයි.
- ස්වර අභ්‍යාස ගායනය /වාදනය කරයි.
- ලබාගත් කුසලතා මත නිර්මාණකරණයට පෙළඹෙයි.

කාර්ය පත්‍රිකා අංක 01

1 පියවර
- ඔබ ගායනා කරන ලද බිලාවල් රාගයේ ස්වර ස්ථාපන ගීතය අවබෝධයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.
- බිලාවල් රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර ලියන්න.
- එම ගීත ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් වන, බිලාවල් රාගයේ රාග සංගති කිහිපයක් (කෙටි ස්වර ඛණ්ඩ) ලියන්න.
- එම ස්වර සංගති කිහිපයක්, ගුරුවරයාගේ සහාය ඇතිව ගායනය/වාදනය කරන්න.
- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් උපයෝගී කරගන්න.


2 පියවර
- ඔබට සපයන ලද, පත්‍රිකාවෙහි සඳහන් බිලාවල් රාග සංගති ඇතුළත්, ''ස්වර අභ්‍යාස'' ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය උපයෝගි කරගනිමින් ගායනය කිරීමට උත්සාහ ගන්න.
- අවශ්‍ය වූ විට , ගුරුවරයාගේ සහාය ලබා ගන්න.
- ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ, ස්වර අභ්‍යාස කිහිප වාරයක් ගායනය කරන්න.
- නාද මාලාව තහවුරු වන තෙක්, උචිත කාලයට අනුව පුහුණු වන්න.
- පන්තිය ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

ඇමුණුම 1.1.1.1

බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් - තාලය - දීප්චන්දි

| | x | | | 2 | | | | 0 | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ස්ථායි | ග | ම | රි | ග | ප | ධ | නි | ස් | නි | ධ | ප | ප | ග | ප |
| | ගි | රේ | ණි | ස | ම | නො | ළි | පු | දු | ට | කි | රි | ප | දී |
| | ග | ම | රි | ග | ම | ප | ප | මග | ම | රි | ස | - | - | - |
| | වී | හ | ග | ස | මි | න | ළ | ප්‍රේ | ළ | ඇ | දේ | S | S | S |
| අන්තරා | ප | ප | ප | ධ | ධ | නි | නි | ස් | ස් | ස් | ස් | රි | ස් | - |
| | හැ | ගෙ | න | අ | රු | ණ | ළු | ප | හ | ස | චි | දු | ගෙ | ත |
| | ධ | ධ | ධ | නි | නි | ස් | රි | නි | ස | ධ | ප | - | - | - |
| | කැ | කු | ළු | කි | ය | ප | න් | පෙ | කි | ඇ | රේ | යි | S | S |
| | ම | ම | ග | ම | ම | රි | රි | ග | ග | ම | ප | ප | ප | - |
| | කැ | වු | මි | උ | ද | ය | න | අ | සි | රි | ස | ම | ගි | න් |
| | ග | ප | ධ | නි | ධ | ප | ප | මග | ම | රි | ස | - | - | - |
| | සු | දු | ව | ලා | S | බ | න් | ප්‍රේS | ළ | කැ | සේ | S | S | S |

ස්වර අභ්‍යාස



ගුරුවරයාට උපදෙස් -

- රාග සංගති හඳුන්වා දෙමින් රාග ස්වර ස්ථාපන ගීතය පුහුණු කරවන්න.
- ඉහත දක්වා ඇති ස්වර අභ්‍යාස ස්වර ස්ථාන තහවුරුවන තෙක් පුහුණු කරවන්න.
- ස්වර උච්චාරණය පිළිබඳ ව දීර්ඝ හුස්ම පවත්වාගෙන ගායනය, සහ කට හඬ පාලනය කරන ආකාරය පිළිබඳව සැළකිලිමත් වෙමින් පුහුණු කරවන්න.
- ස්වර අභ්‍යාස මතකයෙන් ගායනයට පුහුණු කරවන්න.

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ හා කෝමල ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.2 : 'බිලාවල් රාගයෙන් 'සර්ගම්' ගයමු.
කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 1.1.2.1 ට ඇතුළත් 'සර්ගම්' ලියන ලද දෘශ්‍ය ආධාරකය
- ඇමුණුම් 1.1.2.2 ට ඇතුළත් කාර්ය පත්‍රිකාවේ ඡායා පිටපත්
- සර්පිනාව, තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.2.1
- බිලාවල් රාගයේ ස්වර අභ්‍යාසයක් සිසුන් සමග ගායනා කරන්න.
- එහි ස්වර අභ්‍යාසවල ස්වභාවය පිළිබඳව නැවත මතකයට නංවමින්
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - රාගධාරී සංගීතයේ ගායන හා වාදන ප්‍රවේශය සඳහා ස්වර අභ්‍යාස පුහුණුව වැදගත් වන බව
    - රාගාශ්‍රිත වෙනත් ගායනා ශෛලීන් පුහුණුවීම සඳහා අභ්‍යාස කිරීම වැදගත් වන බව

( මිනිත්තු 10 යි)

පියවර 1.1.2.2
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 1.1.2.2 හි කාර්ය පත්‍රිකාව කණ්ඩායම් වෙත ලබා දෙන්න.
- සර්ගම් ලියා දැක්වෙන දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- සර්ගම් පාදයෙන් පාදය සිසුන් ලවා ගායනයට යොමු කරවන්න.
- ස්වර අභ්‍යාස සහ රාගසංගති මැනවින් පුහුණුව ලබා ඇති නිසා සර්ගම් ගායනය සිසුන්ට පහසුවක් වේ.
- සමස්ත සර්ගම් ගීතයෙහි නාදමාලාව තහවුරු වූ පසු සර්ගම් ආශ්‍රිතව සකස් කර ඇති ක්‍රියාකාරකමෙහි යොමු කරන්න.
- වාදනයෙන් සහාය වන්න.
- කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමෙහි යොදවන්න.

( විනාඩි 50 යි)

පියවර 1.1.2.3
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න.
- ශ්‍රැති වාදනයෙන් තාල වාදනයෙන් කණ්ඩායම් වලට උදව් කරන්න.
- සිසු දුබලතා , ප්‍රබලතා හඳුනාගනිමින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධාරණය කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
    - සර්ගම් පුහුණුවීමෙන් රාග ඥාණය සහ ස්වර ඥාණය වර්ධනය වන බව
    - රාගවල අනන්‍යතාවය හඳුනාගත හැකි බව
    - මධ්‍යලය ගීත සහ තානාලංකාර පිළිබඳව අවබෝධය ලබාගත හැකි බව
    - 'සර්ගම්' රසවත්ව ගායනය කළ හැකි

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- බිලාවල් රාග සංගති නම් කරයි.
- සර්ගම් පුහුණුවෙහි වැදගත්කම පිළිගනියි.
- සර්ගම් නිවැරදි ශ්‍රැතියට අනුව ගායනය කරයි.
- සර්ගම් සමග නිර්මාණාත්මක ස්වර ඛණ්ඩ ගායනය කරයි.
- වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි.

ඇමුණුම 1.1.2.1

බිලාවල් රාගය - 'සර්ගම්' තාලය - ත්‍රිතාල්

| | | | | |
|---|---|---|---|---|
| | 3 | x | 2 | 0 |
| ස්ථායි | ග ප ධ නි | සං - ධ ප | ම ග ම රි | ස රි' ස - |
| | ග - ම රි | ග ප ධ නි | සං නි ධ ප | ම ග රි ස |
| අන්තරා | ප ප ධ නි | සං - සං සං | ධ නි සං රිං | සං නි ධ ප |
| | ගං රිං සං නි | ධ ප නි ධ | සං නි ධ ප | ම ග රි ස |
| | 3 | x | 2 | 0 |

ඇමුණුම 1.1.2.2

කාර්ය පත්‍රිකාව


- සර්ගම් තුළ අන්තර්ගත  බිලාවල් රාග සංගති (කෙටි ස්වර ඛණ්ඩ) ලියන්න.
- සර්ගම් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.
- කණ්ඩායම එක්ව සර්ගම් ගායනය පුහුණුවන්න.
  (ස්වර අභ්‍යාස සහ රාගසංගති පිළිබඳව මීට පෙර පුහුණුවක් ලබා ඇති බැවින්, සර්ගම් ගායනය ඔබට පහසුවනවා ඇති.)
- සර්ගම් හා බැඳි විවිධ ස්වර අංලකාර කොටස් ගායනය පුහුණු වෙන්න.
- කණ්ඩායම කොටස් දෙකකට බෙදී ගුරුවරයාගේ සහාය ලබාගෙන පුහුණුවීම් කරන්න.
  (පහත ii, iii, iv, v පියවර අනුව)
- ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

ගුරුවරයාට උපදෙස්

- සර්ගම් නාදමාලාව තහවුරු වුවාට පසුව, පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරවිය හැකිය.
- බිලාවල් රාගයේ ස්වර ස්ථාපනය තහවුරු කිරීමටත් ස්වර ගායනයට ඇති කැමැත්ත වර්ධනය කරගැනීමටත් මෙම ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය.
- සර්ගම්යේ සඳහන් ස්වර විවිධාකාරයෙන් යොදාගෙන රසවත් ලෙස වර්ණවත් කළ හැකි ය.
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.

෴1 පියවර

එක් කණ්ඩායමක් / ග ප ධ නි/ස් - ධ ප / යනුවෙන් ගායනය ආරම්භ කරන අතර, අනෙක් කණ්ඩායම 2 වැනි අනුතාලයෙන් /ග ප ධ නි / ස් - ධ ප/ යනුවෙන් ගායනය ආරම්භ කරමින් සමස්ත සර්ගම් ගීතය, 'වක්‍ර' ක්‍රමයට (Rounders) ගායනයට යොමු කරවන්න. තබ්ලා වාදනයට අනුව ගායනය කරවීමෙන් තාලය පිළිබඳ ව අවබෝධය ලබා දිය හැකි ය.



නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ හා කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි

ක්‍රියාකාරකම 1.1.3 : බිලාවල් රාගයේ 'මධ්‍යලය ගී ගයමු'

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම් අංක 1.1.3.1 ඇතුළත් මධ්‍යලය ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- සර්පිනාව, තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර. 1.1.3.1 :

- ස්වර සහ පදමාලාව ඇතුළත් ගීත ස්වර ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කරන්න.
- එහි ස්වභාවය පිළිබඳව පන්තිය විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

> - රාගයකට අදාළ ව ස්වර සහ පදමාලාව ඇතුළත්ව තාලානුකූලව රචනා කර ඇති ගීත ශෛලීය ශාස්ත්‍රීය සංගීතයේ 'ඛ්‍යාල්' යනුවෙන් හැඳින්වෙන බව.
> - මෙම ගීය චොටා ඛ්‍යාල් වර්ගයට අයත් බව.
> - එම ගීත මධ්‍යලය ගීත නමින් ද හඳුන්වන බව.
> - නිර්දේශිත සෑම රාගයක්ම මධ්‍යලය ගීත ඇතුළත් වන බව
> - මධ්‍යලය ගීත වලට අනුව සුවිශේෂ අංග ඇතුළත් කරමින් රසවත් ව ගායනා කළ හැකි ගායන ශෛලියක් බව.
> - ස්ථායි අන්තරා, යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වන බව

(මිනිත්තු 10යි)

පියවර 1.1.3.2 :

- පන්තිය කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ගීත ස්වර ප්‍රස්තාරය සහ උපදෙස් පත්‍රිකාවේ පිටපත් කණ්ඩායම්වලට ලබාදෙන්න.
- මධ්‍යලය ගීතය පුහුණු කිරීම සඳහා කණ්ඩායම්වලට සහාය ලබා දෙන්න. (පාදයෙන් පාදය, කොටසින් කොටස)
- ශ්‍රැති වාදන භාණ්ඩයක් යොදාගන්න.
- සමස්ත කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50යි)

පියවර 1.1.3.4 :

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න.
- ගායනය ඉදිරිපත් කිරීමේ දී නිවැරදි ශ්‍රැතිය පිළිබඳව අවධාරණය කරවන්න.
- කණ්ඩායම් මාරුවෙන් මාරුවට ගී පද සහ ස්වර ප්‍රස්තාරය ගායනා කරවන්න.
- නිවැරදි ස්වර ස්ථාන පිළිබඳව උච්ච, මන්ද්‍ර, මධ්‍ය වශයෙන් ගැයුමෙහි කුසලතා තහවුරු වන වා දැයි සොයා බලන්න

- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - මධ්‍යලය ගීතවල ස්වර ප්‍රබන්ධයෙහි රාගයට අයත් ස්වර සංගති ඇතුළත් වන බව
    - ගීතය ස්ථායි අන්තරා යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වන බව
    - නිවැරදි ශ්‍රැතියෙහි පිහිටා ගායනය කළ යුතු බව
    - රාගය පිළිබඳ ප්‍රායෝගික හුරුව ලැබීමට, මධ්‍යලය ගීතය හොඳින් පුහුණුවිය යුතු බව
    - රාගාශ්‍රිත නිර්මාණ කරණය සඳහා පන්නරයක් වන බව.

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- මධ්‍යලය ගීතයෙහි ඇතුළත් රාගාංග සොයයි.
- නිවැරදි ශ්‍රැතියට සහ නිවැරදි ස්වර ස්ථාන අනුව ගැයීමෙහි වැදගත්කම පිළිගනියි.
- මධ්‍යලය ගීතය ගායනා කරයි.
- ආරෝහණ සහ අවරෝහණ ස්වර ගායනා කරයි.
- රාගාශ්‍රිත නිර්මාණකරණයේ යෙදෙයි.


ගුරුවරයාට උපදෙස්
- සිසුන් ක්‍රියාකාරම්වල නිරත වන අවස්ථාවේ ස්වර පුවරු භාණ්ඩය හෝ ශ්‍රැතිය භාවිත කරමින් මධ්‍යලය ගීතය පුහුණුවීම් කරන්න.
- ගීතයේ පාදයෙන් පාදය තහවුරු වනතෙක් ගායනය හුරු කරවන්න.
- තාලය පිළිබඳ ව සැළකිලිමත් වෙමින්, ස්වර ස්ථාන පිළිබඳව අවබෝධය ඇතිකරවමින් ගායනය හුරු කරවන්න.
- ගීත ප්‍රස්තාරය අභ්‍යාසපොත්වල සටහන් කිරීමට සලස්වා ලකුණු කරන්න.
- මෙහි සඳහන් මධ්‍යලය ගීත අතුරෙන් කැමති ගීතයක් තෝරා උපදෙස් පත්‍රය සමග පිටපත් කර කණ්ඩායම්වලට ලැබෙන්න සලස්වන්න.


ඇමුණුම 1.1.3.1


උපදෙස් පත්‍රිකාව

1. ඔබට සපයා ඇති මධ්‍යලය ගීත ස්වර ප්‍රස්තාරය අවධානයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.
2. එම ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් වන බිලාවල් රාගයේ රාගාංග කිහිපයක් සොයා ගන්න.
3. ගීත ප්‍රස්තාරයෙහි සඳහන් වන තාලයෙහි නම ලියන්න.
4. ගීතයෙහි කොටස් දෙක නම් කරන්න.
5. ගුරුවරයාගේ සහාය ඇතිව මධ්‍යලය ගීතය පාදයෙන් පාදය නාදමාලාවට තහවුරුවන තෙක් පුහුණු වන්න.
6. ශ්‍රැතිය ගැන සැළකිලිමත් වෙමින්, නිවැරදි ස්වර ස්ථානවලට අනුව ගැයීමට හැකිවනතෙක් ගායනය හුරුවන්න.
7. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයන් වාදනය කරමින්, ස්වරස්ථාන තහවුරු වනතෙක් ගායනය පුහුණුවන්න.
8. තාලය ගැන සැළකිලිමත් වන්න.
9. මතකයෙන් ගැයීමට හුරුවන්න.
10. ඔබේ අභ්‍යාස පොතෙහි පිරිසිදුව, පැහැදිලිව හා නිවැරදිව ගීත ප්‍රස්තාරය සටහන් කර ගන්න.
11. සමස්ත කණ්ඩායම පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
12. බිලාවල් රාගයේ ආරෝහණ සහ අවරෝහණය ගායනයට පුහුණු වන්න.

ඇමුණුම 1.1.3.1


බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රිතාල්


බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රිතාල්




බිලාවල් රාගය - මධ්‍යලය ගීතය

නිපුණතාවය 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.4 : 'කාෆි රාගයෙන් ස්වර අභ්‍යාස ගයමු'
කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 1.1.4.1 දක්වෙන කාෆි රාගාංග ඇතුළත් ගීතය
- කාර්ය පත්‍රිකාව 1.1.4.2 ඡායා පිටපත්
- සර්පිනාව/ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක්
- තාල වාද්‍ය භාණ්ඩයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.4.1 :
- 7 ශ්‍රේණියේ දී ගායනය කළ කෝමළ ග, නි ස්වර ස්ථාපන ගීයක් සිසුන් සමඟ ගායනයේ යෙදෙන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට කෝමළ ග, නි, ස්වර අභ්‍යාසයක් හෝ ස්වර ' ස්ථාපන ගීතය' ගායනයට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 1.1.4.1 හි දක්වෙන කාෆි රාගයෙන් නිර්මාණය කර ඇති ස්වර ස්ථාපන ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

> - කෝමළ ග, නි ස්වර ස්ථාපන ගීතයෙහි ස්වර රටාවට වඩා, දෘශ්‍ය ආධාරකයේ සඳහන් වන ස්වර ස්ථාපන ගීතයෙහි ස්වර රටාව වෙනස් වන බව.
> - කෝමළ ග, නි සමග ස්වර 7 ම යෙදෙන රාගය කාෆි නමින් හැඳින්වෙන බව
> - සුවිශේෂිත ස්වර සංගති (කෙටි ස්වර ඛණ්ඩ) වලින් යුක්තවන නිසා, එම ගීතයෙහි කාෆි රාගාංග ඇතුළත් වන බව

(මිනිත්තු 10යි)

පියවර 1.1.4.2 :
- ඇමුණුම 1.1.4.1 හි සඳහන් කාෆි රාග සංගති ඇතුළත් ගීතය ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය රසවත් ව ගායනය කරමින්, සිසුන්ට ශ්‍රවණයට සලසන්න.
- එම ගීතයේ ඇතුළත් කාෆී රාගයේ ස්වර සංගති පිළිබඳව පැහැදිලි කරන්න.

උදා - * සස රිරි ග ග මම ප,
* රි ග රි ම ග රි ස
* රි නි ධ නි, ප ධ ම ප,
* ම ප ධ නි ස,
* ප ධ ම ප ග රි
* ප ධ ම ග රි,
* ධ නි ස රි ග රි ස ,

- ගීතයේ පාදයෙන් පාදය ගායනයට යොමු කරවන්න.
- සමස්ත ගීතයම, නාද මාලාව තහවුරුවන සේ පුහුණු කරවන්න.
- පන්තිය කණ්ඩායම් කරන්න.
- කාර්ය පත්‍රිකාව ඇමුණුම 1.1.4.2 පිටපත් බෙදා දෙන්න.
- ක්‍රියාකාරකම පිළිබඳව දැනුවත් කරමින් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සිසුන් සකස් කරගත් ස්වර අභ්‍යාස ගායනය කරවන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩයක් භාවිත කරමින් ස්වරස්ථාන තහවුරු වන සේ, කොටසින් කොටස අභ්‍යාස කිරීමට සහාය වන්න.
- සිසු ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50යි)

පියවර 1.1.4.3 :

- රාගාශ්‍රිත ස්වර ස්ථාන ගීතය කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ස්වර අභ්‍යාස, කේවලව ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ස්වර ස්ථානවල නිවැරදිතාවය පිළිබඳව ඔබගේ මග පෙන්වීම කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - රාග ස්වරූපය විදහා දක්වෙන ගීත පුහුණුව මගින් රාග පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන බව.
  - ස්වර අභ්‍යාස පුහුණුවීම, රාගධාරී සංගීතයේ දී ආධුනිකයෙකුට වැදගත් වන බව.
  - රාග සංගති පිළිබඳව අවබෝධය, ආලාප, ගායන වාදනය, තානාලංකාර පුහුණුවීමට ඉතා වැදගත් වන බව.

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- කාෆි රාගය ඇසුරින් ස්වර අභ්‍යාස ගොඩ නගයි.
- රාගධාරී සංගීතයේ මූලික පුහුණුව වශයෙන් ස්වර ස්ථාපන ගීත සහ ස්වර අභ්‍යාසයන්හි වැදගත් කම පිළිගනියි.
- ස්වර අභ්‍යාස ගායනා කරයි.
- ස්වර ස්ථාපන ගීතයෙහි දිස්වන කාෆි රාගාංග සොයයි.
- වෙනත් රාග ස්වරූපයන් සමග සංසන්දනය කිරීමට පෙළඹෙ යි.

ඇමුණුම 1.4.1.1

කාෆිරාගය ආශ්‍රිත ස්වර ස්ථාපන ගීතය



ඇමුණුම 1.1.4.2

කාර්ය පත්‍රිකාව

- කාෆි රාගයේ ස්වර සංගති ඇතුළත් වන 'දස අත විසිරෙන රුවන් වළාවන්' නමැති ගීතයෙහි නාදමාලාව තහවුරු වී ඇති බැවින්, පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත වීම පහසුවක් වනවා ඇති.
- හිස් තැනට සුදුසු ස්වර යොදා පහත සඳහන් වන ස්වර අභ්‍යාස සම්පූර්ණ කරන්න.

1. සරිස, -
   ස රි ගු රි ස -
   \- - - - - - -
   \- - - - - - - -
   \- - - - - - - - -
   \- - - - - - - - - -
   \- - - - - - - - - - -

2. රි ගු රි ම ගු රි ස -
   රි ගු රි ම ප ම ගු රි ම ගු රි ස
   රි ගු ම ප ධ ප ම ගු රි ම ගු රි ස -

මෙහි ඉතිරි ස්වර ඛණ්ඩ දෙක සම්පූර්ණ කරන්න. එම ස්වර ඛණ්ඩ දෙක
රි ගු රි ම ගු රි ස - යනුවෙන් අවසන් කරන සේ ලියන්න.

- ගුරුවරයාගේ සහාය ලබාගෙන මෙම ස්වර අභ්‍යාස පුහුණුවන්න.
- ස්වර ස්ථාපන ගීතය සහ එක් ස්වර අභ්‍යාසයක් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.5 : 'කාෆි රාගයේ සර්ගම් ගයමු'
කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- කාර්ය පත්‍රිකාවල ඡායා පිටපත් 1.1.5.1
- ඇමුණුම් 1.1.5.2 හි ඇතුළත් සර්ගම් ලියන ලද දෘශ්‍ය ආධාරකය
- සර්පිනාව තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.5.1 :
- කාෆි රාගයෙන්, ස්වර අභ්‍යාසයක් ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට, අවස්ථාව දෙන්න.
- කාෆි රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර සිසුන් සමග ගායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • ඕනෑම රාගයක මූලික ස්වරූපය අවබෝධ කර ගැනීම සඳහා ආරෝහණ අවරෝහණය උපයෝගී වන බව.<br>• එම ස්වර විහිදී යන ආකාරය අනුව ස්වර අභ්‍යාස ගොඩ නැගී ඇති බව.<br>• සර්ගම් , මධ්‍යලය ගීත සහ තානාලංකාර ගැයීමට ස්වර අභ්‍යාස පුහුණුව වැදගත් වන බව.<br>(මිනිත්තු 10 යි) |

පියවර 1.1.5.2 :
- සර්ගම් ලියන ලද පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එහි ස්වර රටාව පිළිබඳව ගවේෂණයට යොමු කරන්න.
- තාල සංඥා පිහිටන ආකාරය පිළිබඳව අවධානය යොමු කරවන්න.
- 'සර්ගම්' එකක් පාදයෙන් පාදය වාදනය කරමින් ගායනය කරමින්, සිසුන්ගේ ශ්‍රවණයට යොමු කරවන්න.
- නිවැරදි ශ්‍රැතියට අනුව ගායනය කළ යුතු බව අවධාරණය කරන්න.
- පාදයෙන් පාදය, කොටසින් කොටස නාද මාලාව තහවුරු වනතෙක් සිසුන් ලවා ගායනයට යොමු කරවන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කාර්ය පත්‍රිකාවේ පිටපත් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 1.1.5.3 :
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරිම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- ගායනය සඳහා වාදනයෙන් සහාය අවශ්‍ය වූ විට සපයන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

- කාෆි රාගයෙහි ස්වර සංගති, සර්ගම් තුළ අන්තර්ගත වන බව.
- සර්ගමය යන්න නිර්වචනය කළ හැකි බව.
- කාෆි රාගය පිළිබඳව අවබෝධයක් ලැබීමට සර්ගම් පුහුණු වීම පන්නරයක් වන බව.
- නිවැරදි ස්වර ස්ථාපනයට සර්ගම් වැදගත් වන බව.
- පද මාලාවෙන් තොර රාගඡායාව පෙන්නුම් කරන ගායන ශෛලියක් බව.

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- 'සර්ගම්' පිළිබඳ ව නිර්වචනය කරයි.
- සර්ගම් පුහුණුවීමේ ඇති වැදගත්කම පිළිගනියි.
- සර්ගම් නිවැරදිව ගායනය කරයි.
- ස්වර සංගති වෙන්කොට දක්වයි.
- රාගධාරී සංගීතය ප්‍රගුණ කිරිමෙහිලා සර්ගම් පුහුණුව, වැදගත් බව සාකච්ඡා කරයි.

ඇමුණුම 1.1.5.1

කාර්ය පත්‍රිකාව - 01

- ඔබ ඉදිරියේ ප්‍රදර්ශනය කර ඇති 'සර්ගම්' ප්‍රස්තාරය දෙස, අවධානයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.
- එම ප්‍රස්තාරයෙහි අන්තර්ගත කාෆි රාගයේ රාග සංගති කිහිපයක් නම් කරන්න.
- ගුරුවරයාගේ සහාය ඇතිව, නිවැරදිව ශ්‍රැතියට අනුව සර්ගම් පාදයෙන්, පාදය ගායනා කරන්න.
- ඒ අනුව, ස්ථායි සහ අන්තරා කොටස් දෙකෙහි නාද මාලාව තහවුරු වන තෙක් ගායනය පුහුණු වන්න.
- සර්ගම් ගීතය පුහුණුවූවාට පසුව, සර්ගම් ගීතය සමග ස්වර අලංකාර ලෙස යොදා ගනිමින් ගායනා කරන්න.
- කණ්ඩායම මාරුවෙන් මාරුවට යොදා ගනිමින් රසවත් ලෙස ගායනා කරන්න.
- අභ්‍යාස පොතෙහි පැහැදිලිව සටහන් කරන්න.
- කණ්ඩායම එක්වී පන්තියේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 1.1.5.2

කාෆි රාගය - සර්ගම්

තාලය දාදාරා

| | x | | | 0 | | | x | | | 0 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථායි | නි | ධ | ම | ප | ගු | රි | ස | රි | ගු | ම | ප | - |
| | ප | ධ | ම | ප | ස̇ | නි | ධ | ප | ම | ගු | රි | ස |
| අන්තරා | ප | ධ | ම | ප | ධ | නි | ස̇ | රි̇ | ගු̇ | රි̇ | ස̇ | - |
| | ධ | නි | ස̇ | රි̇ | ගු̇ | රි̇ | ස̇ | රි̇ | නි | ධ | ප | - |
| | ප | ධ | ම | ප | ස̇ | නි | ධ | ප | ම | ප | ගු | රි |
| | ස | ස | රි | රි | ගු | ගු | ම | ධ | ප | ධ | ම | ප |

ගුරුවරයාට උපදෙස් -

- සර්ගම් ගීතයේ නාද මාලාව තහවුරු වූවාට පසුව, පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරවිය හැකි ය.

| x | | | 0 | | | x | | | 0 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නි | ධ | ම | ප | ග | රි | නිධ | මප | ගුරි | සරි | ගුම | ප- |
| ප | ධ | ම | ප | ස̇ | නි | පධ | මප | ස̇නි | ධප | මගු | රිස |

- අන්තරා කොටසද ඉහත සඳහන් ආකාරයට අලංකාර කර ගත හැකි ය.
- කණ්ඩායම් කොට, මාරුවෙන් මාරුවට, චක්‍ර ක්‍රමයට ද වර්ණවත් කරමින් ගායනයට යොමු කළ හැකි ය.
- එක් කණ්ඩායමක් සම ලයෙන්, ස්ථායි කොටස ගායනා කිරීමට යොමු කරමින් අනෙක් කණ්ඩායම ලවා ලය දෙගුණ කරමින් ගායනයට යොමු කළ හැකි ය.

උදා -

| x | | | 0 | | | x | | | 0 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නි | ධ | ම | ප | ග | රි | ස | රි | ග | ම | ප | - |
| නිධ | මප | ගුරි | සරි | ගුම | ප- | පධ | මප | ස̇නි | ධප | මගු | රිස |

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.6 : 'කාෆි රාගයෙන් මධ්‍යලය ගීතයක් ගයමු'
කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.1.6.1 හි කාර්ය පත්‍රිකාවේ ඡායා පිටපත්
- ඇමුණුම 1.1.6.2 මධ්‍යලය ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- සර්පිනාව, තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.6.1 :
- 'සරුංගලේ වරල් සැලේ' නමැති ' විශාරද නන්දාමාලනී ' ගයන ගීතය ශ්‍රව්‍ය පටයකින් හෝ ගුරුවරයා ගයමින් හෝ සිසුන්ට ශ්‍රවණයට යොමු කරවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.
  - එම ගීතයෙහි, කෝමළ ග, නි ස්වර නාද ඇසෙන බව.
  - කාෆි රාගයෙහි ආරෝහණ සහ අවරෝහණ ස්වර ගැයීමට පහසු බව
  - කාෆි රාගයෙහි රාගාංග ඇතුළත් වන සේ නිර්මාණය කර ඇති ගීත ශෛලියක් තිබෙන බව
  - ඛ්‍යාල් ගායනා ශෛලියට අයත් වන මධ්‍යලය ගීත ද ඉහත සඳහන් ගීතය සේ රසවත් ව ගැයිය හැකි බව

(මිනිත්තු 10යි)

පියවර 1.1.6.2 :
- මධ්‍යලය ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදන්න.
- මධ්‍යලයට ගීතය රසවත්ව ගායනා කර දක්වන්න.
- සිසුන් ගේ ශ්‍රවණයට සලස්වන්න.
- කාෆි රාගයේ රාග සංගති පිළිබඳව සිසුන් විමසන්න.
- කාෆි රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර සිසුන් සමඟ ගායනා කරන්න.
- තාලය පිළිබඳව සැළකිලිමත් වෙමින් සමස්ත ගීතය, පාදයෙන් පාදය කොටසින් කොටස ගායනයට යොමු කරවමින් නාද මාලාව තහවුරු කරවන්න.

(මිනිත්තු 50යි)

පියවර 1.1.6.3 :
- ගීතයේ පාද කොටස් අහඹුලෙස වාදනය කර දක්වමින් හඳුනාගැනීමට සලස්වන්න.
- ගීතයේ ස්වර ප්‍රස්තාරය සහ පද ප්‍රස්තාරය වෙන් වෙන්ව, කණ්ඩායම් මාරුකරමින් ගායනා කිරීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කරන විට සදොස් තැන් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ස්වර අභ්‍යාස සහ සර්ගම් පුහුණුව තුළින් කාෆි රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර ගායනයට පහසු වූ බව.
- මධ්‍යලය ගීතයක ස්වර ප්‍රස්තාරය මෙන්ම පද ප්‍රස්තාරයද වැදගත් වන බව
- රාග සංගති හඳුනාගනිමින් රාගාවබෝධය ලැබීමට මධ්‍යලය ගීත රුකුලක් වන බව
- මධ්‍යලය ගීත ගායනය, වාදනය ප්‍රසංගාත්මකව ඉදිරිපත් කළ හැකි බව.

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ශ්‍රැතියට අනුව මධ්‍යලය ගීතය නිවැරදිව ගායනා කරයි.
- රාගඥාණය සහ ස්වරඥාණය, රාග රස වින්දනය සඳහා අත්‍යවශ්‍ය මත බව පිළිගනියි.
- ආරෝහණ සහ අවරෝහණය ගායනා කරයි.
- කාෆි රාග සංගති නම් කරමින්, අනෙකුත් රාගයන්ගෙන් වෙනස්වන අයුරු සොයයි.
- ගී පද වලට කාෆි රාගාශ්‍රිතව තනු නිර්මාණ කිරීමට පෙළෙඹෙයි.

සරුංගලේ වරල් සැලේ
නිසංසලේ ගුවන් තලේ
අපෙන් මිදී වෙන රටකට
යන්න හදන්නේ
උපන් බිමට වැඩිය තැනක්
කොහෙද තියෙන්නේ ......

සරුංගලේ බට පතුරින්
නුඹ හැදුවේ අපේ ළමයි
සරුංගලේ ලාටු උලා
රැළි කෙරුවේ අපේ ළමයි
සරුංගලේ කොළ අලවා
හැඩ කෙරුවේ අපේ ළමයි
සරුංගලේ නුඹ අහසේ
අපේ ළමයි තාම බිමයි

සරුංගලේ නුඹ වෙනුවෙන්
ගුටිකෑවේ අපේ ළමයි
සරුංගලේ නූල් යොදා
උඩ ඇරියේ අපේ ළමයි

සරුංගලේ උඩ ගියදා
මතක නැතේ අපේ ළමයි
සරුංගලේ නුඹ වාගෙයි
රට හැරයන අපේ ළමයි

ගායනය - විශාරද නන්දා මාලනී
රචනය - සුනිල් ආරියරත්න


ඇමුණුම 1.6.1.1

කාර්ය පත්‍රිකාව 01

- ඔබ ඉදිරියේ ප්‍රදර්ශනය කර ඇති මධ්‍යලය ගීත ප්‍රස්තාරය අවධානයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.
- ගුරුවරයාගේ ගායනයට සවන් දෙන්න.
- එම ප්‍රස්තාරයෙහි, අන්තර් ගත කාෆි රාගාංග (කෙටි ස්වර ඛණ්ඩ) කිහිපයක් සොයන්න.
- ගුරුවරයාගේ සහාය ඇතිව කාෆි රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ගායනා කරන්න.
- මධ්‍යලය ගීතයෙහි පාදයෙන් පාදය ගුරුවරයාගේ සහාය ලබමින් නිවැරදිව ගායනා කිරීමට උත්සාහ ගන්න.
- තාලානුකූලව ගීතයේ ස්ථායි, අන්තරා කොටස් ගායනා කරන්න.
- පන්තිය ඉදිරියේ, ගායනා කර දක්වීමට සූදානම් වන්න.
- ගුරුවරයා විසින් වාදනය කර දක්වන අහඹු ලෙස තෝරාගත් ගී පද කොටස් හඳුනාගන්න.
- මධ්‍යලය ගීතය අභ්‍යාස පොතෙහි පැහැදිලිව සටහන් කරගන්න.

ඇමුණුම 1.1.6.2

රාගය - කාෆි
තාලය - ත්‍රිතාල්
මධ්‍යලය ගීතය




ආනන්ද ජයසිංහ - ඛ්‍යාල ගීත - පිටු අංක 25

සඳ රැස් ගලායේ බොහෝ සේ - නැමැති ගීතයෙහි ස්වර ප්‍රස්තාරය ට අදාළ හින්දි ගීතය පහත සඳහන් වේ.

චංඩෝ, චංඩෝ වෛලා මෝරේ
බෛයඳු කත මොරෙ නරමක ලායී
කෛසෙ තුම කෛසෙ තුම
නිඩරලාල මග රොක්ත පරයි

කෛසෙ තුම මහාරාජ
අවතන තොකොලාජ
ජනොනංක සකොරාජ
ඟකඩ මෛගාවෙ වකි පිරතඳු හයි

සඳවතී හිනැහෙනවා - සිනාසී මව් බිම සිඹ සිඹ
නළවන වේලේ - සඳවති හිනැහෙනවා
ඇගෙ තරු දරුවෝ - අත් ඔසවාලා
මව්භූමිය වඳිති - සිනාසී තුටු කඳු ලැලි සලමින් ගී ගයති.




ඩබ්. ඩී. මකුලොලුව - අභිනව මූලික ගීත - පිටු අංක 51

නිපුණතාවය 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.7 : 'භූපාලි රාගසංගති හඳුනා ගනිමින් ස්වර අභ්‍යාස ගයමු'

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1.1.7.1 දැක්වෙන භූපාලි රාගයේ ස්වර ස්ථාපන ගීතය ලියන ලද පත්‍රිකා
- ඇමුණුම 1.1.7.2 කාර්ය පත්‍රිකාවේ ඡායා පිටපත්
- ස්වරූ පුවරූ වාද්‍ය භාණ්ඩයක්.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.7.1 :

- පෙර ගායනා කරන ලද රාගස්වර ස්ථාපන ගීත හෝ මධ්‍යලය ගීතයක් සිසුන්ට ගායනයට සලස්වන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට අවස්ථාව දෙන්න.
- භූපාලි රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර කළු ලෑල්ලෙහි ලියා දක්වන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.
  - ශුද්ධ ස්වර පහක් පමණක් යෙදෙන බව.
  - ඉහත ගැයූ බිලාවල්, කාෆි රාගවල මධ්‍යලය ගීතවල ස්වර 7 ම යෙදෙන බව.
  - ම සහ නි ස්වර නොයෙදෙන බව.
  - භූපාලි රාගය පිළිබඳ අවබෝධය ලැබීමට නම් එම රාගයට සුවිශේෂී වූ ස්වර සංගති සහ ස්වර අභ්‍යාස ප්‍රගුණ කළ යුතු බව.

(මිනිත්තු 20 යි)

පියවර 1.1.7.2 :

- ඇමුණුම් 1.1.7.1 හි දැක්වෙන රාග ස්වර ස්ථාපන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩය භාවිත කරමින් එම ගීතය රසවත් ව ගායනා කර දක්වන්න.
- පද ප්‍රස්තාරය සහ ස්වර ප්‍රස්තාරය වෙන වෙනම ගායනයට පුහුණු කරවන්න.
- පාදයෙන් පාදය ගායනයට යොමු කරවමින් නාදමාලාව තහවුරු කරවන්න.
- භූපාලි රාගයේ ස්වර සංගති පිළිබඳ අවධාරණය කරමින්, ගීතය පුහුණු කරවන්න.
- ස්වර අභ්‍යාස ගොඩ නැඟීම සඳහා උදව් කරන්න.
- පන්තිය කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 1.1.7.2 කාර්ය පත්‍රිකා බෙදා දෙන්න. කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 40 යි)

පියවර 1.1.7.3 :
- ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න.
- සදොස් තැනි නිදොස් කරන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් අගයන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.


> - භූපාලි රාගයෙහි ස්වරූපය, ස්වර ස්ථාපන ගීතයෙන් විද්‍යාමාන වන බව.
> - රාග ස්වරූපය අවබෝධ කරගැනීමට, ස්වර ස්ථාපන ගීත සහ ස්වර අභ්‍යාස පුහුණුවීම වැදගත් වන බව.
> - මධ්‍යලය ගීත ගායනය, වාදනය ප්‍රගුණ කිරීමෙන් ප්‍රසාංගාත්මකව ඉදිරිපත් කළ හැකි බව.

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- භූපාලි රාගයෙන් ස්වර අභ්‍යාස ගොඩනඟයි.
- ස්වර සංගති සහ ස්වර අභ්‍යාස මගින් රාග ස්වරූපය හඳුනා ගැනීමට හැකි වන බව පිළිගනියි.
- රාගස්වර ස්ථාපන ගීත සහ ස්වර අභ්‍යාස ගායනා කරයි.
- රාග අතර වෙනස්කම් පිළිබඳ කරුණු දක්වයි.
- භූපාලි රාගශ්‍රිත සරල ගීත සෙවීමට පෙළඹෙයි.

ඇමුණුම 1.1.7.1

භූපාලි රාගශ්‍රිත ස්වර ස්ථාපන - ගීතය



- ගතෙහි රුහිරු පෙම මුසුකොට - කිරට පෙරූ අම්මා

  උතුම් පුතුන් තැනුමට නැත - පිරූ පැතුම් නිම්මා

  සෙනේ දියෙන් අප සනහන - පිනැති ගුණැති සම්මා

  අඳුරු ලෙනෙහි පහණ ඔබයි - නිබඳ වදිම් අම්මා

ඇමුණුම 1.1.7.2

කාර්ය පත්‍රිකාව - 01

- ඔබට සපයා ඇති රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය කණ්ඩායම එක් වී නැවතත් ගායනය කරන්න.
- ස්වර සහ පද ප්‍රස්තාරය වෙන් වෙන් වශයෙන් ගායනය පුහුණුවන්න.
- භූපාලි රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර ලියන්න.
- එම ස්වර ගායනය කරන්න.
- රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයෙහි ස්වර ප්‍රස්තාරය නිරීක්ෂණය කරමින් , භූපාලි රාගයේ ස්වර විදහා දක්වෙන ස්වර අභ්‍යාසයක් ගොඩ නගන්න.
- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය භාවිත කරමින් ස්වර අභ්‍යාස පුහුණුවන්න. අවශ්‍ය වූ විටෙක ගුරුවරයාගේ සහාය ලබා ගන්න.
- භූපාලි රාගයේ ස්වර සංගති දෙකක් ලියන්න.
- ගීතය සහ ස්වර අභ්‍යාසය හොඳින් තහවුරු වූ පසුව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- පහත සඳහන් ස්වර අභ්‍යාස ආරෝහණ, අවරෝහණ වශයෙන් සම්පූර්ණ කරන්න.

* ස රි ස -

ස රි x x ස -

ස රි x x x රි ස -

ස රි x x x x ග රි ස -

ස රි x x x x x x ග රි ස -

* ස̇ ධ ස̇ -

ස̇ ධ x x ස̇ -

ස̇ x x x x x ස̇ -

ස̇ x x x x x x x ස̇ -

ස̇ x x x x x x x x x ස̇ -

2 පියවර

ඉහත සඳහන් ස්වර අභ්‍යාස තුළ අන්තර්ගත භූපාලි රාගාංග ඇතුළත් ස්වර කොටස් සොයා ලියන්න.

- කණ්ඩායම එක්වී ස්වර සංගති සහ අභ්‍යාස පුහුණු වන්න.
- පන්තියට ඔබේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්න.

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.8 : 'සර්ගම් ගයමු භූපාලි රාගයෙන්'
කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.1.8.1 අයත් දෘශ්‍ය ආධාරකය
- ඇමුණුම 1.1.8.2 උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- ස්වර පුවරු භාණ්ඩ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.8.1 :
- මීට ප්‍රථම කරන ලද ක්‍රියාකාරකමෙහි සඳහන් වූ භූපාලි රාගයේ ස්වර අභ්‍යාස, ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- රාගාවබෝධය ලැබීමට, ස්වර අභ්‍යාස ගායනා පුහුණුව වැදගත් වන ආකාරය පිළිබඳ ව පන්තිය විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

  - රාගාවබෝධය, පමණක් නොව, කටහඬ පුහුණුවට ද, ස්වර අභ්‍යාස ගායනය, පුහුණුවීම වැදගත් වන බව.
  - රාග සංගති ඇතුළත් කරමින් නියමිත තාලයට අනුව ප්‍රබන්ධ කර ඇති ගීත විශේෂයක් තිබෙන බව

(මිනිත්තු 20යි)

පියවර 1.1.8.2 :
- ඇමුණුම 1.1.8.1 අයත් සර්ගම් ලියා දක්වූ දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න, ඇමුණුම 1.1.8.2 උපදෙස් පත්‍රිකා දෙන්න.
- ස්වරු පුවරු වාද්‍ය භාණ්ඩය බැගින් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරිමට පුහුණුවීම් කරවන්න. මඟ පෙන්වීම් කරන්න

(මිනිත්තු 40යි)

පියවර 1.1.8.3 :
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න.
- නිවැරදි ශ්‍රැතිය සහ ස්වර ස්ථාන පිළිබඳව සැළකිලිමත් වන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කරන ක්‍රියාකාරකම් සඳහා වාදනයෙන් සහාය වන්න.
- ස්ථායි සහ අන්තරා කොටස්වල නාදමාලාව තහවුරුවුවා දූ යි බලන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.


  - ස්වර සංගති ඇතුළත් වන නිසා රාගාවබෝධය ලැබීමටත්, රාගය හඳුනා ගැනීමටත් 'සර්ගම්' පුහුණුව වැදගත් වන බව.
  - සෑම රාගයකටම 'සර්ගම්' ඇතුළත් වන බැවින් රාගයන් ගේ වෙනස, පහසුවෙන් වෙන්කර හඳුනාගැනීමට හැකිවන බව.
  - මෙම ගැයුම මධ්‍යලය ගීතය ගැයීමට රුකුලක් වන බව.

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- 'සර්ගම්' නිර්වචනය කරයි.
- රාගාවබෝධය ලැබීමට සර්ගම් පුහුණුව වැදගත් වන බව පිළිගනියි.
- සර්ගම් රාගයේ ස්වර  සංගති හඳුනා ගැනීමට වැදගත්වන බව පිළිගනියි.
- ස්වර සංගති නම් කරයි.
- සර්ගම් මතකයෙන් ගයයි.

ඇමුණුම 1.1.8.1

රාගය - භූපාලි
සර්ගම් ගීතය - තාලය ත්‍රිතාල්



ගුරුවරයාට උපදෙස් -
- සර්ගම් ගීතයෙහි නාදමාලාව හොඳින් තහවුරු වූවාට පසුව පහත සඳහන් ක්‍රියාකාරම්වල සිසුන් යොමුකරවිය හැකි ය.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක් සර්ගම් ගීතය ගායනය අරම්භ කරන අතර, ඒ සමගම අනෙක් කණ්ඩායමට සර්ගම් x ස්ථානයේ සිට ගායනය ආරම්භ කිරීමට යොමු කරන්න.
  උදා - සං සං ධ ප /  ග රි ස රි / ග - ප ග / ධ ප ග/
  සං සං ධ ප/ ග රි ස රි/
- සමස්ත ගීතය ' වක්‍ර' ක්‍රමයට කණ්ඩායම් ලවා ගායනය කරවන්න.



ඇමුණුම 1.1.8.2

උපදෙස් පත්‍රිකාව

- ඔබ කණ්ඩායමට ලැබුණු ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය භාවිත කරමින්, සර්ගම් ස්වර ප්‍රස්තාරයෙහි ස්වර පාදයෙන් පාදය වාදනය කර බලන්න.
- මීට පෙර භූපාලි රාගයේ ස්වර අභ්‍යාස සහ ස්වර සංගති ගායනය පුහුණුවූ බැවින්, ඔබට මෙහි ස්වර ගායනා කිරීමට පහසුවක් වෙන බව.
- ස්වර කොටසින් කොටස ගායනා කරන්න. පාදයෙන් පාදය තහවුරු වූ පසු ස්ථායි කොටස කිහිපවාරයක් ගායනය කරන්න.
- ඉන් පසු අන්තරා කොටස තහවුරුවනතෙක් ගායනය පුහුණු වන්න.
- අවශ්‍ය විටෙක ගුරු තුමා/ තුමිය ගේ උදව් ලබා ගන්න.
- සමස්ත සර්ගම් ගායනය තහවුරු වූ පසුව ඔබ කණ්ඩායමේ ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.
- ඔබගේ අභ්‍යාස පොතෙහි පැහැදිලිව මෙම ප්‍රස්තාරය සටහන් කරගන්න.

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.

ක්‍රියාකාරකම 1.1.9 : 'භූපාලි රාගයෙන් මධ්‍යලය ගීයක් ගයමු'

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 1.1.9.1 දක්වෙන ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- ඇමුණුම් 1.1.9.2
- ස්වර වාද්‍ය භාණ්ඩයක් (සර්පිනාව) තබ්ලාවක්.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.9.1 :
- මීට පෙර කරන ලද ඇමුණුම 1.1.9.1, 1.1.9.2 ක්‍රියාකාරකම් පිළිබඳව මතකයට නංවමින් ශ්‍රැතියට අනුව එම ගීත සිසුන් සමඟ ගායනය කරන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • ස්වර ප්‍රස්තාරයට අදාළව පද ප්‍රස්තාරය ඇතුළත් වූ මධ්‍යලය ගීත නමින් ගායන ශෛලියක් ඇති බව<br>• රාගාංග ඇතුළත් කර අලංකාර ලෙස ප්‍රබන්ධ කර ඇති ගීත විශේෂයක් බව<br>• මධ්‍යලය ගීත පුහුණුවීම සඳහා ස්වර අභ්‍යාස සහ සර්ගම් පුහුණුව වැදගත් වන බව |

(මිනිත්තු 10යි)

පියවර 1.1.9.2 :
- ඇමුණුම් අංක 1.1.9.1 හි දක්වෙන දෘශ්‍ය ආධාරකය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- මධ්‍යලය ගීතය රසවත්ව ගයා වයා දක්වන්න.
- ගීතයේ පාදයෙන් පාදය ගායනයට යොමු කරවමින් නාදමාලාව තහවුරු කරවන්න.
- ස්ථායි, සහ අන්තරා කොටස් පෙර පරිදි කණ්ඩායම් වශයෙන් සහ ඒකල වශයෙන්, සමස්ත කණ්ඩායම් නියෝජනය වන පරිදි නාද මාලාව තහවුරු කරවන්න.

(මිනිත්තු 50යි)

පියවර 1.1.9.3 :
- පන්තිය කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- අහඹුලෙස වාදනය කර දක්වන ගීතයේ කොටස් හඳුනාගැනීමට යොමු කරවන්න.
- නම් කරන ලද කණ්ඩායමට එම කොටස් ගායනය කර දක්වීමට අවස්ථාව දෙන්න.
- ගීතයේ ස්වර ප්‍රස්තාරය සහ පද ප්‍රස්තාරය වෙන් වෙන්ව ගායනයට යොමු කරවන්න.

- සමස්ත ගීතය ගායනය තහවුරුවූවාට පසුව පන්තියට ඉදිරිපත් කරවන්න
- නිවැරදි ස්වර ස්ථානවලට ගායනය හුරු කරවන්න.
- දුර්වල තැන් සකස් කරන්න.
- අභ්‍යාස පොතෙහි පිළිවෙලට ප්‍රස්තාර ගත කරගැනීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - මධ්‍යලය ගීත ඉතා රසවත් ලෙස ගායනය කළ හැකි බව
> - තාලයට අනුව නිවැරදි ස්වර ස්ථාන මත නිවැරදි ශ්‍රැතියෙන් ගායනය කළ යුතු බව
> - මධ්‍යලය ගීත පිළිබඳව මනා පුහුණුවක් ලැබීමෙන් රාගාවබෝධය ලැබෙන බව
> - රාගාශ්‍රිත නිර්මාණ කිරීමට පන්නරයක් වන බව

(මිනිත්තු 20යි)


තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- මධ්‍යලය ගීතයෙහි ස්ථායි කොටස නිවැරදිව ගයයි.
- මධ්‍යලය ගීතයෙහි අන්තරා කොටස නිවැරදිව ගයයි.
- රාගාවබෝධය ලැබීමට මධ්‍යලය ගීත පුහුණුවෙහි වැදගත්කම අගය කරයි.
- ගීත ස්වර ප්‍රස්තාරකරණයේ යෙදෙයි.
- භූපාලි රාගාශ්‍රිත නිර්මාණයෙහි යෙදෙයි.

ඇමුණුම 1.91.1


රාගය - භූපාලි - තාලය - ත්‍රිතාල්

මධ්‍යලය ගීතය



ඇමුණුම 1.1.9.2

රාගය - භූපාලි
මධ්‍යලය ගීතය



ඛ්‍යාල ගීත
ආනන්ද ජයසිංහ - පිටු අංක 4

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : මාත්‍රා තුනේ සහ හතරේ තාල පද වෙන් වෙන් ව හඳුනා ගනිමු.

ක්‍රියාකාරකම 1.2.1 : මාත්‍රා තුනේ සහ හතරේ තාලපද අධ්‍යයනය කරයි.
කාලය : කාලච්ඡේද 04 යි

ගුණාත්මක යෙදවුම් :
- තබ්ලාවක්, තාලම්පටක්, බෙරයක්
- ඇමුණුම් 1.2.1.1 ට තාලපද ප්‍රස්තාර කරනලද පත්‍රිකාව
- ඇමුණුම් 1.2.1.2 වගු සටහන් පත්‍රිකාව
- ඇමුණුම් අංක 1.2.1.3 බෙරපද ප්‍රස්තාර කරන ලද පත්‍රිකාව
- ඇමුණුම් අංක 1.2.1.4 බටහිර තාලපද ප්‍රස්තාර කරන ලද පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.1.1 :
- ඇමුණුම 1.2.1.1 හි සඳහන් තාල පද තුන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාව මෙහෙයවන්න.
  - විවිධ මාත්‍රා ගණනන් යුත් හින්දුස්ථානි තාල පද ඇති බව
  - ඒවා විවිධ නම් වලින් හැඳින්වෙන බව
  - එක් එක් තාලපදය සඳහා නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවක් ඇති බව
  - ඒවා තබ්ලාවෙන් වැයීම මෙන්ම පද කියමින් අතින් ද නිරූපණය කරන බව.

(මිනිත්තු 20 යි)

පියවර 1.2.1.2 :
- ඇමුණුම 1.2.1.2 වගු සටහන සිසුන්ට යොමු කරන්න.
- එහි උපදෙස් අනුව තාල පද එකින් එක කියමින් අත්තල යොදා නිරූපණය කිරීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා ගුරු සහාය ලබා දෙන්න.
- තාලානුකූලව තාල නිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න.
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක් කණ්ඩායමක් ශබ්ද නගා කියවන අතර අනෙක් කණ්ඩායමට නිහඬව අත්තල නිරූපණය කිරීමට අවස්ථාව දෙන්න.
- එම ක්‍රියාකාරකම මාරුවෙන් මාරුවට කිරීමට උපදෙස් දෙන්න.
- අවනද්ධ අක්ෂර හොඳින් උච්චාරණය කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- තබ්ලාවෙන් තාල පද වයා පෙන්වන්න. නැතහොත් ශ්‍රවණය කිරීමට සලස්වන්න.

(මිනිත්තු 40 යි)

පියවර 1.2.1.3 :
- ඇමුණුම1.2.1.3 ට අයත් බෙරපද ප්‍රස්තාර කරන ලද පත්‍රිකාව සිසුන්ට යොමු කරන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.

- පෙර තාල තැබූ ලෙස දේශීය බෙරපද සඳහා යොදන සංඥා වගුව ආශ්‍රයෙන් දැතින් නිරූපණය කරන්න.
- තාලම්පටක් උපයෝගී කොටගෙන තෙයි යන අක්ෂරය හඬ විහිදී යන ආකාරයට වාදනය කරන්න.
- දේශීය බෙරපද සඳහා ද අත්තල භාවිතයෙන් තාල තැබීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- හොඳින් අක්‍ෂර උච්චාරණය කිරීමට උපදෙස් දෙන්න.
- හින්දුස්ථානී තාලපදවලදී අනුගමනය කළ කණ්ඩායම් ක්‍රියාකාරකම මෙහි දී ද අනුගමනය කරන්න.
- බෙරයකින් වයා ශ්‍රවණය කිරීමට සලස්වන්න.

(මිනිත්තු 40 යි)

පියවර 1.2.1.4 :

- බටහිර තාල ප්‍රස්තාර කරනලද පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • හින්දුස්ථානි තාලපද අතින් නිරූපණය කිරීමට නිශ්චිත ක්‍රමයක් ඇති බව<br>• එහිදී තාල සංඥා අනුව විවිධ නිරූපණයන් සිදු කරන බව<br>• අවනද්ධාක්ෂාර හොඳින් උච්චාරණය කළ යුතු බව<br>• සමග්‍රහය අවධාරණය කළ යුතු බව<br>• දේශීය තාලපදද අතින් නිරූපණය කළ හැකි බව<br>• අවනද්ධ භාණ්ඩවලින් ද වයන බව<br>• එම තාලපද වල උඩරට, පහතරට හා සබරගමු වශයෙන් ප්‍රබේද ඇති බව<br>• ඒ ඒ සම්ප්‍රදායට අනුව ගැටබෙරය, යක් බෙරය, දවුල යන භාණ්ඩ වලින් මෙම පද වාදනය කරන බව<br>• එම තාල පද වල විවිධ අවනද්ධ අක්ෂර යෙදෙන බව.<br>• බටහිර තාල ලිවීමේ සුවිශේෂ ක්‍රමයක් ඇති බව<br>• බටහිර සංගීතයට අයත් අවනද්ධ වාද්‍ය භාණ්ඩවලින් එම තාල වයන බව.<br>• දියුණු ලිඛිත ක්‍රමයක් ඒ සඳහා භාවිතා කරන බව.<br>• $2_4$ , $3_4$ , $4_4$ ආදී වශයෙන් එම තාල හඳුන්වන බව.<br>• සරල ගී නිර්මාණයේ දී එම තාල රටා යොදා ගන්නා බව. |

(මිනිත්තු 60)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- හින්දුස්ථානි, දේශීය හා බටහිර තාලපද නම් කරයි.
- පද්ධතිය වෙනස් වුවද තාල සමාන බව පිළිගනියි.
- විවිධ තාල පද අත්තල යොදා පෙන්වයි.
- විවිධ තාලපද ශ්‍රවණය කිරීමට යොමුවෙයි.
- විවිධ සංගීත සම්ප්‍රදායයන්ට අයත් තාලපද වාදනය කිරීමට කැමැත්තක් දක්වයි.

ඇමුණුම 1.2.1.1

## හින්දුස්තානි තාල පද

### දාදරා තාලය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| යේකාව | ධ | ධි | න | ධ | තු | න |
| තාල සංඥා | x | | | 0 | | |

### කෙහෙර්වා තාලය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ධ | ගෙ | න | ති | න | ක | ධි | න |
| x | | | | 0 | | | |

### ත්‍රිතාලය

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| x | | | | 2 | | | | 0 | | | | 3 | | | |

ඇමුණුම 1.2.1.3

## දේශීය තාලපද

### සුළු තනිතිත

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | / | | / | | / | | / | |
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| 1 | දො | මි | කි | ට | කි | ට | දො | මි |
| 2 | දො | මි | කි | ට | ත |ක | දො | ං |

### මැදුම් තනි තිත

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | / | | | / | | |
| | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| 1 | දො | ං | ජි | ජි | ග | ත |
| 2 | ජි | ං | ග | ත | ගො | ගො |

### මහ තනි තිත

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දො | දො | ං | ත | ත | කු | දො | ං |

ඇමුණුම 1.2.1.2

උපදෙස් පත්‍රිකාව

හින්දුස්ථානි තාල

| නම | සංඥාව | අත්තල යෙදීමේ දී කළ යුතු දේ |
|---|---|---|
| සමග්‍රහය | X | මෙම සංඥාව යොදා ඇති ස්ථානයේ දී අත්පුඩියක් ගසන්න. |
| ඛලිය | ○ | මෙහි දී අත ඉවතට යොදන්න. (අත්පුඩි නොගසා) |
| අනුතාල | 2 3 | මෙහි දී අත්පුඩියක් ගසන්න |
| මාත්‍රා | 2 3 4 | සංඥාවක් යොදා නොමැති ඉලක්කම්වලදී වම් අතේ අත්ල මත දකුණතේ සුළැඟිල්ල, වෙදැඟිල්ල, මැදැඟිල්ල යන අනු පිළිවෙළට ඇඟිලි තුඩු තබන්න. (එක් අක්ෂරයකට එක බැගින්) |

දේශීය බෙර පද

| නම | සංඥාව | අත්තල යෙදීමේ දී කළ යුතු දේ |
|---|---|---|
| සුළු තනි තිත | / | තාලම්පටින් හඬ විහිදී යන ආකාරයට වැයීම (දෙ අත්ල ලිස්සා යන පරිදි අත් පුඩි ගැසීම) |
| මැදුම් තනි තිත | / | තාලම්පටින් හඬ විහිදී යන ආකාරයට වැයීම (දෙ අත්ල ලිස්සා යන පරිදි අත් පුඩි ගැසීම) |
| මහ තනි තිත | / | තාලම්පටින් හඬ විහිදී යන ආකාරයට වැයීම (දෙ අත්ල ලිස්සා යන පරිදි අත් පුඩි ගැසීම) |

සිසු උපදෙස්

ඉහත සඳහන් වගුව අධ්‍යයනය කරන්න. හින්දුස්ථානි තාලයක කොටස් මේ වනවිට ඔබ අධ්‍යයනය කර ඇත. අතින් තාල දැමීමේදී එම කොටස් වලදී අත් හසුරුවන ආකාරය අනුව එක් එක් තාල පදය හොඳින් උච්චාරණය කරමින් අතින් තාල තබන්න. පද උච්චාරණය කරන්න. මෙහි දී ගුරු උපදෙස් පිළිපදින්න.

ඇමුණුම 1.2.1.3

බටහිර තාල


මාත්‍රා 2 න් 2 (දෙමත්)

1.



මාත්‍රා 3 න් 3 (තුන්මත්)

2.



මාත්‍රා 4 න් 4 (සිව්මත්)

3.



නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : මාත්‍රා තුනේ සහ හතරේ තාලපද අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.2.2 : හින්දුස්තානි තාලයක කොටස් හඳුනා ගනිමු.
කාලය : කාලච්ඡේද 03 යි

ගුණාත්මක යෙදවුම් :
- තබ්ලාවක්
- ඇමුණුම් 1.2.2.1 ත්‍රිතාලය ඇතුළත් සටහන
- ඇමුණුම් අංක 1.2.2.2 ත්‍රිතාලයේ ප්‍රස්තාරය
- ඇමුණුම් අංක 1.2.2.3 කියවීමේ පත්‍රිකාව
- ඇමුණුම් අංක 1.2.2.4 ප්‍රශ්නාවලිය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 12.2.1 :
- ඇමුණුම් අංක 1.2.2.1 අයත් පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති උපදෙස් අනුව සිසුන් අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • හින්දුස්තානි තාලයක විවිධ කොටස් හා සංඥා ඇති බව<br>• එම කොටස් හා සංඥා හැඳින්වීමට විවිධ පාරිභාෂික පද ඇති බව<br>• එක් එක් කොටස්වලින් හා සංඥාවලින් පවසන අදහස් වෙනස් සහ විවිධ බව |

(මිනිත්තු 20 යි)

පියවර 1.2.2.2 :
- ඇමුණුම් අංක 1.2.2.2. පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රස්තාර කරන ලද තාලය අධ්‍යයනයට යොමු කරවන්න.
- ඇමුණුම 1.2.2.3 කියවීමේ පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න.
- එය කියවා කොටස් එකින් එක නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- තාලය තබ්ලාවෙන් වයා පෙන්වන්න.
- තාල සංඥා එකින් එක අවධාරණය කරන්න.
- සමග්‍රහය පිහිටන ස්ථානයේ හා ඛලිය පිහිටන ස්ථානයෙහි හඬෙහි වෙනස දක්වන්න.

(මිනිත්තු 60 යි)


පියවර 1.2.2.3 :
- සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම 1.2.2.4 හි සඳහන් ප්‍රශ්නාවලියේ ප්‍රශ්න 04 බැගින් කණ්ඩායම් 03 ට බෙදා දෙන්න.
- ඒ සඳහා කෙටි පිළිතුරු සැපයීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම්වල පිළිතුරු හුවමාරු කරගන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - තාලයක යම් කිසි මාත්‍රා සංඛ්‍යාවක් ඇති බව
    - මාත්‍රා කිහිපයක් එකතුවෙන් විභාගයක් සෑදෙන බව
    - විභාගයක් තුළ අවනද්ධාක්ෂර හා තාල සංඥා ඇති බව
    - ඒ ඒ තාල සංඥා එකිනෙකට වෙනස් බව
    - ඒවා, සම්, ඛලි, අනුතාල වශයෙන් හඳුන්වන බව
    - තාලයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා ප්‍රමාණය ආවර්තයක් බව
    - සමග්‍රහය x ලකුණකින් ලියා දක්වන බව
    - ඛලිය 0 ලකුණින් ලියා දක්වන බව
    - සෙසු අනුතාල 2. 3 ආදී ඉලක්කම් වලින් ලියා දක්වන බව
    - තාලයේ අවනද්ධ අක්ෂර ප්‍රබන්ධය ඨේකාව නමින් හැඳින්වෙන බව
    - සමග්‍රහය බර හඬක් බව (අවධාරණයෙන් වයන බව)
    - ඛලිය බර හඬක් නොවන බව
    - ඒ අනුව තබ්ලා පදයක මුල මැද අග සොයා ගැනීම පහසු වන බව.

(මිනිත්තු 40 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- තාලයක කොටස් නම් කරයි
- සංඥා දිගු අදහසක් සංක්ෂිප්ත කිරීමට භාවිතා වන බව පිළිගනියි.
- තාල පද අත්තල යොදා උච්චාරණයෙන් පෙන්වයි.
- තාල සංඥා පිළිබඳව සැළකිලිමත් වීම ඉතා වැදගත් බව පිළිගනියි.
- වෙනත් සංගීත සම්ප්‍රදායන් වල තාල සංඥා පිළිබඳ විමසයි.




ඇමුණුම 1.2.2.1

සිසු උපදෙස්

- ඔබට දී ඇති සටහන (රවුම) හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි ඊතලය යොදා ඇති දෙසට නෙත් යොමු කරන්න.
- රවුමේ අංක 1 සිට 16 දක්වා අක්ෂර මත ඇඟිල්ල තබමින් උච්චාරණය කරන්න.
- කොටු 4 න් හතරට යම් කිසි සංඥාවක් යොදා ඇති අයුරු නිරීක්ෂණය කරන්න.
- තබ්ලාවෙන් ත්‍රිතාලය වයන අයුරු ශ්‍රවණය කරන්න. එහි ආරම්භක මාත්‍රාව පිළිබඳ විමසිලිමත් වන්න. එය තරමක් අවධාරණයෙන් වාදනය වන අයුරු ඔබට දැනේවී.

ඇමුණුම 1.2.2.2

කාර්ය පත්‍රිකා අංක 2

| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| තාලසංඥා | x සමග්‍රහය | | | | 2 2 වන අනුතාලය | | | | 0 බලිය | | | | 3 තුන්වන අනුතාලය | | | |
| | විභාග | | | | විභාග | | | | විභාග | | | | විභාග | | | |

ආවර්ත 01

ඇමුණුම 1.2.2.3

කියවීමේ පත්‍රිකාව

මාත්‍රා : තාලයක කුඩාම ඒකකය මාත්‍රාවයි. මාත්‍රාවක් යනු තාලයේ දී කාලය මනින ඒකකයයි. ලය අනුව මාත්‍රාවක් සඳහා ගතවන කාලය අඩු හෝ වැඩි වේ.

විභාග : මාත්‍රා කිහිපයක් එක්වීමෙන් විභාගයක් සෑදේ. බටහිර සංගීතයේ මෙය හඳුන්වන්නේ BAR යන නමිනි.

ඨේකා : තාලයක අවනද්ධ පදය මේ නමින් හැඳින්වේ. උදා - දදාරා තාලයේ ඨේකාව ධධින/ධතුන

සමග්‍රහ: තාලයක ආරම්භක ස්ථානයේ යොදන තාල සංඥාව x ලකුණින් ලියා දක්වේ. එක් තාලයකට ඇත්තේ සමග්‍රහයක් පමණි මෙය තාලයේ ප්‍රබලතම ස්ථානය ලෙස හැඳින්වේ. විභාගයේ පළමු මාත්‍රාව මත යෙදේ. අතින් තාල දැමීමේදී ඒ මත අත් පුඩියක් ගසයි.

බලිය : තාලයක දුර්වලතම ස්ථානය ලෙස හඳුන්වයි. කිසියම් තාලයක බලිස්ථාන එකකට වඩා තිබිය හැක. ලියා දැක්වීමේදී '0' ලකුණ භාවිතා වේ. බොහෝ විට තාලය මධ්‍යයේ මෙම සංඥාව පිහිටයි. බොහෝ විට බලිස්ථානයේ යෙදෙන්නේ තිං/ති වැනි අක්ෂර වේ. අත්තල යෙදීමේදී අත් පුඩි නොගසා අත ඉවතට යොදා පෙන්වයි.

අනුතාලඃ තාලයක සමග්‍රහය හා බලිය හැරුණු විට සෙසු තාල ස්ථාන හඳුන්වනු ලබන්නේ අනුතාල නමිනි. ලියා දැක්වීමේ දී 2,3,4 ආදී වශයෙන් ඉලක්කම් යෙදේ. ඒ ඒ විභාගයේ පළමු මාත්‍රාව මත යෙදේ. අතින් තාල දැමීමේ දී අත් පුඩියක් ගසයි. මෙය තාලයක සමග්‍රහය තරම් ප්‍රබල නොවූ වද බලියට වඩා ප්‍රබලය.

ආවර්ත : තාලපදයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා සම්පූර්ණ කොටස ආවර්තයක් ලෙස හැඳින්වේ. තාලපදයක් එක් වරක් වැයීම එක් ආවර්තයකි. 2 වරක් වැයීම ආවර්ත 2 කි.

ඇමුණුම 1.2.2.4

## ප්‍රශ්නාවලිය

පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. ප්‍රදර්ශනය කර ඇති තාලය නම් කරන්න.
2 එම තාලයේ විභාග ගණන කීය ද?
3. එම තාලයේ මාත්‍රා ගණන කීය ද?
4. එම තාලයේ තාල සංඥා කීයක් තිබේ ද?
5. පළමුවන මාත්‍රාව මත පිහිටි තාලසංඥාව කුමක් ද?
6. පස්වන මාත්‍රාව මත යෙදෙන තාලසංඥාව කුමක් ද?
7. නමවන මාත්‍රාව මත යෙදෙන තාල සංඥාව නම් කරන්න .
8. සිව්වන විභාගය තුළ පිහිටා ඇති තාලස්ථානය නම් කරන්න.
9. මෙම තාලයේ එක් විභාගයක් තුළ ඇති මාත්‍රා ගණන කීයද ?
10. සිව්වන විභාගය තුළ ඇති ඨේකා කොටස ලියා දක්වන්න?
11. මෙම තාලයේ ආවර්තයක් තුළ ඇති මාත්‍රා ගණන කීය ද?
12 එම තාලය 2 වරක් වාදනය කිරීමේදී ආවර්ත කීයක් ලැබේ ද ?

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.1 : ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගී, හා කෝමළ ග නි සහිත ගී වයා සතුටු වෙමු.

කාලය : කාලච්ඡේද 02 (පළමු කාලඡේදය ශුද්ධ ස්වර ගීයක් සඳහාත්, දෙවන කාලච්ඡේදය කෝමළ ග නි සහිත ගීයක් හා සමාලෝචනය සඳහාත් යොදා ගන්න.)

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් ස්වර පුවරු භාණ්ඩ
- ඇමුණුම 2.1.1.1 ට අයත් ගීත ප්‍රස්තාර යන්ගේ පිටපත්.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර. 2.1.1.1
- 7 වන ශ්‍රේණියේදී වාදනය කළ ගීතයක් සියලු දෙනා සමග වාදනය කරන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට වාදනයට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවේ යෙදෙන්න.
  - ස්වර පුවරුව හොඳින් වාදනය කිරීම සඳහා දිනපතා අභ්‍යාස කිරීම අත්‍යවශ්‍ය බව
  - නිවැරදිව වාදනය කළ සිසුන් හැකියාව ප්‍රදර්ශනය කළේ හොඳින් අභ්‍යාස කර තිබීම නිසා බව.

(මිනිත්තු 10 යි)

පියවර 2.1.1.2 :
- පළමු කාලඡේදයට නියමිත ප්‍රස්තාරය සියලු සිසුන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- පේළියක් ඔබ විසින් ගයා එය නැවත සිසුන් ලවා වාදනය කරවන්න.
- ඉහත අයුරින් සම්පූර්ණ ගීතය පුහුණු කරවන්න.
- තනි තනිව පුහුණුවට ඉඩ සලස්වා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- දෙවන කාලඡේදයට නියමිත ගීතයේ ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කර ඉහත උපදෙස් අනුව පුහුණු කරවන්න.
- ගුරු උපදෙස් - පළමු කාල ඡේදය සඳහා ශුද්ධ ස්වර සහිත ගීතයක් දෙවන කාලච්ඡේදය සඳහා කෝමළ ගනි සහිත ගීතයක් යොදා ගන්න.

(මිනිත්තු 50 යි)

පියවර 2.1.1.3
- කාලය අනුව තනි තනිව හෝ කුඩා කණ්ඩායම් ලවා වාදනය කරවා වැරදි නිවැරදි කරන්න.
- ගීතයේ කොටස් කණ්ඩායම් කීපයක් අතරේ බෙදා දී සමස්ත ගීතය ගොඩනංවන්න.
  (Intro- chorus, Interlude, verse)

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න. (සමාලෝචනය දෙවන කාල ඡේදයේ අගදී පමණි.

| |
|---|
| • වාද්‍ය භාණ්ඩයක් වාදනය කිරීම තුළින් පාසල තුළදී මෙන්ම අනෙක් සෑම සමාජයක් තුළම (පවුල, පාසල, රැකියා ස්ථානය වැනි) පුද්ගල වටිනාකමක් ලැබෙන බව<br>• අභ්‍යාස ජීවන පුරුද්දක් බවට පත් කරගත යුතු බව (අනෙකුත් දෛනික ක්‍රියාකාරකම් සේ)<br>• ගීත වාදනයෙන් ලැබෙන සතුට මානසික තෘප්තිය නිසා ඇතිවන සමබරතාවයෙන් අධ්‍යාපන කටයුතු සාර්ථක වන බව<br>• ගීතය ගායනා කරමින් වාදනය කිරීමට හුරුවිය යුතු බව. |

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ශුද්ධ ස්වර හා කෝමළ ග නි සහිත ගීත වාදනය කරයි.
- ගීත වාදනයේ දී මනා සංයමයක් හා ප්‍රමාණවත් අභ්‍යාසයක් අවශ්‍ය බව අවබෝධ කරගෙන පවසයි.
- සාමුහිකව ක්‍රියා කළ යුතු අයුරු ක්‍රියාවෙන්ම අවබෝධ කර ගනියි.
- ශාරීරික මානසික ඉහිල්බව ලගා කර ගැනීම සඳහා ගීත වාදනය කරයි.
- විනෝදාංශයක් වශයෙන් ගීත වාදනයට පෙළඹෙයි.

ඇමුණුම 2.1.1.1

ගුරු උපදෙස්

පහත දැක්වෙන ගීතයන්ගේ ස්වර ප්‍රස්තාර හා 6, 7, 8 සංගීත මාර්ගෝපදේශ ග්‍රන්ථයන්හි ඇතුළත් සුදුසු ගීතයන්හි ප්‍රස්තාර එක බැගින් වසර පුරාවට වරින් වර සිසුන්ට ලබා දී නිවසේ දී පුහුණුවීමට යොමු කරන්න.

- දියගොඩ සැම තැන
- ඕලූ පිපිලා
- මල් පිපෙයි
- අකුරු මැකී නෑ
- ලංකා ලංකා

- හැකි සෑම අවස්ථාවලදී සිසුන්ගේ වාදන නිපුණතා වර්ධනය වී ඇති ප්‍රමාණය පිළිබඳව වරින් වර නිරීක්ෂණය කරන්න.

  වාදනය සඳහා සිසුන් පැමිණෙන්නේ අවුරුද්දේ මුල් වාරවල පමණක් වන බැවින් සහ එය ප්‍රමාණවත් නොවන බැවින් ඉතිරි වාර වලදී අතිරේක පන්ති යොදා ගැනීම වඩාත් ඵලදායී වේ. ඊට අමතරව උදෑසන රැස්වීම් ශිෂ්‍ය සමිති පාසලේ විශේෂ අවස්ථා, විවිධ ප්‍රසංග ආදී කටයුතුවලදී වාදනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ගනිමින් සිසුන්ගේ වාදනය පිළිබඳ අභිරුචිය වර්ධනය කිරීම කෙරෙහි ද සැළකිලිමත් වන්න.

- ඉගැන්වීමේ කාර්යයේ දී අත්‍යවශ්‍ය වන භාණ්ඩ වාදනය පිළිබඳ ඔබගේ දායකත්වය වර්ධනය කර ගැනීමට ගුරු උපදේශක තුමා /තුමිය සමඟ සාකච්ඡා කරන්න.

සැ. යු - ඉහත උපදෙස් මාලාව තෝරාගත් සංගීත භාණ්ඩ වාදනය සඳහා ද අනිවාර්යයෙන්ම අදාල වේ.

ඇමුණුම 2.1.1.1

ගුරුවරයාට උපදෙස්

1. පහත දැක්වෙන ගීතයන් හී ස්වර ප්‍රස්තාර මෙම ක්‍රියාකාරකම සඳහා යොදා ගන්න.

1. මල් පිපෙයි දෙනෙත් හැරෙයි
2. වඳිමු සුගත
3. ඇසේ මධුර ජීවනයේ ගීතා
4. හෙළ ජාතික අභිමානේ

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.2 : ශුද්ධ ස්වරයෙහි මියැසි සිත්තම් වයමු

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් ස්වර වාද්‍ය භාණ්ඩ
- සිසුන් අත ඇති ස්වර පුවරුවේ වැයූ ශුද්ධ ස්වර ගීතයේ ස්වර ප්‍රස්තාරය
- ඇමුණුම 2.1.2.1 ට අයත් ස්වර ප්‍රස්තාරයේ පිටපත්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.2.1
- වාදනයට දක්ෂ අයෙකුගේ භාණ්ඩය සුසරකර දී ඔහු හෝ ඇය ලවා පසුගිය පාඩමක දී ඉගෙනගත් ගීතයක් හෝ වෙනත් කැමති ගීතයක් වාදනය කරවන්න.
- ඔහු /ඇය අගයන්න.
- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්වෙන වෙනත් කෙනෙකු ඇතොත් අවස්ථාව දෙන්න.
- ඔහු/ ඇයත් ඇගයීමට ලක් කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

  - සංගීත භාණ්ඩයක් වාදනය කිරීමේ හැකියාව පුද්ගලයකු සතු සුවිශේෂී වටිනාකමක් බව.
  - භාණ්ඩ වාදනයේ දී නිවැරදි ඉරියව් හා නිවැරදි ක්‍රම ශිල්ප අනුගමනය කළ යුතු බව.
  - වාදනයට පෙර භාණ්ඩය සුසර කර ගත යුතු බව.

( මිනිත්තු 10 යි)

පියවර 2.1.2.2
- සියලු භාණ්ඩ සුසරකර දෙන්න
- පළමු කාලච්ඡේදය තුළදී, පසුගිය ස්වර පුවරු වාදන පාඩම සඳහා යොදාගත් ශුද්ධ ස්වර සහිත ගීතයේ ස්වර ප්‍රස්තාරය තමා ඉදිරියෙන් තබා ගැනීමට උපදෙස් දෙන්න.
- ස්වර ප්‍රස්තාරය තාලානුකූලව පේළියෙන් පේළිය ගායනය කරවන්න. (අනුකරණය මගින්)
- තනි තනිව වාදනයට පුහුණු වීමට සලස්වා අවශ්‍ය තැන්හි උපදෙස් සපයන්න.
- ඇමුණුම 2.1.2.1 ට අයත් ප්‍රස්තාරය සියල්ලන්ටම පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- අභ්‍යාස පොතේ ලියා ගැනීමට සලස්වන්න.
- පේළියෙන් පේළිය පළමුව ඔබ විසින් ගයා දෙවනුව සිසුන් ලවා වාදනය කරවන්න.
- සමස්ත ගීතයම වාදනයට හුරු කළ පසු තනි තනිව වැඩිදුරටත් පුහුණුවීමට සලස්වා අවශ්‍ය තැන්හි උපදෙස් ලබා දෙන්න.

( විනාඩි 70 යි)

ගුරු උපදෙස් - ස්වර පුවරුවේ වාදනය කළ ගීතය පළමු කාල ඡේදය තුළත් ඇමුණුම 2.1.2.1 ට අයත් ගීතය දෙවන කාලච්ඡේදය තුළත් භාවිතා කරන්න.

පියවර 2.1.2.3

- ගී දෙක, සියලුම සිසුන් ලවා එකවර වාදනය කරවන්න.
- භාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් වාදනය කරවන්න.
- පන්තිය සතුව ඇති භාණ්ඩ අතරේ ගීතය කොටස් කර දී සමස්ත ගීතය ප්‍රසාංගිකව ඉදිරිපත් කරවන්න.
- කාලය අනුව තනි තනිව ගෙන සදොස් තැන් නිදොස් කරන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- දක්ෂ වාදකයකු වීම සඳහා දිනපතාම අභ්‍යාස කළ යුතු බව
- ස්වර ස්ථාන පිළිබඳව වඩාත් සැළකිලිමත් විය යුතු බව
- ගායනයට සමානව වාදනය කිරීම සඳහා ගීතයේ පද සිතෙන් ගයමින් වාදනයට හුරු විය යුතු බව
- ගීතය ගයමින්ම වාදනය කිරීම ද අත්‍යාවශ්‍ය බව


(මිනිත්තු 40 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ගීත වාදනයේ දී ස්වර ස්ථාන නිවැරදිවිය යුතු බව වටහා ගනියි.
- කිසියම් භාණ්ඩයකින් දක්ෂ ලෙස ගීත වාදනය කිරීමේ හැකියාව තම පෞරුෂය වර්ධනය කරන්නක් බව සිතට ගනියි.
- ගීත වාදනය කරයි
- ගීත වාදනය ජීවන පුරුද්දක් බවට පත් කර ගනියි.
- ගීත වාදනය තුළින් ශාරීරික මානසික ඉහිල්බව ලබා ගැනීමට පෙළෙඹෙයි.

ඇමුණුම 2.1.2.1

හා හා හරි හාවා



නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.3 : කෝමළ ගනි මිහිර සොයා යමු - හුරු අතැඟිලි තුඩගින්
කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් ස්වර වාද්‍ය භාණ්ඩ
- සිසුන් අත ඇති ස්වර පුවරුවේ වැයූ කෝමළ ගනි සහිත ගීතයේ ස්වර ප්‍රස්තාරය
- ඇමුණුම 2.1.3.1 ට අයත් ස්වර ප්‍රස්තාරයේ පිටපත්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.3.1
- සිසුන් කීප දෙනෙකුගේ භාණ්ඩ සුසර කරදී ශුද්ධ ස්වර සහිත ගීතයක් වාදනය කරවන්න.
- අනෙක් සිසුන් ලවා තාල තැබීමට යොමු කරවන්න.
- ඔවුන් ඇගයීමට ලක් කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • සිසුන්ගේ කුසලතාවයන් මතු වූයේ මනා අභ්‍යාසයක් තිබීම නිසා බව.<br>• ගීත වාදනය දියුණු කර ගැනීම සඳහා ස්වර අෂ්ඨකය හා විවිධ ස්වර අභ්‍යාස වාදනය කළ යුතු බව.<br>• දක්ෂ වාදකයකු වීම ජීවිතයේ සෑම අංගයක්ම සාර්ථකත්වයකට මඟ හෙළි කරන බව. |

( මිනිත්තු 10 යි)

පියවර 2.1.3.2
- ඉතිරි භාණ්ඩද සුසර කර දෙන්න.
- ස්වර පුවරු වාදන පාඩමේ දී යොදාගත් කෝමළ ග නි සහිත ගීතයේ ප්‍රස්තාරය තමාට පෙනෙන සේ තබා ගැනීමට උපදෙස් දෙන්න.
- ස්වර ප්‍රස්තාරය තාලානුකූලව ගායනයට හුරු කරවන්න.
- තනි තනිව පුහුණුවීමට පොළඹවා අවශ්‍ය තන්හි උපදෙස් සපයන්න.
- ක්‍රියාකාරකමේ ඇති ගීත අතරින් ඔබ විසින් තෝරාගත් කෝමළ ග නි සහිත වෙනත් ගීතයක ස්වර ප්‍රස්තාරය පන්තියටම පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- සටහන් පොතේ ලියා ගැනීමට සලස්වන්න.
- පේළියෙන් පේළිය පළමුව ඔබ විසින් ගයමින් එය වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කිරීමට සලස්වන්න.
- අනතුරුව තනි තනිව හුරුවීමට යොමු කර අවශ්‍ය උපදෙස් සපයන්න.

(මිනිත්තු 70 යි)

ගුරු උපදෙස් - පළමු ගීතය පළමු කාලඡේදය තුළත්, දෙවන ගීතය දෙවන කාලඡේදය තුළත් පුහුණු කරවන්න

පියවර 2.1.2.3

- ගීත දෙකම, සියලුම සිසුන් ලවා එකවර වාදනය කරවන්න.
- භාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් වාදනය කරවන්න.
- පන්තියෙහි ඇති භාණ්ඩ අතරේ ගීතය කොටස් කර දී සමස්ත ගීතය ප්‍රසාංගිකව ඉදිරිපත් කරවන්න.
- කාලය අනුව තනි තනිව ගෙන සදොස් තැන් නිදොස් කරන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - දක්ෂ වාදකයකු බිහිවනුයේ සතත අභ්‍යාසයෙන් ම බව
  - කෝමළ ග හා නි හි මිහිරියාව මතු වනුවේ නිවැරදි ස්වර උත්පාදනයෙන් පමණක් බව
  - ගායනයට සමානව වාදනය කිරීම සඳහා ගීතයේ පද සිතෙන් ගයමින් වාදනයට හුරු විය යුතු බව
  - ගීතයක් ගායනය කරමින් වාදනය කිරීම ද අත්‍යවශ්‍ය කුසලතාවයක් බව

(මිනිත්තු 40 යි)


තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ගීත වාදනයේ දී ස්වර ස්ථාන නිවැරදිව හඳුනාගෙන භාවිත කරයි.
- කෝමළ ග නි ස්වර දෙක මෘදු හඬකින් යුත් මිහිරි ස්වර යුගලක් බව පිළිගනියි.
- කෝමළ ග නි ස්වර සහිත ගීත ගායනය කරයි.
- ගීත වාදනය ජීවන පුරුද්දක් බවට පත් කොට ගෙන තම කුසලතා දක්වයි.
- ගීත වාදනය තුළින් මානසික ඉහිල් බව ලඟා කොට ගෙන සැහැල්ලු පැවැත්මක් පළ කරයි.

ඇමුණුම 2.1.2.1

- ඇත එපිට -

C minor



නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.4 : ශුද්ධ ස්වර අභ්‍යාස වයමු.
කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- ඇමුණුම 2.1.4.1 හි ඇතුළත් අභ්‍යාස
- ඇමුණුම 2.1.4.2 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ක්‍රීඩා ඇඳුමින් සැරසී ව්‍යායාම්වල යෙදෙන පිරිසක් පෙන්නුම් කරන ඡායාරූපයක් හෝ පින්තූරයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.4.1
- ව්‍යායාම්වල යෙදෙන පිරිස ඇතුළත් රූපයක් පෙන්වන්න.
- ඒ පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - දිවීම උස පැනීම, කවපෙත්ත විසිකිරීම වැනි කුමන ක්‍රීඩාවක යෙදුනත් මූලික අභ්‍යාසයන් හි නිරත විය යුතු බව
> - අපගේ ජීවිතය හා සම්බන්ධ සෑම ක්‍රියාවකම නිපුණතාවය ලැබෙනුයේ දිනපතා එම ක්‍රියාවන්හි යෙදීමෙන් ලැබෙන අභ්‍යාසයෙන් බව (ආහාර ගැනීම, ඇවිදීම, වාහන පැදවීම, අකුරු ලිවීම, පාඩම් කිරීම...)
> - සංගීත භාණ්ඩයන්හි ගීත වාදනයට පෙර මූලික අභ්‍යාස වාදනය ද ඉතා වැදගත් බව

( මිනිත්තු 10 යි)

පියවර 2.1.4.2
- ඇමුණුමේ ඇති ස්වර අභ්‍යාස අතුරින් ඔබට පහසු ස්වර අභ්‍යාසයක් ඔබ කැමති භාණ්ඩයකින් වයා පෙන්වන්න.
- ස්වර අභ්‍යාසයේ ස්වභාවය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- භාණ්ඩ අනුව සිසුන් වර්ග කරන්න.
- ඇමුණුම 2.1.4.1 හි ඇතුළත් අභ්‍යාස අතුරින් කාලය හා සිසුන්ගේ ශක්‍යතාවය අනුව ඔබ විසින් තෝරාගත් අභ්‍යාසයන්හි (අවම 9 ක්) පිටපත් භාණ්ඩ අනුව කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ඇමුණුම 2.1.4.2. හි ඇතුළත් කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාව අනුව කටයුතු කිරීමට පොළඹවා අවශ්‍ය තන්හි උපදෙස් ලබාදී නිවැරදි කරන්න.

(විනාඩි 90 යි )

පියවර 2.1.4.3
- පුහුණු වූ හැකි සියලු අභ්‍යාස සියලු සිසුන් හා එක්ව එකවර වාදනය කරවන්න.
- භාණ්ඩ අනුව වෙන් වෙන්ව වාදනය කරවන්න.
- කාලය අනුව එක් එක් සිසුන්ගේ පුහුණුව බලා අවශ්‍ය උපදෙස් සපයන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- වාදනයෙහි නිපුණතා මතුවීමට සතත අභ්‍යාසය ඉතා වැදගත් වන බව.
- මුලින් ඉතා අඩු හා තමාට පහසු ලයෙන් පටන් ගෙන ක්‍රමානුකූලව වේගය වැඩි කළ යුතු බව.
- සැම විටම නිවැරදි ස්වරස්ථාන හා ස්වරයේ පැහැදිලි නාදය පිළිබඳව වඩාත් සැළකිලිමත් විය යුතු බව.
- දිනකට අවම වශයෙන් විනාඩි 30 ක්වත් අභ්‍යාස කළ යුතු බව.
- හොඳින් අභ්‍යාසයේ යෙදීම මානසික ඒකග්‍රාතාවයට හා ශාරීරික ව්‍යායාමයට හේතු වන බව.


(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ස්වර අභ්‍යාස වාදනය කරයි.
- වාදන කුසලතාව දියුණු කර ගැනීමට අභ්‍යාස වැදගත් බව වටහා ගනියි.
- දිනපතා අභ්‍යාස කිරීම පුරුද්දක් කර ගනියි
- දිනපතා අභ්‍යාසය නිසා මනස එක්තැන් වීමෙන් දැනෙන සැහැල්ලුවට ප්‍රිය කරයි.
- අභ්‍යාසයෙහි අගය පිළිබඳ ධනාත්මක ඇසින් විමසයි.

ඇමුණුම 2.1.4.1


ශුද්ධ ස්වර අභ්‍යාස - වයලීන් එස්රාජ් දිල්රුබා වැනි භාණ්ඩ සඳහා ආරෝහණ අවරෝහණ ක්‍රමයෙන් වේගවත් කරන්න.



## සිතාර් - මැන්ඩලින් - ගිටාර් සඳහා ශුද්ධ ස්වර අභ්‍යාස

සැ. යු - විකාරිය සඳහා ස්වර යොදා ඇත්තේ සිතාරය සඳහා පමණි.

ආරෝහණය අවරෝහණය වේගවත් කරන්න.





ඇමුණුම 2.1.4.2

කාර්ය පත්‍රිකාව

- ඔබට ලැබී ඇති ස්වර අභ්‍යාස හොඳින් කියවා බලන්න.
- ඉතා අඩු වේගයෙන් අභ්‍යාස කිරීම ආරම්භ කරන්න

  සැ. යු - * නිවැරදි ස්වර ස්ථාන පිළිබඳව සැළකිලිමත් වන්න

  * පිරිසිදු නාදයක් මතුකරලීමට උත්සාහ ගන්න.
- ක්‍රමයෙන් වේගවත් කරන්න

  සැ යු - වේගවත් කිරීමේ දී ඔබේ අතෙහි ඇඟිලි පැටලේ නම් නැවත වේගය අඩුකර පුහුණු වීමෙන් අනතුරුව වේගවත් කරන්න.
- ඔබ ගුරුතුමාට/තුමියට පෙන්වා වැරදි ඇතොත් නිවැරදි කරවා ගන්න.
- දිනපතාම දිනකට විනාඩි 30 ක්වත් අභ්‍යාස කරන්න.

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.5 : කෝමළ ග නි සහිත අභ්‍යාස වයමු.
කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- ඇමුණුම 2.1.5.1 හි ඇතුළත් අභ්‍යාස
- ඇමුණුම 2.1.5.2 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.5.1
- සියලු භාණ්ඩ සූසරකර දෙන්න.
- පසු ගිය ශුද්ධ ස්වර අභ්‍යාස පාඩමින් කීපයක් සියලු දෙනා එක්ව වයන්න.
- ශුද්ධ ස්වර සහිතව එම මොහොතේදීම ඔබ විසින් නිර්මාණය කළ අභ්‍යාස කීපයක් ගයා පෙන්වා වාදනය කිරීමට සලස්වන්න. (කොටසින් කොටස)
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - හොඳින් අභ්‍යාස කළ සිසුන් සියලු දෙනා අතර කැපී පෙනෙන බව.
    - භාණ්ඩ වාදනය හුරු වීමට අභ්‍යාස පුහුණුවීම අත්‍යවශ්‍ය බව.
    - අභ්‍යාසයන්ට හොඳින් අත හුරුවූ පසු ස්වර ප්‍රස්තාර දුටු සැනින්ම වාදනය කළ හැකි බව

( මිනිත්තු 10 යි)

පියවර 2.1.5.2
- ඇමුණුමේ ඇති ස්වර අභ්‍යාස අතුරින් ඔබට පහසු ස්වර අභ්‍යාසයක් ඔබ කැමති භාණ්ඩයකින් වයා පෙන්වන්න.
- ස්වර අභ්‍යාසයේ ස්වභාවය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- භාණ්ඩ අනුව සිසුන් වර්ග කරන්න.
- ඇමුණුම 2.1.5.1 හි ඇතුළත් අභ්‍යාස අතුරින් තෝරාගත් සිසුන්ට ගැලපෙන අභ්‍යාස භාණ්ඩ අනුව බෙදා දෙන්න. (අවම 9 ක්)
- ඇමුණුම 2.1.5.2. හි ඇතුළත් කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාව අනුව කටයුතු කිරීමට සලස්වා අවශ්‍ය තන්හි උපදෙස් ලබා දී නිවැරදි කරන්න.

පියවර 2.1.5.3
- පුහුණු වූ සියලු අභ්‍යාස සියලු සිසුන් හා එක්වී එකවර වාදනය කරන්න.
- භාණ්ඩ අනුව වෙන් වෙන්ව වයන්න.
- කාලය අනුව එක් එක් සිසුන්ගේ පුහුණුව බලා අවශ්‍ය උපදෙස් සපයන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- වාදනයෙහි නිපුණතා මතු වීමට ස්වර අභ්‍යාස ඉතා වැදගත් වන බව
- ශුද්ධ ස්වරයේ හා කෝමළ ස්වරයේ වෙනස හොඳින් වටහා ගත යුතු බව
- සෑම විටම නිවැරදි ස්වර ස්ථාන හා නාදයේ පැහැදිලි බවපිළිබඳ සැලකිදිමත් විය යුතු බව
- මුලින් අඩු වේගයෙන් පටන් ගෙන ක්‍රමයෙන් වේගවත් කළ යුතු බව
- සිත එක්තැන් කරමින් අභ්‍යාස කිරීම කදිම මානසික ඒකාග්‍රතාවයට හා ශාරීරික ව්‍යායාමයට හේතුවන බව .

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- කෝමළ ග නි සහිත ස්වර අභ්‍යාස වාදනය කරයි.
- ශුද්ධ ග නි හා කෝමළ ග නි අතර වෙනස වටහා ගනියි.
- කෝමළ ග නි තුළ විශේෂ මිහිරක් ඇති බව සිතයි.
- අභ්‍යාස තුලින් භාවනායෝගී වී මනස සැහැල්ලු කර ගැනීමට පෙළඹෙයි.
- දිනපතා අභ්‍යාස කිරීමට සිතට ගනියි.

ඇමුණුම 2.1.5.1

වයලීනය - එස්රාජ් - දිල්රුබා සඳහා ස්වර අභ්‍යාස

1
| ස රි ග - | ස රි ග - | ස රි ග ම | ග - ම - |
| ප ධ නි - | ප ධ නි - | ප ධ නි සං | නි - සං - |
| සං - නි - | සං නි ධ ප | සං නි ධ ප | ධ නි ධ ප |
| ම - ග - | ම ග රි ස | ම ග රි ස | රි ග රි ස |

2
| ස රි ග ම | ප ධ නි සං | සං නි ධ ප | ම ග රි ස |

- සෙසු ස්වර අභ්‍යාස සඳහා ශුද්ධ ස්වර අභ්‍යාස සඳහා ඉදිරිපත් කර ඇති ස්වර අභ්‍යාසයන්ගේ ශුද්ධ ග නි වෙනුවට කෝමළ ග නි යොදා සිසුන් අතට පත් කරන්න.

සිතාර් /මැන්ඩලින් / ගිටාර්



- සෙසු ස්වර අභ්‍යාස සඳහා ශුද්ධ ස්වර අභ්‍යාස සඳහා ඉදිරිපත් කර ඇති ස්වර අභ්‍යාසයන්ගේ ශුද්ධ ග නි වෙනුවට කෝමළ ග නි යොදා සිසුන් අතට පත් කරන්න.

ඇමුණුම 2.1.5.2

කාර්ය පත්‍රිකාව

- ඔබට ලැබී ඇති ස්වර අභ්‍යාස හොඳින් කියවා බලන්න.
- ඉතා අඩු වේගයෙන් අභ්‍යාස කිරීම ආරම්භ කරන්න

  සැ. යු - * නිවැරදි ස්වර ස්ථාන පිළිබඳව සැළකිලිමත් වන්න

  * පිරිසිදු නාදයක් මතුකරලීමට උත්සාහ ගන්න.
- ක්‍රමයෙන් වේගවත් කරන්න

  සැ යු - වේගවත් කිරීමේ දී ඔබේ අතෙහි ඇඟිලි පැටලේ නම් නැවත වේගය අඩුකර පුහුණු වීමෙන් අනතුරුව වේගවත් කරන්න.
- ඔබ ගුරුතුමාට/තුමියට පෙන්වා වැරදි ඇතොත් නිවැරදි කරවා ගන්න.
- දිනපතාම දිනකට විනාඩි 30 ක්වත් අභ්‍යාස කරන්න.

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.

ක්‍රියාකාරකම 2.1.6 : ස්වර වාද්‍ය භාණ්ඩ යෙන් ගී වයමු.
කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.1.6.1-අ හා 2.1.6.1- ආ සිතාරයේ හා එස්රාජයේ කොටස් නම් කළ රූප සටහනක්
- ඇමුණුම 2.1.6.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව.
- ඇමුණුම 2.1.6.3 හි ඇතුළත් කියවීම් පත්‍රිකාව I, II
- ඇමුණුම 2.1.6.4 හි ඇතුළත් කාර්ය පත්‍රිකා.
- ඇමුණුම 2.1.6.5 හි අ. ආ. ඇතුළත් ස්වර ලකුණු කිරීමේ පින්තූරය ඇතුළත් පත්‍රිකාව.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.6.1
- සිතාර් හා ඒස්රාජ් වාදන ඇතුළත් කැසට් පට වෙන් වෙන්ව අසන්නට සලස්වන්න.
- ශ්‍රවණය මගින් භාණ්ඩය හඳුනා ගැනීමට පොළඹවන්න.
- සිසුන්ට හඳුනා ගැනීමට අපහසු අවස්ථාවල දී ඔබගේ මග පෙන්වීම ලබා දෙන්න.
- සිතාරය, එස්රාජය හෝ ඒවායේ පින්තූර පෙන්වා එම භාණ්ඩ පිළිබඳ අත්දැකීම් ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - සිතාරය හා එස්රාජය එකිනෙකට වෙනස් මිහිරි නාදයක් නිපදවන භාණ්ඩ බව.
    - සිතාරය උත්තර භාරතීය රාගධාරී සංගීතය හා සරළ ගී සඳහා වැඩි වශයෙන් භාවිතා කරන බව.
    - එස්රාජය රාගධාරී සංගීතයට වැඩි වශයෙන් ද සරල සංගීතයට දුර්ලභව ද භාවිතා කරන බව.
    - සිතාර් හා එස්රාජ් සඳහා වාද්‍ය ශිල්පීන් විරල බැවින් එය ප්‍රගුණ කිරීම වැදගත් වන බව

( මිනිත්තු 20 යි)

පියවර 2.1.6.2
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ඇමුණුම 2.1.6.1 'අ' හා 2.1.6.1 'ආ' හි පිටපත් සියලුම කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 2.1.6.2 හි ඇති ගවේෂණ පත්‍රිකාව සියලු කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 2.1.6.3 හි ඇතුළත් කියවීම් පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 2.1.6.4 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව සියලු කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 2.1.6.5 හි ඇතුළත් රූපය කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාව අනුව ක්‍රියා කිරීමට සිසුන් යොමු කර අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 80 යි)

පියවර 2.1.6.3

- කළු ලෑල්ල හෝ දෘශ්‍ය උපකරණයක් භාවිතයෙන් සිතාරයේ හා එස්රාජයේ ස්වර පිහිටීම දක්වා නිදොස් කර ගැනීමට උපකාර වන්න.
- කණ්ඩායමෙන් මතුව ආ නායකයකු ලවා ගවේෂණ පත්‍රිකාවේ තොරතුරු ඉදිරිපත් කරවන්න.
- සියලු කණ්ඩායම්වල තොරතුරු සමීක්ෂණය කර තම සටහන පෝෂණය කර ගැනීමට යොමු කරවන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.


- සිතාරය හා එස්රාජය ඉතා සියුම්ව සුසර කරගත යුතු භාණ්ඩ දෙකක් බව.
- හොඳින් සුසර නොකළහොත් අනුනාද තත් ('තරප්') නොහැඬවෙන බව.
- සිතාරයේ හා එස්රාජයේ අනුනාද තත් කම්පනය වනුයේ ප්‍රධාන තතෙන් නිකුත් වන ස්වරයේ සහ අදාළ අනුනාද තතෙහි සංඛ්‍යාතය සමාන වීම තුළින් බව.
- සිතාරයේ හඬ නිෂ්පාදනය සඳහා තුම්බාවේ ප්‍රමාණය ඒ සඳහා භාවිත කර ඇති අමු ද්‍රව්‍ය යනාදිය බලපාන බව.
- සිතාරය හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය වන අතර එස්රාජය වංග සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය වන බව.
- වාදනය සඳහා සිතාරයට ' මිස්රාබය' හා එස්රාජයට 'අළුව' (Bow) භාවිත කරන බව.

(මිනිත්තු 60 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- සිතාරයේ හා එස්රාජයේ ස්වර පිහිටන අයුරු හඳුනා ගනියි.
- මෙම භාණ්ඩ අයත් සංගීත සම්ප්‍රදායන් පිළිබඳව අවබෝධ කර ගනියි.
- මෙම භාණ්ඩ හැදෑරීමට පෙළඹෙයි.
- සිතාර් හා එස්රාජ් වාදන ශ්‍රවණයට පෙළඹෙයි.
- මෙම භාණ්ඩයෙහි කොටස් නම් කරයි.


ඇමුණුම 2.1.6.1- 'අ'




සිතාරයක කොටස්

ඇමුණුම 2.1.6.1- 'ආ'

එස්රාජයක කොටස්




1 තත් සුසර කෙරෙන ඇණ (ඇජේස්ටර්) (කුණ්ටි)

2. පර්දා

3. තරෆ් තත් රඳවන ඇණ

4. කඳ (දන්ඩි)

5. තුම්බාව

6. තුම්බා හම් ආවරණය (චම්ඩා)

7. තත් දරණය - සෝඩි ( බ්‍රිජ්)

8. තත් රඳවනය - ලංගෝටි

9. අලුව - ගජ් (බෝ)

10. අලුවේ කෙඳි - බාල් (බෝ හෙයාර්)

11. කෙඳි සකසුව - තන්ත්‍රී

12. තාර් ගහන්

ඇමුණුම 2.1.6.2

ගවේෂණ පත්‍රිකාව

| කණ්ඩායම | වාදනය කරන ආකාරය | නිකුත් වන හඬේ ස්වභාවය | භාරතයේ ප්‍රචලිත ප්‍රදේශ | අයත් සංගීත සම්ප්‍රදාය | තත් සංඛ්‍යාව | භාරතීය වාදකයන් | ලාංකීය ශාස්ත්‍රීය වාදකයින් | නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය | සම විෂමතා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | සමානතා | අසමානතා |
| සිතාරය | | | | | | | | | | |
| එස්රාජය | | | | | | | | | | |

ඇමුණුම 2.1.6.3

කියවීම් පත්‍රිකාව - 1

සිතාරය

- මෙය හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය කි.
- වාදනය කිරීම සඳහා මිස්රාබ් නම් උපකරණයක් භාවිත කරයි. එය දකුණතෙ හි දබරගිල්ලේ පැළඳ (ගුරජ්) බ්‍රිජ් එක අසලින් තත පෙළමින් හඬ නිපදවයි.
- සිතාරය තත් 07 න් යුත් භාණ්ඩයකි. එහෙත් ප්‍රධාන වශයෙන් ස්වර නිපදවනුයේ ප්‍රධාන තතෙනි. එය 'නායකී තාර්' ලෙස හඳුන්වයි.
- සිතාරයේ දණ්ඩිය දැවයෙන් නිමකර ඇති අතර තුම්බාව වට්ටක්කා විශේෂයකින් නිමවා ඇත.
- පණ්ඩිත් රවිශංකර් ලොව දක්ෂතම සිතාර් වාදකයකු ලෙස ප්‍රචලිත ය. පණ්ඩිත් නිකිල් බැනර්ජ්, උස්තාද් විලයත්ඛාන් යන ශිල්පීන් ද දක්ෂ සිතාර් වාදකයින් ය.
- විශාරද ලයනල් එදිරිසිංහ, විශාරද බී. එස්. විජේරත්න, කේ. දයාරත්න, ධර්මසිරි පෙරේරා වැන්නවුන් මෙරට සිටි දක්ෂ සිතාර් වාදකයන් ය. ආචාර්ය නිර්මලා රුද්‍රිගු, හා ප්‍රදීප් රත්නායක වැන්නවුන් වර්තමානයේ ප්‍රසිද්ධ දක්ෂ ශාස්ත්‍රීය සිතාර් වාදකයින් ය.
- මෙහි ප්‍රධාන තත් වලට අමතරව ඉතා සිහින් තත් පෙළක් ඇත. ඒවා 'තරාෆ් වයර්' (අනුනාද තත් ) ලෙස හඳුන්වයි.
- උතුරු ඉන්දියාවේ ලක්නව්, අග්‍රා, දිල්ලි , බරණැස වැනි ප්‍රදේශවල වඩාත් ප්‍රචලිත ය.
- සිතාරය මෝගල් යුගයේ විසූ අමීර් ඛුෂ්රූ නැමැති පර්සියන් ජාතික සංගීතඥයා විසින් නිපදවූ බව ප්‍රචලිත ය.
- මෙරට සරල සංගීතයට අයත් සරල ගී සඳහා බහුල ලෙස භාවිත භාණ්ඩයකි සිතාරය.

### කියවීම් පත්‍රිකාව - 11

එස්රාජය

- උතුරු ඉන්දීය (හින්දුස්ථාන් ) සංගීතයට අයත් ස්වර වාද්‍ය භාණ්ඩයකි එස්රාජය. එහෙත් මෙය වඩා ප්‍රචලිතව ඇත්තේ බෙංගාල ප්‍රදේශයේ ය.
- කල්කටාවේ පිහිටි විශේෂ සංගීත අධ්‍යාපන ආයතනය වන මහ කවි රවීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් බිහිකළ 'ශාන්ති නිකේතනය' මෙම භාණ්ඩය උගන්වන ප්‍රධාන අධ්‍යාපන ආයතනය යි.
- රවීන්ද්‍ර සංගීතය (වංග) සඳහා බහුල ලෙස භාවිත කරයි. (රවීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් බිහිකළ ගී ආර රවීන්ද්‍රසංගීතය වේ)
- ප්‍රධාන තත් 4 කින් යුක්තය. එයින් ස්වර උත්පාදනය කරනු ලබන්නේ මුලින්ම පිහිටුවා ඇති ප්‍රධානතම තතෙනි. එය 'බාජ්කා තාර්' (Main String) යනුවෙන් හඳුන්වයි. මන්ද්‍ර ම ස්වරයට එය සුසර කරයි.
- මෙහි දණ්ඩිය හා තුම්බාව දැව භාවිතයෙන් නිමවා ඇත. තුම්බාව මත යොදා ඇත්තේ සත්ව සමකි. සොඩි එක පිහිටුවා තත් යොදා ඇත්තේ මෙම සම මතය.
- සාරංගී පවුලට අයත් තන්ත්‍රීය භාණ්ඩයකි. සාරංගියෙන් පසුව නිර්මාණය කළ භාණ්ඩය දිල්රුබාවයි. ඒ අනුසාරයෙන් ගයාදම් ප්‍රදේශයේ සිටි ඊශ්වරී රාජ් නැමැති වාදිකාව මෙහි හැඩය වෙනස් කිරීමෙන් පසු ඊස්රාජ් නමින් හැඳින්විය.
- බිම වාඩිවී වාදනය කරනු ලබයි. ලක්නව් ක්‍රමය අනුව 'දිල්රුබාව' වාදනය කරන ආකාරයට වම් උරමත ට එස්රාජයේ දණ්ඩිය හේත්තු කරගෙන ද වාදනය කරනු ලබයි. ශාන්ති නිකේතන ක්‍රමය අනුව දණ්ඩිය ඍජුව සිරස්ව සිටින සේ තබාගෙන වාදනය කරයි..
- මෙහි හඬ නිපදවනුයේ අළුවෙනි (Bow) යන ඉතා මිහිරි සිහින් නාදයක් නිපදවෙයි.
- මෙහි භාවිත අනු නාද (තරප්) තත් නිසා හඬේ මිහිරි බව තීව්ර වෙයි.
- පණ්ඩිත් අසීස් චන්ද්‍ර බැනර්ජි, පණ්ඩිත් රණධීර් රෝයි දක්ෂ ඉන්දියානු එස්රාජ් වාදකයින් කිහිප දෙනෙකි.
- මෙම භාණ්ඩය මෙරට සරල ගී සඳහා අල්ප වශයෙන් භාවිත කර ඇත.
- විශාරද සදානන්ද පට්ටි ආරච්චි , විශාරද ලීලානන්ද රත්නායක අප රටේ සිටි ප්‍රවීණ එස්රාජ් වාදකයින් වන අතර වර්තමානයේ විශාරද අනිල් මිහිරිපැන්න, විශාරද සුදත් වික්‍රමසිංහ වාද්‍ය නිපුණ් නිෂාද් හඳුන්පතිරණ වැන්නවුන් දක්ෂ ලාංකීය එස්රාජ් වාදකයින් ය.

ඇමුණුම 2.1.6.4


### කාර්ය පත්‍රිකාව

පහත සඳහන් උපදෙස් අනුගමනය කරන්න.

- සිතාරය හා එස්රාජය යන සංගීත භාණ්ඩ හෝ ඒවායේ පින්තූර හොඳින් ගවේෂණය කරන්න.
- භාණ්ඩ දෙක අතර ඇති සමාන අසමානතා පිළිබඳව කණ්ඩායම් එක්ව සාකච්ඡා කරන්න.
- ඇමුණුම 2.1.4.5 හි ස්වර පිහිටුවීම සඳහා වූ පත්‍රිකාව ගන්න.
- එහි 'ස' ස්වරය පිහිටි ස්ථානය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ස්වර 12 පිහිටීමේ පිළිවෙල මතකයට නගා ගන්න.
- එම පිළිවෙල අනුව 'ස' ස්වරය(7) පිහිටන තැන සිට පසු පසට මන්ද්‍ර ස්වර ලකුණු කරන්න.
- (6 5 4 3 2 1) 'ස' ස්වරයේ (7) සිට ඉදිරියට මධ්‍ය හා උච්ච ස්වරත් (8 9 10 11 12 13 14 15 16 17 18 19 20) ලකුණු කරන්න.
- ගවේෂණ පත්‍රිකාව (2.1.6.2) පිටපත් කරගෙන කියවීම් පත්‍රිකාව අනුසාරයෙන් එහි වගුව පුරවන්න.
- කියවීම් පත්‍රිකාවෙන් වගුවට ඇතුළත් නොවූ තොරතුරු සටහන් පොතේ පිටපත් කරන්න.


ඇමුණුම 2.1.6.5- අ

සිතාරයේ ස්වර පිහිටීම



ඇමුණුම 2.1.6.5- ආ

එස්රාජයේ ස්වර පිහිටුවන්න.



නිපුණතාවය 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 3.1 : අද්‍යතන සරල ගීත රසාස්වාදයේ යෙදෙයි

ක්‍රියාකාරකම 3.1.1 : ගීතයක බස සහ ආකෘතිය විමසා රස විඳිමු.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 3.1.1.1 ට අයත් සරල ගීත පද ලියූ පත්‍රිකා ඇමුණුම් 3.1.1.2. ට අයත් කාර්ය ගවේෂණ පත්‍රිකාව .

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.1.1
- 'රත්නදීප ජන්ම භූමි' ගීතය ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ගී පද ලියූ පත්‍රිකා පන්තියට ප්‍රදර්ශනය කරන්න
- ගීතය ශ්‍රවණය කරමින් එහි පද කොටස් සෙමින් ගායනය කිරීමට උපදෙස් දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - ගීතයක කොටස් කිහිපයක් ඇති බව
  - ගීතයක පද මාලාවකින් යම් අර්ථයක් ගම්‍යවන බව.
  - ගී පද රචනාවකට උචිත ස්වර රචනාවක් යෙදීමෙන් රසවත් ගීතයක් නිර්මාණය වන බව.

( මිනිත්තු 10 යි)

පියවර 3.1.1.2
- රත්න දීප ජන්ම භූමි ගීතය හා ගුරුවරයා විසින් තෝරාගත් හරසුන් පද සහිත ගීතයක පදමාලාව ප්‍රදර්ශනය කරන්න.
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම් 3.1.3.2 ගවේෂණ පත්‍රිකාවේ පිටපත් කණ්ඩායම් අතර බෙදන්න.
- එම කණ්ඩායම් දෙක ගවේෂණයෙහි යොදවන්න.
- කණ්ඩායම් දෙකේ ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

( මිනිත්තු 50 යි)

පියවර 3.1.1.4
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ ක්‍රියාකාරකම්හි සංශෝධනයන් සාකච්ඡා කරන්න.
- ඒවා සම්පූර්ණ කර තම සටහන් පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - සරල ගීතයක ඇති පදමාලාවක ආකෘතිය ස්ථායි , අන්තරා වශයෙන් බෙදී ඇති බව
  - සරල ගීතයක පද මාලාවට ප්‍රබල ස්ථානයක් හිමිවන බව
  - එම පද රචනාවේ සාර්ථක බව ගීතයට සාර්ථක තනුවක් නිර්මාණය සඳහා බලපාන බව
  - ගීතයේ බස තුළින් මතුවන භාවාර්ථ ඉස්මතු කිරීම සඳහා විවිධ විචිත්‍ර සංගීතමය උපක්‍රම භාවිතා කළ හැකි බව

- ගීතයකට ධ්වනිපූර්ණ වචන ඇතුළත් පද මාලාවක් අවශ්‍ය බව.
- සරල ගීයක් පෙරවාදන (Introduction ) අතුරුවාදන (Interlude) කෙටි ස්වර ඛණ්ඩ (Bits) සමාන්තර සංගීත (Counterpoint) සංවාදන (Harmony)යනාදී අංගයන්ගෙන් යුක්ත බව.

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- සරල ගීතයක් සාර්ථක වීම සඳහා එහි බස, ආකෘතිය හා අතුරු කොටස් නියමාකාරව සංයෝග විය යුතු බව ප්‍රකාශ කරයි.
- ගී පද ඉස්මතු වනසේ සංගීතමය කොටස් යෙදීමේ වැදගත්කම පිළිගනියි.
- සංගීතය යොදා ගනිමින් සරල ගීත ගැයීමට ප්‍රියතාවයක් දක්වයි.
- ගුණාත්මක බවින් අනූන සරල ගීත වෙන් කර ගැනීමට පෙළඹෙයි.
- සරල ගීත ශ්‍රවණයේ දී එහි බස, ආකෘතිය හා සංගීත ඛණ්ඩ ගැන අවධානයෙන් විමසයි.

ඇමුණුම 3.1.1.1

සරල ගීතය - A

පද රචනය - මහගම සේකර
සංගීතය හා ගායනය - ආචාර්ය. ඩබ්. ඩී. අමරදේව

රත්න දීප ජන්ම භූමි
ලංකාදීප විජය භූමි
මේ අපේ උදාර වූ
මාතෘ භූමියයි //

ආදී සිංහලේ - වීර මී මුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි //

මාණික්‍ය සේ පොලෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙළූ ලේ කඳයි.

සින්ධූපමාන වැව් තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නේ උන් හෙලූ ප්‍රාණ වායුවයි.

ගංගා තරංග රාව දී රිදී වනින්
මල් පිපි කුළින් කුළේ හැපී
ගායනා කරන්නේ ආකාශයේ නැඟී
වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි.

- මෙම ගීතයේ පද වලින් ප්‍රකාශිත අදහස් ඔබේ වචනයෙන් වාක්‍ය රචනාවක් සේ ලියන්න. ගුරුවරයා විසින් තෝරාගත් අනෙක් ගීතය ප්‍රදර්ශනය කර එහි ඇතුළත් අර්ථය ගොඩනැගෙන සේ වාක්‍යයක් තනන්න.....

- රත්න දීප ජන්ම භූමි ගීතය ගුරුවරයා තෝරාගත් හරසුන් පද සහිත අනෙක් ගීතයෙත් බස හැසිරවීම, අර්ථ දැක්වීම පිළිබඳ ස්වාධීන අදහස් පහත දැක්වෙන වගුවේ සංසන්දනාත්මකව සටහන් කරන්න.

| රත්න දීප ජන්ම භූමි | ගුරුවරයා තෝරාගත් ගීතය |
|---|---|
| | |

ඇමුණුම 3.1.1.2

ගවේෂණ පත්‍රිකාව

පහත දැක්වෙන්නේ සරල ගීතයක අඩංගු විය යුතු ආකෘතියකි

| | | |
|---|---|---|
| A | Introduction | |
| B | Chorus | song / Melody |
| C | Interlude | |
| D | 1st Verse | |
| E | Interlude | |
| F | 2nd Verse | |

| | | |
|---|---|---|
| A | Introduction | |
| B | Chorus | song / Melody |
| C | Interlude | |
| D | 1st Verse | |
| E | Interlude | |
| F | 2nd Verse | |
| G | Interlude | |
| H | 3ndVerse | |

- මෙම ආකෘති දෙකෙන් 2 වන ආකෘතිය 1 වන ආකෘතියට වඩා දිගින් වැඩි බව ඔබට පෙනී යයි.
- ඒ අනුව 1 වන ආකෘතියට වඩා වැඩි කාලයක් 2 වන ආකෘතිය සඳහා ගත වෙයි.
- කෙසේ වෙතත් මේ ආකෘති දෙකම මිනිත්තු තුනේ සිට හතර දක්වා කාල පරාසයක විහිදෙයි.
- ගීත ආකෘතියේ ඔබේ පහසුව පිණිස A සිට F සහ H දක්වා නම් කර තිබේ (එය මේ පාඩමේදී පමණක් බව සලකන්න. ව්‍යවහාර සංගීත ගී ප්‍රස්තාරයක එසේ නම් කර නැත)
- ගීතයක මුල්ම කොටස වන්නේ 'Introduction' නමින් හැඳින්වෙන කොටසයි. එය පෙර වාදනය කොටසයි.
- Chorus ලෙස හැඳින්වෙන්නේ ගී පද මාලාවේ පළමු කොටසයි. එය හින්දුස්ථානි සංගීතයේ ස්ථායි කොටසට සමාන වේ.
- ව්‍යවහාරික සංගීතයේ ප්‍රස්තාරවල ඒ සඳහා song හෝ Melody කියා ද හැඳින්වෙයි.
- Interlude ලෙස නම් කර ඇත්තේ අතුරු වාදන කොටස යි. එය ගීයේ පළමු දෙවන කොටස් අතර තුර වැයෙයි. සාමන්‍යයෙන් ගීතයක Interlude අවස්ථා 2 ක් පමණ යෙදේ. දීර්ඝ පද මාලා ගී බවට පත් කිරීමේ දී Interlude 3 ක් ඇති අවස්ථා ද ඇත.
- Verse කොටස හින්දුස්ථානි සංගීතයේ අන්තරා කොටසට සමානකමක් දක්වයි.
- මේ හැර සරල ගීතයක් විචිත්‍ර කිරීම සඳහා උපයෝගී කරගනු ලබන සංගීතමය අංග කිහිපයක් ද ඇත.
- Bits, Counterpoint, sign to sign, repetation mark වැනි ව්‍යවහාරික අංගයි.
- පේලි දෙකක් අතර යා කරන ස්වර ඛණ්ඩය Bits ලෙස හැඳින්වේ.
- ගීපද මාලාවේ අදහස තීව්‍ර කිරීම සඳහා ඊට සමාන්තරව යෙදෙන විචිත්‍ර ස්වර රචනාව Counter Point යන නමින් හඳුන්වයි.
- අග සිට නැවත මුලට පැමිණිය යුතු බවට සංකේතවත් කරන ලකුණ Sign to sign ලෙස හැඳින්වේ.
- පේලියක් දෙවරක් වාදනය කල යුතු අවස්ථාව සංකේතවත් කිරීමට භාවිත වෙන ( [[ ]] ) සංකේතය Repetation ලෙස හඳුන්වයි.

නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 3.1 : අද්‍යතන සරල ගීත රසාස්වාදයේ පුහුණු වෙයි.

ක්‍රියාකාරකම 3.1.2 : සරල ගීත ගයමු....

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 3.1.2.1 ට අයත් යෝජිත සරල ගීත ලැයිස්තුව, ගීත පටිගත කළ කැසට් පටය හා කැසට් යන්ත්‍රය, සර්පිනාව, තබ්ලාව.
- ඇමුණුම 3.1.2.2 ට අයත් ගීත ස්වර ප්‍රස්තාර ලැයිස්තුව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.2.1
- භාවිතයේ පවතින ජනප්‍රිය සරල ගීත හා ගායක ගායිකාවන් කිහිප දෙනෙකු නම් කිරීමට සිසුනට උපදෙස් දෙන්න.
- එම ගීත ගැන විමසීමක් කරන්න.
- සුදුසු ගීත කිහිපයක් සිසුන් සමඟ එක්ව ගායනය කරන්න.
- තනිව ගැයීමට ඉදිරිපත් වන සිසුවෙකුට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - ස්වර පුවරුවක් බොක්ස් ගිටාරයක් වැනි භාණ්ඩයක සහාය සමඟ ගීත ගායනය පහසු බව.
  - ප්‍රචලිත සරල ගීත ගායනයේ දී එහි මුල් රූපය පවත්වා ගැනීම ගැන සැළකිලිමත් විය යුතු බව.
  - ගීත ගායනය හා රස විඳීම වින්දනාත්මක දිවියකට අවශ්‍ය බව.

( මිනිත්තු 20 යි)

පියවර 3.1.2.2
- පන්තිය කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- එක් එක් ගීතය කැසට් යන්ත්‍රය මගින් වාදනය කර ශ්‍රවණය කිරීමට උපදෙස් දෙන්න.
- පසුව කණ්ඩායමක් සඳහා එක් ගීතයක් තෝරා දෙන්න.
- ස්වර පුවරුව බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- වාදන හැකියාව ඇති ළමුන්ව එම ගීතවල ස්වර ප්‍රස්තාරය වාදනය කිරීමට උනන්දු කරවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් කරන්න.

( මිනිත්තු 20 යි)

පියවර 3.1.1.3
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී ගුරුවරයා වාදනයෙන් සහය වන්න.
- එම ක්‍රියාකාරකම්වල අඩුපාඩුකම් නිවැරදි කර ගැනීමට උපදෙස් දෙන්න.
- ගීත ගායනයේ දක්ෂ ළමුන්ට ඒකලව ගැයීමට අවස්ථාව සලස්වන්න.
- ගුරුවරයා ද සිසුන් සමඟ එක්ව එම ගීත ගායනය කරන්න.

K• පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ඒ ඒ ගීත සඳහා විවිධ ශ්‍රැති භාවිත වන බව (Pitch)
- එම ගීතයේ ශ්‍රැතිය ගායිකාවගේ හෝ ගායකයාගේ කටහඬ හි ස්වර පරාසය අනුව තෝරා ගෙන ඇති බව.
- සරල ගීයක අංග පිළිබඳව මනා අවබෝධයක් තිබීම ගායනයකදී පහසුවක් වන බව
- ස්වර ප්‍රස්තාරය කියවා ඒ අනුව පද ගැයීමෙන් ගීතයක තනුව නිවැරදිව ගැයිය හැකි බව
- ගීතයේ අරුත තේරුම් ගෙන බස, කට හඬ හැසිරවීමෙන් එහි ප්‍රස්තුතාර්ථය මනාව මතුවෙන බව

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- සරල ගීතයක් කොටස් , බස හා ආකෘතිය ගැන මනා දැනුමක් ලැබීම, සාර්ථක ගී ගායනයට බොහෝ ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- ගීතයේ ස්වර ප්‍රස්තාරය ගැන අවබෝධයකින් යුතුව ගීත (නාදමාලාව) ගායනා කිරීම සාර්ථක ගායකයෙකුගේ ලක්ෂණයක් බව පිළිගනී.
- ප්‍රචලිත සරල ගීත එම ගායන ශිල්පීන් යටතේ වර්ග කර ගොනු කරන්න.
- නවතම සරල ගී නිර්මාණ ඉදිරිපත් කරයි.

ඇමුණුම 3.1.2.1

යෝජිත සරල ගීත ලැයිස්තුව

1 සැලළිහිණි කොවුල්
2 ශාන්ත මේ රැයාමේ
3 ලෝ අඩ නින්දේ
4 සසර වසන තුරු
5 අම්මා සඳකි
6 ආදරය කරුණා දයාවෙන් සාගරය පරදයි
7 රුවන් නිදන හෙළ බිමයි
8 මගේ රටට දළදා හිමි සරණයි
9 සුදට සුදේ වලා කුළයි නිල් අහසේ පාවෙන්නේ

ඇමුණුම 3.1.2.2


රුවන් නිදන හෙළබිමයි. -
නුවන් සදන හෙළ බිමයි
නිවන් පුදන හෙළ බිමයි
ලොව හෙළි කළ හෙළ බිමයි

මගේ රුවන හෙළ බිමයි
මගේ නුවන හෙළ බිමයි
මගේ නිවන හෙළ බිමයි


මිහිරෙන් පිරි හෙළ බිමයි - රුහිරින් බැඳි හෙළ බිමයි
ඉසුරින් සරි හෙළ බිමයි - ලොව බලපෑ හෙළ බිමයි
මගේ මිහිර හෙළ බිමයි - මගේ රුහිර හෙළ බිමයි
මගේ ඉසුර හෙළ බිමයි

විරුවන් ලත් හෙළ බිමයි - පඬිදුන් පත් හෙළ බිමයි
යුදුවන් මත් හෙළ බිමයි- ලොව හෙබවූ හෙළ බිමයි
මගේ තිදස හෙළ බිමයි - මගේ සිරස හෙළ බිමයි
මගේ නිවස හෙළ බිමයි


පද - කො. වෙ. පඤ්ඤාපාල
තනුව/ගායනය - වික්ටර් රත්නායක




$^4/_4$ - මගේ රටට - C -Major



- අම්මා සඳකි -



C -Major



නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 3.1 : අද්‍යතන සරල ගීත රසාස්වාදයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 3.1.3 : 'නැති බැරි මොහොතක පිහිටට ඉන්නේ
මව්නි පියාණනි ඔබ පමණයි '

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 3.1.3.1 හි දැක්වෙන චිත්‍රයෙහි ඡායා පිටපත්
- ඇමුණුම 3.1.3.2 හි දැක්වෙන ගීත ලියන ලද පත්‍රිකා සහා කාර්ය පත්‍රිකා

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.3.1
- ඇමුණුම 3.1.3.1 හි දැක්වෙන චිත්‍රයෙහි ඡායා පිටපත් පන්තියට බෙදා දෙන්න.
- එම චිත්‍රයෙහි දැක්වෙන සංකල්ප පිළිබඳව සිසුන් විමසන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුවෙකුට අදහස් දැක්වීමට අවස්ථාව සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

  - සමාජය යහපත් මගට යොමු කරවන උපදෙස් ඇතුළත් චිත්‍ර, පෝස්ටර් පාසල් වල මෙන්ම බොහෝ ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙන බව.
  - ජන මාධ්‍යය මගින් ප්‍රචාරය වන විවිධ වැඩ සටහන්, එම සත් කාර්යයට දායක වන බව.
  - ග්‍රැමෆොන් ගී යුගයේ සිට මේ දක්වා උපදේශාත්මක ගී රැසක් රටට දායක කිරීමට ගී පද රචකයින්, තනු රචකයින් මෙන්ම ගායක, ගායිකාවන් කැපවුණු බව.

( මිනිත්තු 10 යි)

පියවර 3.1.3.2
- ඇමුණුම 3.1.3.2 හි දැක්වෙන උපදේශාත්මක ගී අතරින් තෝරාගත් ගීතය ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය (තැටිගත කරන ලද) ශ්‍රවණයට සලස්වන්න.
- ගීතයෙහි පදමාලාව, තාලය, සංගීත සංයෝජනය සංගීත භාණ්ඩ වැනි කරුණු පිළිබඳව අවධානයෙන් යුතුව ගීතයට සවන් දීමට සලස්වන්න. ගීතය රසවත්ව ගයා වයා දක්වන්න.
- ගීතය පාදයෙන් පාදය ගායනයට හුරුකරවමින් නාද මාලාව, සහ පද මාලාව තහවුරු කරවන්න.
- පන්තිය කණ්ඩායම් කරන්න.
- උපදේශාත්මක ගීත ලියන ලද පත්‍රිකා සහ කාර්ය පත්‍රිකා කණ්ඩායම් වලට බෙදා දෙන්න.
- එක් එක් කණ්ඩායමකට එක් ගීතය බැගින් ගීත 4 බෙදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පියවර 3.1.3.3

- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ගීත ගායනා ඉදිරිපත් කිරීමේ දී වාදනයෙන් සහාය වන්න.
- කණ්ඩායම් අතර සාකච්ඡා මෙහෙයවන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.


> - උපදේශාත්මක ගීත මගින් සමාජයේ යහපත් ආකල්ප, සංවර්ධනය වන බව.
> - සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ගීතයට ප්‍රබල ශක්තියක් ඇති බව.
> - ගී පද රචකයින් තනු රචකයින් ගායක ගායිකාවන් අගය කළ යුතු බව.
> - මෙවැනි ගීත, විවිධ වැඩ සටහන් මගින් ප්‍රචාරය කිරීමේ වාර ගණන වැඩි කළ යුතු බව.
> - පාසල් සමිති, උත්සව අවස්ථා වල මෙන්ම තරගාවලීන් සඳහා මෙවැනි ගීත නිර්දේශ කළ යුතු බව.

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- ගී පද මාලා වල දැක්වෙන උපදෙස් වගුගත කරයි.
- උපදේශාත්මක ගීත මෙන්ම සිදුවන සමාජ සංශෝධනය අගය කරයි.
- උපදේශාත්මක ගීත ගායනා කරයි.
- උපදේශාත්මක ගීත රැස් කරයි.
- විවිධ උත්සව අවස්ථාවල දී අධ්‍යයන චාරිකාවල දී මෙවැනි ගීත තෝරා ගනියි.

ඇමුණුම 3.1.3.1



ඇමුණුම 3.1.3.2

කාර්ය පත්‍රිකාව

- ඔබට සපයා ඇති ගීතයෙන් කියැවෙන උපදේශනයන් ලියන්න.
- ශ්‍රව්‍යපටයට සවන් දී කණ්ඩායම එක්වී එම ගීතය ගායනා කරන්න.
- එම ගීතයට භාවිත කරන ලද සංගීත භාණ්ඩ නම් කරන්න.
- ගීතය ගයන ගායකයා හෝ ගායිකාව නම් කරන්න.
- එමෙන්ම පද රචකයින්, තනු රචකයින් නම් කරන්න.
- පන්තියට ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම එක් වී උපදේශාත්මක ගීතය පුහුණු වන්න.
- කණ්ඩායම එක් වී ප්‍රසාංගාත්මකව ගීතය ඉදිරිපත් කරන්න.

ගුරුවරයාට උපදෙස් -

- ඔබ සූදානම් කරගත් උපදේශාත්මක ගීතය හෝ සිසුන් වඩා කැමති ගීතය තෝරා ගන්න.
- නිවැරදිව නාද මාලාව පුහුණු කරවන්න.
- ස්වර වාදනයෙන් තාල වාදනයෙන් සහාය වන්න.
- පාසලේ උදෑසන රැස්වීම සඳහා හොඳම කණ්ඩායම තෝරා ගීතය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උපදේශාත්මක ගී

පාන් කිරිත්තා තක්කිට තරිකිට උඩ පැන පැන නටතෙයි
පාන් කිරිත්තී රබාන අරගෙන කරබාගෙන වයතෙයි
උන්ගේ පැටවුන් වටේට ඉඳගෙන දෑතින් හඬ තලතෙයි
මේවා බල බල කළු කැදෑත්තෙක් කීචි බීචි කියතෙයි

පාන් කිරිත්තා තමන්ගේ පාඩුවේ නැටුම පටන් ගත්තේ
අහල පහල කිසිවෙකුටත් ඒකෙන් හිරිහැරයක් නැත්තේ
කොහේද ඉඳගෙන කළු කැදෑත්තා වහලා අර අත්තේ
උන්ගේ නැටුමට බාදා කරමින් ගීය පටන් ගත්තේ

පාන් කිරිත්තා නැටුම නවත්තා කේන්තියෙන් ආවා
කැඳැත්තාගේ කලු අත්තටුවෙන් අල්ලා සෙලවුවා
ඊට පස්සේ ඌ සටසට ගලා මොන මොනවද කීවා
ළඟට කිට්ටු වී මා ද ගොළුවතින් ඊට සවන් පෑවා

අනුන්ගෙ වැඩ ගැන විවේචනය කර කර ඉන්නවට වඩා
තමන් දන්න දේ හරියට කරපන් කියලා කීය හඬා

ගායනය - ෆ්‍රෙඩී සිල්වා
පද මාලාව - ප්‍රේම කීර්ති ද අල්විස්

පාන් කිරිත්තා ස්වර ප්‍රස්තාරය



උපදේශාත්මක ගී

නැතිබැරි මොහොතක පිහිටට එන්නේ
මව්නි පියාණනි ඔබ පමණයි
බුදුන් ළඟට අපගේ දුක දන්නේ
මව්නි පියාණෙනි ඔබ දෙපළයි


කල්ප ගණනකින් අප නුදුටුව මුත්
උණුසුම අඩු නැත ඔබේ කැදැල්ලේ
පරාජයෙන් අප අසරණ වූ දා
රැකවරණයි ඔබගේ සෙවනැල්ලේ

නැති බැරි මොහොතක ....

අපේ නමට ඇස් කඳුළු උනන්නේ
ඔබට පමණි මේ සිතිජ වළල්ලේ
සැබෑ පෙමක් සෙනෙහසක් ලබන්නේ
ඔබේ උතුම් මිහිරැස් ගඟුලැල්ලේ

සංගීතය හා ගායනය - රෝහණ වීරසිංහ
පද රචනය - සුනිල් ආරියරත්න

නැති බැරි මොහොතක ගීතය - ස්වර ප්‍රස්තාරය




ගායනය හා සංගීතය - රෝහණ වීරසිංහ

උපදේශාත්මක ගී

හිතන්නකෝ අයියේ - දූන්වත් හැදෙන්නකෝ අයියේ
දඟ ළමයින් නරකයි බෝ සැරයි
හොඳ ළමයට කවුරුත් ආදරෙයි
සෙල්ලම ලෙල්ලම වෙනවාමයි
ඒකෙන් ඇස් රතු වෙනවාමයි

මැර කොල්ලන් එක්කල හාදකම්
උඩ පැනිලී නැටිලී නාඩගම්
හොඳ නෑ කැතයි - චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ -
හිතන්නකෝ අයියේ ....

එකටෙක නොකියා වාද වෙලා
ගුරු දෙගුරුන් හට මෙල්ල වෙලා
හැදුනේ නැත්නම් අයියේ මගේ
බලු වලිගේ වාගේ මයි ඇදේ
හොඳ නෑ කැතයි, චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ ...

පොඩි අපි දෙන්නා ඇස් දෙක වාගේ අම්මා සළකාවී
උදේ සවස වැඳ පුදන්න අම්මා
දෙවියොත් සළකාවී හා හා..
හොරකම් මැරකම් එපා එපා
බොරු කීවෝතින් පව් සිදුවේවී
නංගී පොඩී හැම කාලෙදී
අයියා ගාවයි.
හිතන්නකෝ .......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - කරුණාරත්න අබේසේකර

උපදේශාත්මක ගී

හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මව්බිම ඉපදී ඉන්නේ
අත් පොඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරිලක් අම්මා//

හොරකම් මැරකම් නැතිව ලොවේ
සිටියොත් හොඳ නම නිතර ලැබේ
වැරදි කළොතින් පව් සිදු වේවී
සමාව නම් කිසි දිනෙක නැතේ
පොඩි ළමයින්හට දෙවියන්ගේ
ආශිර්වාදය මයි ඕනේ
අත් පොඩි ටික.......

අම්මාගෙන් කරුණාව සෙනේ
වීරිය දහිරිය පියතුමගේ
මේ හැම ලැබුණොත් එකවාගේ
මුළු ලෝකේම එයි අතට අපේ
පොඩි අයමයි ලොකු අය වෙන්නේ
කෝපය හින්දයි පොඩි වෙන්නේ
හිත තුල වෛරය නැති කරලා
ඉන්න ඕනේ හොඳ ළමයි වෙලා
අත් පොඩි ටික......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - විල්ෆ්‍රඩ් සිල්වා

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි. |
| නිපුණතා මට්ටම 3.2 | : | සම්භාව්‍ය සංගීත රසාස්වාදය හුරුවෙයි. |
| ක්‍රියාකාරකම 3.2.1 | : | බ්‍යාල් අසමු රස විඳිමු. |
| කාලය | : | කාලච්ඡේද 03 |

ගුණාත්මක යෙදවුම් :
- කැසට් යන්ත්‍රයක්, (චොටා, බ්‍යාල් ගායනයක් ඇතුළත් කැසට් පටයක්)
- සර්පිනාවක් /තාම්පුරාවක්
- තබ්ලාවක්
- ඇමුණුම 3.2.1.1 ගවේෂණ උපදෙස් පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.2.1.1
- බ්‍යාල් ගායනය ඇතුළත් කැසට් පටය සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.
- නැවතත් කොටස් වශයෙන් ( ආලාප, ස්ථායි, අන්තරා, තානාලංකාර) ආදී වශයෙන් ශ්‍රවණයට සලස්වන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - බ්‍යාල් ගායනයක විවිධ කොටස් ඇතිබව.
  - බ්‍යාල් ගීත හොඳින් රසවිඳීමට එහි ඇතුළත් අංග පිළිබඳ අවබෝධයක් තිබිය යුතු බව
  - බ්‍යාල් ගායනයේ දී යොදා ගන්නා නිශ්චිත සහාය වාද්‍ය භාණ්ඩයක් ඇති බව

( මිනිත්තු 40 යි)

පියවර 3.2.1.2
- ඇමුණුම 3.2.1.1. ට අයත් ගවේෂණ උපදෙස් පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සිසුන්ට එය කියවීමට අවස්ථාවක් දෙන්න.

(මිනිත්තු 40 යි)

පියවර 3.2.1.3
- නැවත බ්‍යාල් ගායනය ශ්‍රවණයට සලස්වන්න.
- ශ්‍රවණය අතරතුර වගුවේ හිස්තැන්වලට අදාළ තොරතුරු සැපයීමට උපදෙස් දෙන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බ්‍යාල් ගීතයක නිශ්චිත ආකෘතියක් ඇති බව
  - ඒ සඳහා විවිධ රාග භාවිත කරන බව

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- බ්‍යාල් ගායනයක ඇති කොටස් නම් කරයි.
- බ්‍යාල් ගායනයක ආකෘතිය පිළිබඳ විස්තර කරයි.
- සම්භාව්‍ය සංගීතය සරල සංගීතයට වඩා ගැඹුරු අදහස් ප්‍රකාශන මාධ්‍යයක් බව.
- සම්භාව්‍ය සංගීතය ශ්‍රවණය කිරීමට කැමැත්තක් දක්වයි.

ඇමුණුම 3.2.1.1

1 බ්‍යාල් ගායනයක ආකෘතියේ ඇතුළත් අංග
(ආලාප, ස්ථායි, මධ්‍යාලාප, අන්තරා, තානාලංකාර)

- ඉහත සඳහන් අංග ඇතුළත් ගායනය හොඳින් ශ්‍රවණය කරන්න.
- පහත සඳහන් වගුව ආශ්‍රයෙන් හිස්තැන්වලට සුදුසු වචනය තෝරා ලියන්න.

බ්‍යාල් ගායනය

| ස්වභාවය | විශේෂතා | ගායනා කරන අවස්ථාව | භාවිතා කරන නම |
|---|---|---|---|
| තාලයක් තැබිය නොහැකි ය. ආකාරයෙන් ගැයේ ස්වර ඇදී යන ස්වභාවයක් දනේ | • මන්ද්‍ර මධ්‍ය උච්ච ස්වර ඇසුරු කරයි.<br>• විවිධ ශිල්ප ක්‍රම භාවිත කරයි. | | |
| වචන භාවිත කරයි තාලාත්මකව ගයයි | • මන්ද්‍ර හා මධ්‍යස්වර ඇතුළත් ය. | | |
| ආකාරයෙන් ගයයි තාලය වාදනය වුවත් තාල පිහිටන ආකාරය සොයා ගැනීම අපහසු ය | • ස්ථායි සහ අන්තරා යන කොටස් දෙකේදීම භාවිතා කරයි | | |
| වචන භාවිතා කරයි තාලාත්මකව ගයයි | • ඉහළ ස්වරවලින් සමන්විතය. | | |
| තාලාත්මකයි දෘතලයෙන් ගයයි ආකාරයෙන් ගයයි. ස්වර වලින් ගයයි. | • ස්වර වේගවත් ව ගයයි.<br>• මන්ද්‍ර මධ්‍ය උච්ච ස්වර ඇසුරු කරයි. | | |

නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 3.2 : සම්භාව්‍ය සංගීත රසාස්වාදය හුරුවෙයි.

ක්‍රියාකාරකම 3.2.2 : තබ්ලාව වයමු රස විඳිමු

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- තබ්ලාවක්
- තබ්ලා වාදනයක මූලික කොටස් පමණක් ඇතුළත් සරල තබ්ලා වාදනයක් සහිත ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය පටයක්
- හංසරාජිනි ගීතය පටිගත කරන ලද ශ්‍රව්‍ය පටයක්
- ඇමුණුම 3.2.2.1 තබ්ලාවාදනයක කොටස් ඇතුළත් පත්‍රිකාව
- ඇමුණුම 3.2.2.2 ප්‍රශ්නාවලිය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.2.2.1
- හංසරාජිනි ගීතයේ කොටසක් සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- එහි තබ්ලාව වාදනය කරන ආකාරය පිළිබඳව සිසුන් ගෙන් අදහස් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - ශ්‍රවණය කරන ලද ගීතය සරල ශාසත්‍රීය ගීතයක් බව
  - ඒ සඳහා ත්‍රිතාලය වයන බව.
  - තබ්ලාව ඒකල වාද්‍ය භාණ්ඩයක් වශයෙන් ද යොදාගන්නා බව.

(මිනිත්තු 20 යි)

පියවර 3.2.2.2
- සපයාගත් ශාස්ත්‍රීය තබ්ලා වාදනය සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- සුවිශේෂ පද කොටස් පිළිබඳ සිසුන් විමසන්න.
- කොටසින් කොටස නැවත ශ්‍රවණයට සලස්වන්න.

(මිනිත්තු 40 යි)

පියවර 3.2.2..3
- ඇමුණුම 3.2.2.1 ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- තබ්ලා වාදනය ශ්‍රවණය කරන අතරතුර එම ලැයිස්තුවේ සඳහන් අංක තබ්ලා වාදනය තුල ඇත්නම් √ ලකුණු යෙදීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඇමුණුම 3.2.2.2 ප්‍රශ්නාවලිය සිසුන්ට යොමුකර පිළිතුරු සැපයීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - ඒකල තබ්ලා වාදනය ද, ස්වර වාද්‍ය භාණ්ඩයකින් කෙරෙන වාදනයක් මෙන්ම රසවිඳිය හැකි බව
  - ගායන වාදනවල දී ස්වරවලින් දක්වනු ලබන ශිල්පක්‍රම තබ්ලා වාදනයකදී විවිධ පද කොටස්වලින් දක්වන බව.
  - ලෙහෙරා වාදනය තාලයේ මාත්‍රා සංඛ්‍යාව මැන පෙන්වන බව.

(මිනිත්තු 60 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- තබ්ලාව අවනද්ධ පද වයන භාණ්ඩයක් බව පවසයි.
- තබ්ලා වාදනයකදී අවන්ද්ධ අක්ෂර ඇසුරින් පද වාදනය වන බව.
- තබ්ලාවේ විවිධ පද කොටස් හඳුනාගනියි.
- තබ්ලා වාදන ශ්‍රවණය කරයි.
- තබ්ලාව වාදනය කිරීමට කැමැත්තක් දක්වයි.

ඇමුණුම 3.2.2.1

කියවීමේ පත්‍රිකාව

තබ්ලා වාදනයක ඇතුළත් අංග

| | |
|---|---|
| ඨේකාව | තබ්ලා වාදනයට පදනම් වන්නා වූ තාලයේ තාල පදය ඨේකාවයි. මෙහිදී ඨේකාව කුඩා අලංකාර පද කොටස් යොදා වාදනය කරයි. |
| කායදා | - මූලික හස්ත සාධන අභ්‍යාස ඇතුළත් පද කොටස් ය. එක් කායදාවක් ආවර්ත 01 කට සීමාවේ. /ධාධාතිට/ ධාධාතූනා/ තා තා තිට/ ධා ධා තූ නා/(ත්‍රිතාල් කායදා) |
| පල්ටා | - මූලික හස්ත සාධන අභ්‍යාස සඳහා යොදා ගන්නා අලංකාර වලින් යුත් පද කොටසකි. |
| ගත් | - මෘදු අක්ෂරයන්ගෙන් බැඳුණු ආවර්ත 02 කට හෝ 03 කට සීමා වූ පද විශේෂයකි. |
| මුඛඩා | - මෘදු අක්ෂරවලින් ප්‍රබන්ධ වූ කෙටි අලංකාර පද විශේෂයකි. ආවර්ත 1 කට හෝ 02 කට සීමාවේ. |
| පරන් | - ආවර්ත 4 ක් හෝ ඊට වැඩි ගණනක් තිහායි සහිතව වාදනය වන ගාම්භිර පද විශේෂයකි. |
| තිහායි | - යම් කිසි පද විශේෂයක් තාලයේ සමග්‍රහයෙන් හෝ වෙනත් මාත්‍රාවකින් හෝ ආරම්භ කොට එය එකම අයුරකින් තෙවරක් වාදනය කෙරේ නම් ඒ තිහායි නම් වේ. අවසානයේ සමග්‍රහයට වැටේ. |
| ලෙහෙරා | - තබ්ලා වාදනය සඳහා පදනම් වූ තාලයේ ස්වර වාද්‍ය භාණ්ඩයක සහායෙන් තාලයේ නිශ්චිතව මාත්‍රා සංඛ්‍යාව අනුව යම් කිසි නාදමාලාවක් වාදනය කිරීම ලෙහෙරාවයි. පෙනෙන නිශ්චිතව මාත්‍රා සංඛ්‍යාව පෙනෙන පරිදි කිසියම් ස්වර වාද්‍ය භාණ්ඩයකින් (සර්පිනාව, සාරංගි, වයලීන්, එස්රාජ් ) රාගාශ්‍රිතව ප්‍රබන්ධ කොට වැයෙන සංගීතයයි. මෙම සංගීත ඛණ්ඩය තාලයේ සමග්‍රහය අවධාරණයෙන් පෙනෙන පරිදි ප්‍රබන්ධ කොට ඇත. |
| චක්‍රදාර් | - තිහායි සහිත වූ යම් කිසි පද කොටසක් තෙවරක් වාදනය කොට අන්තිම ධ අක්ෂරය සමග්‍රහයට පැමිණීම චක්‍රදාරය නම් වේ. |

ඇමුණුම 3.2.2.2

ප්‍රශ්නාවලිය

1 මෙම තබ්ලා වාදනය තුළ ඔබ වඩාත් සිත්ගත් අංගය කුමක් ද ?
2 ස්වර නොමැති වුවද අවනද්ධ අක්ෂර යොදාගනිමින් රිද්මය තාලය හා නාද රසය ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
3 ස්වර වාද්‍ය භාණ්ඩයක වාදනයට වඩා තබ්ලා වාදනයක ඇති සුවිශේෂ ලක්ෂණ මොනවාද?
4 තබ්ලා වාදනයෙහි නිපුණ ශිල්පියෙකු වීමට පුද්ගලයෙකු තුළ වැඩි දියුණු කරගත යුතු දක්ෂතාවයන් මොනවාද ?
5 මෙම වාදනයෙහි ඔබ වඩාත්ම කැමැත්තක් දක්වන කොටස පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 3.2 : සම්භාව්‍ය සංගීත රසාස්වාදයට හුරුවෙයි.

ක්‍රියාකාරකම 3.2.3 : '' තබ්ලාව හඳුනාගනිමු'

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :

- තබ්ලාවක්
- ඇමුණුම් අංක 3.2.3.1 වාදනයේ යෙදෙන ඉරියව්වෙන් යුත් තබ්ලා වාදකයෙකු ගේ පින්තූරයක්
- ඇමුණුම් අංක 3.2.3.2 තබ්ලාවක කොටස් විස්තර කරන ලද පත්‍රිකාව
- ඇමුණුම් 3.2.3.3 තබ්ලාවේ රූප සටහන
- ඇමුණුම් අංක 3.2.3.4 කියවීමේ පත්‍රිකාව
- ඇමුණුම් අංක 3.2.3.5 ප්‍රශ්නාවලිය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.2.3.1

- ඇමුණුම් අංක 3.2.3.1 තබ්ලාය වයන වාද්‍ය ශිල්පියකුගේ පින්තූරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- තබ්ලාවක් ඇත්නම් එය හෝ තබ්ලාවේ රූප සටහනක් ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

  - උත්තර භාරතීය සංගීත සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය බව.
  - තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩයක් බව
  - ගීත ගායනයේ දී සහාය වාද්‍ය භාණ්ඩයක් ලෙස ද යොදා ගන්නා බව
  - මෙම භාණ්ඩයේ කොටස් විවිධ නම්වලින් හඳුන්වන බව
  - කොටස් දෙකකින් යුත් තාල වාද්‍ය භාණ්ඩයක් බව.

( මිනිත්තු 10 යි)

පියවර 3.2.3.2

- ඇමුණුම 3.2.3.1 ට අයත් තබ්ලාවේ කොටස් විස්තර කරන ලද පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- සිසුන්ට එය කියවීමට අවස්ථාවක් දෙන්න.

(මිනිත්තු 15 යි)

පියවර 3.2.3.3

- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- කොටස් නම් කිරීමට සුදානම් කර ඇති තබ්ලාවේ රූප සටහන් කිහිපයක් ළමුන් අතර බෙදා දෙන්න.
- කියවීමේ පත්‍රිකාවේ අංක 1 සිට 6 දක්වා කොටස් නම් කිරීමට A කණ්ඩාමටත් 7 සිට 12 දක්වා කොටස් නම් කිරීමට B කණ්ඩායමටත් උපදෙස් දෙන්න.
- සාකච්ඡා කරමින් එම කාර්යයේ යෙදීමට සිසුන් මෙහෙයවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 3.2.3.4

- පන්තිය කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම 3.2.3.4 කියවීම් පත්‍රිකා 1.2.3 වශයෙන් කණ්ඩායම් තුනට යොමු කරන්න.
- කියවීමේ පත්‍රිකා කියවීමට අවස්ථාවක් දෙන්න.
- ඇමුණුම 3.2.3.5 ට අයත් ප්‍රශ්නාවලිය සිසුන්ට යොමු කරන්න.
- එක් කණ්ඩායමකට ප්‍රශ්න තුන බැගින් කෙටි පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් තුනේ පිළිතුරු හා තොරතුරු හුවමාරු කරගන්න.
- තබ්ලාව පිළිබඳ පුවත්පතකට සුදුසු විස්තරාත්මක ලිපියක් සකස් කිරීමට සිසුන්ට පැවරුමක් දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - තබ්ලාව ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියන තාල වාද්‍ය භාණ්ඩයක් බව
  - සරල හා ශාස්ත්‍රීය යන සංගීත ක්‍රම දෙකේදීම භාවිත කරන බව
  - භාරතීය සංගීත භාණ්ඩයක් වුවද ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය භාණ්ඩයක් බව

(මිනිත්තු 30 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- තබ්ලාවේ කොටස් නම් කරයි
- තබ්ලාව ඉතා අලංකාර පද වාදනය කළ හැකි භාණ්ඩයක් බව පිළිගනියි
- තබ්ලාවේ විවිධ අක්ෂර උපදින ස්ථාන හඳුනා ගනියි.
- තබ්ලා වාදකයින් පිළිබඳව තොරතුරු රැස් කරයි.
- තබ්ලා වාදනයට කැමැත්තක් දක්වයි.

ඇමුණුම 3.2.3.1

තබ්ලා වාදකයකුගේ පින්තූරයක්



උස්තාද් සකීර් හුසේන්




ඇමුණුම 3.2.3.2

තබ්ලාවේ කොටස්

| | | | |
|---|---|---|---|
| 1 | බායාව | - | වමතින් වාදනය කරන කොටසයි. |
| 2 | දායාව | - | දකුණතින් වාදනය කරන කොටසයි |
| 3 | කුංයී | - | බායාවේ කඳ කොටස මෙනමින් හඳුන්වයි |
| 4 | ලකඩි | - | දායාවේ කඳ කොටස මෙනමින් හඳුන්වයි ලීයෙන් නිමවා ඇත. |
| 5 | චාන්ටි | - | තබ්ලා මුහුණතෙහි කෙලවරේ ඇති සම් තීරුවයි |
| 6 | ස්‍යාහි | - | දායාවේ සහ බායාවේ මුහුණත මැද කලු පාටින් පිහිටි බදාමයක් වැනි කොටස |
| 7 | ලවය | - | ස්‍යාහි කොටස හා චාන්ටි කොටස අතර පිහිටි සම් තීරුවයි (දායාවේ සහ බායාවේ) |
| 8 | මෛදාන් | - | බායාවේ ස්‍යාහි කොටස හා චාන්ටිය අතර පිහිටි පළලින් වැඩි සම් තීරුවයි, වාදනය කිරීමේ දී වමතේ අල්ල ප්‍රදේශය මෙහි ගැටේ. |
| 9 | ගජරා | - | කුඩා හම්පටිවලින් ගෙතූ කොටසයි. දායාවේ සහ බායාවේ ගැටියයි. |
| 10 | ගුඩ්රි | - | බායාවේ හා දායාවේ අඩියේ පිහිටි සම් පටිවලින් ගෙතූ කොටසයි |
| 11 | බද්ධි | - | ගජරා හා ගුඩ්රි අතර ඇති සම්පටි මෙනමින් හැඳින්වේ. |
| 12 | ගට්ටා | - | දායාව සහ බායාව සුසර කිරීමේදී ඉහළ පහළ දමන කුඩා ලී කුට්ටි කැලි වේ. බද්ධි අතර රඳවා ඇත. |

ඇමුණුම 3.2.3.3

තබ්ලාවේ රූප සටහන



ඇමුණුම 3.2.3.4

කියවීමේ පත්‍රිකාව අංක 01

තබ්ලාව

තබ්ලාවේ නිර්මාතෘ වරයා ලෙස හැඳින්වෙන්නේ අමීර් ඛුෂ්රු පඬිතුමාය. පක්වාජය නමැති සංගීත භාණ්ඩය ඇසුරින් තබ්ලාව නිර්මාණය කළ බව කියැවේ. ඉන්දීය සංගීත භාණ්ඩයක් වූ මේ භාණ්ඩය වාදනය කරන ගුරුකුල කීපයක්ම ඇත. ඒවා ඝරානා යනුවෙන් හැඳින්වේ.

කියවීමේ පත්‍රිකාව අංක 2

තබ්ලාවේ ව්‍යුහය

තබ්ලාව කොටස් දෙකකි. එය බායාව සහ දායාව ලෙස හැඳින්වේ. බායාව ලෝහයෙන් නිමවා ඇති අතර දායාව නිමවා ඇත්තේ දැවයෙනි. මෙම කොටස් දෙකම කුහර සහිතය. මෙම කොටස් දෙකෙහි ම මුහුණත එළු හමක් යොදා නිමවා ඇත. කුහරයක් සහිතව ඇති නිසා තදින් ඇදුනු සමක් යෙදීමෙන් එයින් හඬ නිකුත්වේ. එහි මුහුණත කොටස් කිහිපයකින් සමන්විතය. (චාන්ටි,ලවය, ස්‍යාහි ආදී වශයෙනි) ඒ එක් එක් කොටසින් නිකුත්වන අක්ෂර/නාද වෙනස් ය. දායාවේ කඳ කොටස නිර්මාණය සඳහා කොස්, කොහොඹ, ඇහැළ වැනි දැවයක් යොදාගනී. මෙහි මුහුණතේ විෂ්කම්භය අඟල් 5 1/2 ක් 6 1/2 ආදී වශයෙන් නිමවා ඇත.

කියවීමේ පත්‍රිකාව අංක 03

තබ්ලාවේ භාවිතය.

තබ්ලාව විවිධ සංගීතාංග සඳහා භාවිත කරයි. ඒකල වාදන ඉදිරිපත් කිරීම මෙන්ම ශාස්ත්‍රීය ගායන වාදන සඳහා ද සහාය තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස තබ්ලාව භාවිතා කරයි. එසේ ම සරල සංගීතයේ දී එකසේ භාවිත කරයි. තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩයක් බැවින් සරල සංගීතයේ දී වාදක මණ්ඩලයක් සඳහා බොහෝ විට එක් තබ්ලාවක් හෝ දෙකක් පමණක් යොදා ගනී. තබ්ලා දායා කිහිපයක් යොදාගෙන විවිධ ශ්‍රැතිවලට සුසර කරගැනීමෙන් තබ්ලා තරංගයක් නිමවාගත හැක. සරල සංගීතයේදී මුහුණතෙහි විෂ්කම්භයෙන් අඩු දායාවක් යොදාගනී. ශාස්ත්‍රීය තබ්ලාවාදනවලදී මධ්‍යම ප්‍රමාණයේ දායාවක් බොහෝවිට යොදාගනී. ශාස්ත්‍රීය තබ්ලා වාදනයක දී විවිධ පද වර්ග යොදා ගනී.

ඇමුණුම 3.2.3.5

ප්‍රශ්නාවලිය

1. තබ්ලාවේ නිර්මාතෘවරයා කවු ද?
2. තබ්ලාව නිමැවීමට පදනම් වූ භාණ්ඩය කුමක් ද ?
3. තබ්ලාවේ කොටස් දෙක නම් කරන්න.
4. තබ්ලාවේ දායා කොටස නිර්මාණයට යොදා ගන්නා දැව වර්ගයක් නම් කරන්න.
5. තබ්ලාව සඳහා යොදා ගන්නා සම් වර්ග මොනවා ද ?
6. තබ්ලාව භාවිත කරන විවිධ අවස්ථා නම් කරන්න.
7. තබ්ලාව යොදාගෙන ඇති සරල ශාස්ත්‍රීය ගීතයක් නම් කරන්න.
8. භාරතීය ප්‍රවීණ තබ්ලා වාදකයෙකු නම් කරන්න.
9. අප රටේ ප්‍රවීණ තබ්ලා වාද්‍ය ශිල්පීන් තුන් දෙනෙක් නම් කරන්න.

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 4.1 : මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

ක්‍රියාකාරකම 4.1.1 : වන්නම්, ප්‍රශස්ති, පිළිබඳ තොරතුරු විමසමු.
කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.1.1. හි දැක්වෙන දෘශ්‍ය උපකරණය
- ඇමුණුම 4.1.1.2 ට අදාල ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- ඇමුණුම අංක 01 සහ අංක 02 කියවීම් පත්‍රිකාවල පිටපත්
- ඇමුණුම 4.1.1.3 දෘශ්‍ය උපකරණයේ පිටපත්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1.1
- ඇමුණුම 4.1.1. ට අදාළ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න. මහනුවර යුගය පිළිබඳ තොරතුරු සිසුන්ගෙන් ලබා ගැනීමට දෘශ්‍ය උපකරණ යොදා ගන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - මහනුවර යුගය සංස්කෘතික වශයෙන් වෙනස්කම් රාශියකට භාජනය වී ඇති බව
  - රජවාසල ආශ්‍රිතව කවිකාර මඩුව නමින් ගායන /වාදන පැවැත්වීමට විශේෂිත ස්ථානයක් තිබූ බව
  - එය කේන්ද්‍ර කොට ගෙන විවිධ ගායනා රාශියක් එම යුගයේ බිහි වූ බව

( මිනිත්තු 20 යි)

පියවර 4.1.1.2
- පන්තිය කුඩා කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ඇමුණුම අංක 1 සහ 2 කියවීම් පත්‍රිකාවල පිටපත් ඇමුණුම් අංක 4.1.1.2 ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් ඇමුණුම් අංක 4.1.1.3 දෘශ්‍ය උපකරණයේ පිටපත් .
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් කරවන්න.

(විනාඩි 90 යි )

පියවර 4.1.1.3
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - ගී වර්ග දෙකම සේගී ගණයට අයත්වන බව
  - කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබී ඇති බව
  - කවිකාර මඩුව ආශ්‍රිතව ගීත නිර්මාණය වී ඇති බව
  - දකුණු ඉන්දියානු සංගීතඥයින්ගේ දායකත්වය ලැබී ඇති බව
  - මහනුවර යුගයේ ප්‍රචලිත වී ඇති ගී වර්ග දෙකක් බව
  - වන්නම්වල සරලනාදමාලා හා ප්‍රශස්තිවල සංකීර්ණ නාදමාලා යෙදී ඇති බව.

- ප්‍රශස්ති රජවරුන්ගේ හා ප්‍රභූන්ගේ ගුණ වර්ණනා කිරීමට යොදාගත් ගීත විශේෂයක් බව
- වන්නම් රචනයේ දී විවිධ වස්තු බීජ පදනම් වී ඇති බව
- ප්‍රශස්ති ගී පද තුළ විවිධ භාණ්ඩ සංකලනයන් අන්තර්ගතව ඇති බව.
- ප්‍රචලිත උඩරට වන්නම් 18 ක් ඇති බව
- විවිධ අවනද්ධ භාණ්ඩ ගී වර්ග දෙකටම යෙදා ගෙන ඇති බව

(මිනිත්තු 50 යි)


තක්සේර හා ඇගයීම් නිර්ණායක

- වන්නම් හා ප්‍රශස්ති සේගී විශේෂයක් බව ප්‍රකාශ කරයි.
- වන්නම් හා ප්‍රශස්තිවල සුවිශේෂ ලක්ෂණ වගු ගත කරයි.
- වන්නම් හා ප්‍රශස්ති ගීතවල සංස්කෘතික පසුබිම අගය කරයි.
- ජාතික සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගැනීමට උදාර හැගුමෙන් ඉදිරිපත් වෙයි.
- වන්නම් හා ප්‍රශස්තිවල සංස්කෘතික තොරතුරු සංසන්දනය කරයි.

ගුරුවරයාට උපදෙස් -


- සිසුන් සඳහා දෙනු ලබන ගවේෂණ උපදෙස් පත්‍රිකා බෙදා දී කියවීම් පත්‍රිකා දෙක අධ්‍යයනය කර වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. ඊට පසු ඇමුණුම 4.1.1.3 දෘශ්‍ය උපකරණය සිසුන්ට බෙදා දී හිස්තැනට අදාළ වන්නම්වල නම් ලිවීමට උපදෙස් දෙන්න.

ඇමුණුම 4.1.1.1





දළදා මාලිගාව





ඇමුණුම 4.1.1.2

- ඇමුණුම අංක 1 සහ අංක 2 යන කියවීම් පත්‍රිකා කියවා අවබෝධ කරගන්න.
- ඒ අනුව පහත දැක්වෙන 1 හා 11 තොරතුරු ඇතුළත් වගු සම්පූර්ණ කරන්න.
- ඇමුණුම අංක 4.1.1.3 දෘශ්‍ය උපකරණයට අදාළ හිස්තැන් පුරවන්න.
- සපයනු ලබන ඩිමයි කොළ, මාකර් පෑන් මේ සඳහා යොදාගන්න.

වන්නම් පිළිබඳ තොරතුරු ආකෘතිය

1

| වන්නම් සඳහා නිර්වචනයක් | ආරම්භය | ලබා ඇති සංගීත ආභාෂය/ භාෂාව | යොදාගත් සංගීත භාණ්ඩ | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|
| | | | | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. |

| ප්‍රශස්ති සඳහා නිර්වචනයක් | ආරම්භය | ලබා ඇති සංගීත ආභාෂය/ භාෂාව | යොදාගත් සංගීත භාණ්ඩ | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|
| | | | | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. |

- ක්‍රියාකාරකම අවසන් වූවාට පසුව තම කණ්ඩායම් එක්වී පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම අංක 01

- කෙටි විස්තර ඇතුළත් කියවීම් පත්‍රිකාව

වන්නම්

උඩරට ශාස්ත්‍රීය නැටුම්වලදී ගායනා කරනු ලබන ගීත විශේෂයකට වන්නම් යයි කියනු ලැබේ. මෙහි අර්ථය වර්ණනාව යනුයි. මෙම ගීත කර්ණාටක සංගීතයෙන් පෝෂණය වී ඇත. මහනුවර යුගයේ සිටි ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේදී වන්නම් නිර්මාණ කිරීම ආරම්භවී ප්‍රචලිත විය. කේරළයේ සිට පැමිණි ගණිතාලංකාර නමැති සංගීතඥයා කවිකාරමඩුවේ සේවය කර ඇත. මෙම සංගීතඥයා වන්නම් වලට තනු සපයා ඇත. වන්නම් නර්තනයත් සමග ගායනය කළ හැකි ප්‍රාසංගික නිර්මාණයකි. සේ ගී ගණයට අයත් වේ. ප්‍රචලිත උඩරට වන්නම් ගණන 18 කි. ගජගා, හනුමා උකුසා, මයුරා සිංහරාජ, තුරඟා එම වන්නම්වලින් කිහිපයකි. වන්නමක ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ තනුව අනුව ගැයෙන තානමයි. සරල නාදමාලා යෙදේ. සිංහල හා ද්‍රවිඩ වචන භාවිතවේ. විවිධ තාලරූප මත ප්‍රබන්ධ වී ඇති. උඩරට වන්නම් සහ ගැටබෙරය හා තාලම්පට භාවිතවේ. උඩරට වන්නම් බෙර පදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව ආදී කොටස්වලින් සමන්විත ය.

ඇමුණුම අංක 2

ප්‍රශස්ති


රජවරුන්ගේ හා ප්‍රභූන්ගේ ගුණ ප්‍රශංසා මුඛයෙන් වර්ණනා කිරීම සඳහා ගයන ලද ගීත ප්‍රශස්ති ගී වේ. සේගී ගණයට අයත්වේ. මෙම ගීතවලට දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබී ඇත. කෝට්ටේ යුගයේ ආරම්භ වී මහනුවර යුගයේ ප්‍රචලිත වූ ගීත විශේෂයකි. ප්‍රසංගාත්මක බව හා අතිශයෝක්තියෙන් කළ වර්ණනාත්මක ස්වරූපයක් ඇත. බස සංකීර්ණය. ද්‍රවිඩ, තෙලිඟු ,මලයාලි, සංස්කෘත හා සිංහල යන භාෂාවල මිශ්‍රණයක් ඇත. මහනුවර යුගයේ කවිකාරමඩුව ආශ්‍රිතව ගොඩනැගුණ ගීත විශේෂයකි. රජවාසලේදී මෙම ගීත ගැයුවන් හඳුන්වා ඇත්තේ ' වන්දිභට්ටයින්' ලෙසය. ' මුද්‍රප්පදය' නම් විශේෂ කොටසක් සමහර ගීතවල අන්තර්ගතව ඇත. අර්ථරසයට වඩා ශබ්දරසයට විශේෂ තැනක් හිමිවේ. ශ්‍රී නාමය, ශෘංගාරය, පවන, රාජසිංහ වර්ණනාව, පැරකුම්බා සිරිත ප්‍රශස්ති ගීත ඇතුළත් ග්‍රන්ථවේ. ප්‍රශස්ති ගීත සඳහා ගණිතාලංකාර නම් සංගීතඥයා ද තනු සපයා ඇත. පන්තේරු, රබන්, උඩැක්කි, තාලම්පට, බෙර, දවුල්, තම්මැට්ටම් වැනි සංගීත භාණ්ඩ යොදාගෙන ඇත. ගීත තුළ බෙර පදද ඇතුළත් කර ඇත. එම බෙර පද තනුවට අනුව ගායනය කෙරේ.

රජුගේ තේජස, ශ්‍රී විභූතිය, විශ්ෂයතා, රාජකීය ගුණාංග යුධමය හා පාලන ශක්තියෙන් වර්ණනා කරමින් ගී පද රචනා කොට ඇත.

ඇමුණුම 4.1.1.4

වරහන් තුළ ඇති වචන යොදාගෙන පහත සඳහන් රූප සටහන්වල ඇති හිස් තැන් පුරවන්න.
(හනුමා, සැවුලා, මුසලඩි, තුරඟා, සිංහරාජ, මයුරා, කිරලා, ගජගා, නෛයඩි)






..................... වන්නම


..................... වන්නම






..................... වන්නම

..................... වන්නම





..................... වන්නම

..................... වන්නම



. .................... වන්නම



.................... වන්නම



.................... වන්නම

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 4.1 : මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

ක්‍රියාකාරකම 4.1.2 : උකුසා වන්නම ගයමු

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.2.1. හි අදාළ ගීතය පටිගත කළ කැසට් පටයක් විශාරද නන්දාමාලනී ශිල්පිනියගේ රැක් අත්තන මල මුදුනේ ගීතය
- ඇමුණුම 4.1.2.3 ට ඇතුළත් වන්නම් ලියන ලද දෘශ්‍ය උපකරණය
- ඇමුණුම 4.1.2.2 ඇතුළත් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට, කැසට් යන්ත්‍රයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.2.1
- ඇමුණුම 4.1.2.1. ට අදාළ ගීතය ඇතුළත් කැසට් පටිය ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයේ තනුව පිළිබඳව විමසන්න.
- නැවත ශ්‍රවණයට යොමු කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - සරල ගීතවල තනු නිර්මාණය සඳහා ජන සංගීතයේ ආභාෂය ලබා ඇති බව
    - දේශීය අවනද්ධ භාණ්ඩද යොදාගෙන ඇති බව
    - ගීතයේ නාදමාලාව වන්නම් නාදමාලාවන්ට සමීප වන බව

( මිනිත්තු 20 යි)

පියවර 4.1.2.2
- ඇමුණුම 4.1.2.3 ඇතුළත් උකුසාවන්නම ලියනලද දෘශ්‍ය උපකරණය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා විසින් උකුසා වන්නමේ තානම ගායනය කරන්න.
- තානමේ නාදමාලාව තහවුරු වනතෙක් කිහිපවරක් ගායනය කරන්න.
- තානම ගැයූ නාදමාලාව අනුව කවි ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පියවරෙන් පියවර කවි පද ගායනය කරන්න.
- තානමේ ස්වර ප්‍රස්තාරය කිහිපවරක් ගායනය කරවන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදා ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- උකුසා වන්නමේ පදමාලාවේ අදහස ලිවීමට කණ්ඩායම් සූදානම් කරන්න.
- උකුසා වන්නමට ඇතුළත් කවි වලින් සිසුන් කැමැති කවියක් ගැයෙන තිත අනුව ප්‍රස්තාර කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- වන්නම ගැයෙන තිතට අදාළ බෙරපදයක් ප්‍රස්තාර කර , තාලවාදනයට යොදා ගන්නා අවනද්ධ භාණ්ඩයේ රූප සටහනක් ඇඳීමට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- අභ්‍යාස පොත්වල වන්නම ලියාගැනීමට සලස්වන්න.

(විනාඩි 90 යි )

පියවර 4.1.2.3

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

  - උකුසා වන්නම මාත්‍රා 4 න් 4 ට තාලයට ගැයෙන බව.
  - එය දේශීය තාල සම්ප්‍රදායේ මහ තනිතිතට අනුව ගැයෙන බව
  - තානමේ නාදමාලාව අනුවම කවි ගායනය වන බව
  - උඩරට නර්තන සම්ප්‍රදායෙහි එන වන්නමක් බව
  - උකුස්සෙකුගේ චර්යා රටා වන්නමෙන් විස්තර වන බව
  - තාල වාදනය සඳහා ගැටබෙරය යොදා ගන්නා බව
  - ගායනය හා බෙරවාදනයට අනුව නර්තනයේ යෙදෙන බව
  - තානම ගායනයට හා නර්තනයට අලංකාරයක් වී ඇති බව


(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- උඩරට සම්ප්‍රදායේ එන උකුසාවන්නමේ විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් විස්තර කරයි.
- අපගේ අනන්‍යතා පළ කරන දේශිය සංස්කෘතික අංගයක් ලෙස සාඩම්බර හැඟුමෙන් පිළි ගනියි.
- උකුසා වන්නම ගායනය කරයි.
- ප්‍රශංසාත්මකව ගීත විශේෂයක් ලෙස නර්තනයත් සමඟ විශේෂ අවස්ථාවන්හිදී ගායනය කිරීමට යෝජනා කරයි.
- උඩරට වන්නම් ගීත ලැයිස්තුවක් සකස් කරයි.

ඇමුණුම 4.1.2.1

රුක් අත්තන මල මුදුනේ




පතොක් වැටිය කොටස 'මුතු පිණි දල් ' කොටසෙහි තනුව අනුව ගැයේ.

පතොක් වැටිය උඩින් ඇඳී
දිවයුරු මියයන මොහොතේ
පුරා හඳක් සේ ඇතින්
කවුරුද එන්නේ
පුතුනි බලන් යොමා නුවන්
කවුරුද එන්නේ.

ඇමුණුම 4.1.2.2

ගවේෂණ උපදෙස් පත්‍රිකාව


උකුසා වන්නම ගයමු.

- ඔබ කණ්ඩායාමට ලැබී ඇති උපදෙස් පත්‍රිකාව හොඳින් කියවා අවබෝධ කරගන්න.
- උකුසා වන්නමේ තානම හා කවියක් කණ්ඩායම් වශයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
- උකුසා වන්නමේ පදමාලවේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.
- වන්නමේ එන ඔබ කැමති කවියක් ගැයෙන තිත අනුව ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
- වන්නම ගැයෙන තිතට අදාළ බෙර පදයක් ප්‍රස්තාර කර, තාල වාදනයට යොදාගන්නා අවනද්ධ භාණ්ඩයේ රූප සටහනක් අඳින්න.
- ක්‍රියාකාරකම අවසන්වූවාට පසු තම කණ්ඩායම් එක්වී පන්තියට ඉදිරිපත් කරන්න.
- උකුසා වන්නමේ ගීත ස්වර ප්‍රස්තාරය අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

ඇමුණුම 4.1.2.3

උකුසා වන්නම

තානම - / / / /



කවිය

මෝරා බීජයෙනා//
කලපත් දෙකඩත් කරසිත් තුටුවෙත් //
දෙන්නා අදර තොසා

නැරා තටුපතිනා //
ලෙලවත් සොලවත් පියඹන් නදදෙත් //
යන්නා පවන රුසා

සාරා බොජුනයෙනා //
අයිරන් පෙතියෙන් තුඩගත් බුදිසිත් //
පැන්නා එජල රුසා

බේරා ඉසිහු දුනා //
පවසත් මෙපවත්, දූනසත් ලොවටත් //
වන්නා නම් උකුසා

/ / /

බෙරපදය - /දොදොම්දො / මිතදොම්/ දොම්කිත / කිතදොම්/

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 4.1 : මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

ක්‍රියාකාරකම 4.1.3 : නෛයඩි වන්නම ගයමු.
කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.3.1. හි අදාළ දෘශ්‍ය උපකරණය
- ඇමුණුම 4.1.3.2 අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට
- ඇමුණුම අංක 4.1.3.3 ඇතුළත් වන්නම ලියන ලද දෘශ්‍ය උපකරණය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.3.1
- ඇමුණුම 4.1.3.1. ට අදාළ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- මේ පිළිබඳව සිසුන්ගේ අදහස් විමසන්න.
- නැවත ශ්‍රවණයට යොමු කරන්න.
- පහත දැක්වෙන කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • සතෙකුගේ නම පාදක කරගෙන නිර්මාණය වී ඇති බව<br>• නයාගේ විවිධ චර්යා රටා ප්‍රදර්ශනය වන බව |

( මිනිත්තු 20 යි)

පියවර 4.1.3.2
- ඇමුණුම 4.1.3.3 ඇතුළත් නෛයඩි වන්නම ලියනලද දෘශ්‍ය උපකරණය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා විසින් නෛයඩි වන්නමේ තානම ගායනය කරන්න.
- තානමේ නාදමාලාව තහවුරු වනතෙක් කිහිපවරක් ගායනය කරන්න.
- තානම ගැයූ නාදමාලාව අනුව කවි ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පියවරෙන් පියවර කවි පාද ගායනය කරවන්න.
- තානමේ ස්වර ප්‍රස්තාරය කිහිපවරක් ගායනය කරවන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදා ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- නෛයඩි වන්නමට ඇතුළත් කවිවලින් සිසුන් කැමති කවියක් ප්‍රස්තාර කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- රංගනයේ යෙදීමට කැමැත්තක් දක්වන සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(විනාඩි 40 යි )

පියවර 4.1.2.3
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.

- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - සත්වයෙකුගේ චර්යා රටාවන් අපූර්වත්වයකින් විදහා දක්වන බව.
  - මාත්‍රා 3 මාත්‍රා 4 වශයෙන් තාල බෙදෙන බව
  - එම තාලය මැදුම් මහ දෙතිතට අයත් වන බව
  - උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නමක් බව
  - නර්තන සම්ප්‍රදායට අයත් තාල වාදනය සඳහා ගැටබෙරය යොදාගන්නා බව
  - වන්නම් ගයමින් නර්තනයේ යෙදෙන බව
  - තානමේ නාදමාලාවට අනුව ම කවි ගායනය වන බව
  - තාල සංකේත දෙකක් භාවිතවන බව

(මිනිත්තු 20 යි)

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- උඩරට සම්ප්‍රදායේ එන නෛයඩි වන්නමේ විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් විස්තර කරයි.
- වන්නම් ගායනය කරමින් නර්තනයේ යෙදීම තුළින් ප්‍රසංගාත්මක බව පිළිඹිබු වන බව පිළිගනියි.
- නෛයඩි වන්නම ස්වර ප්‍රස්තාරය සමඟ ගායනය කරයි.
- විශේෂ අවස්ථාවන් සඳහා ගායනයත් සමග රංගනයේ යෙදීමට කැමැත්තක් දක්වයි.
- උඩරට වන්නම් ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.

ඇමුණුම 4.1.3.1



ඇමුණුම 4.1.3.2

ගවේෂණ උපදෙස් පත්‍රිකාව

නෛයඩිවන්නම

- ඔබ කණ්ඩායමට ලැබී ඇති උපදෙස් පත්‍රිකාව හොඳින් කියවා අවබෝධ කරගන්න.
- ගුරුවරයා ඉගැන්වූ නෛයඩි වන්නම කණ්ඩායම් වශයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
- නෛයඩි වන්නමේ ගීත ස්වර ප්‍රස්තාරය අභ්‍යාස පොතේ ලියාගන්න.
- ඉන් ඔබ කැමති කවියක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න
- නෛයඩි වන්නමේ පදමාලාවේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.
- කණ්ඩායම කවි ගායනයේ යෙදෙන විට, කැමති සිසුන් ඊට අදාළ රංගනයක් ඉදිරිපත් කරන්න.
- ක්‍රියාකාරකම අවසන් වූ පසු තම කණ්ඩායමට එක්වී පන්තියට ඉදිරිපත් කරන්න

ඇමුණුම 4.1.3.3.

## නෛයඩිවන්නම

### මැදුම් මහ දෙතිත

තානම

| ∧ | / | ∧ | / |
|---|---|---|---|
| ස ස – | ප – ප – | ප – – | ධ – ප – |
| තෙ ඕ ऽ | තෙ ऽ තෙ ऽ | ත ඕ ऽ | තෙ ऽ තෙ ऽ |
| ම ම – | ප – ම – | ග රි – | ස රි ස නි |
| ත ඕ ऽ | තෙ ऽ තෙ ऽ | නා ऽ ऽ | නා ऽ ऽ ऽ |
| ස රි – | ග – රි – | ග ග – | ම – ම – |
| තෙ ත ऽ | නා ऽ තෙ ऽ | ත ඕ ऽ | තෙ ऽ තෙ ऽ |
| ග රි – | ග – රි – | ස – – | ස – – – |
| ත ඕ ऽ | තෙ ऽ තෙ ऽ | නා ऽ ऽ | නා ऽ ऽ ऽ |

කවිය

ඉපිද එබෝසත් නා ලොව වාරෙක
පැහැද රකිති සිල් නරලොව වනයෙක
බොවද දෙමින් අල්ලා අහිගුණ්ඨික
පැසද ලමින් නටවා දුක් දී නෙක

අන්දමකින් ඉද පෙනය නගායේ
සන්දම මෙන් දහැඩින් වකලායේ
රන්දම මෙන් ගත වටින් දිටීයේ
පන්දම ලෙස දණ දී නටවායේ

බෝකොළ අන්දම් පෙනය නගායේ
නා කොළ අන්දම් පෙනහකුලායේ
ලෝතුළ රන්දම් සිරිනි දිගායේ
ඒ කුල සතරක් පෙරසිට ආයේ

දිගා සිරුර කොටසක් හකුලා මුඩි
නගාගතය ලෙලවා කරමින් දැඩි
රඟා සිරින් පිඹිමින් නදයෙන් වැඩි
වහා අසන් මෙම වන්නම නෛයඩි

බෙරපදය

∧ / ∧ /
දො ං දො / ජි ං ජි ං/ ත ක ට / දො ං ත ක

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 4.1 : මහනුවර යුගය හා සම්න්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

ක්‍රියාකාරකම 4.1.4 : ප්‍රශස්ති ගීයෙන් එදා රාජසභාව වර්ණවත් වූ සැටි දකිමු.
කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.4.1 හි දැක්වෙන ගීත පටිගත කළ කැසට් පටයක් (විශාරද එඩ්වඩ් ජයකොඩිගේ 'තෙදිනි විරාජ රුවිනි විරාජ' ගීතය හෝ විශාරද සුදත් සමරසිංහගේ විජය තුමා තම්මැන්නේ ගීතය)
- ඇමුණුම 4.1.4.2 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 4.1.4.3 ඇතුළත් ප්‍රශස්ති ගීතය ලියන ලද දෘශ්‍ය උපකරණය
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට, වයලීනය, කැසට් යන්ත්‍රය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.4.1
- ඇමුණුම 4.1.4.1 ට අදාළ ගීත ඇතුළත් කැසට් පට ශ්‍රවණයට සලස්වන්න.
- එම ගී තනු පිළිබඳව විමසන්න.
- නැවත ශ්‍රවණයට යොමු කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

  - සරල ගී තනු නිර්මාණය සඳහා ජන සංගීතය යොදා ගෙන ඇති බව
  - දේශීය අවනද්ධ භාණ්ඩ වාදනය වන බව
  - විවිධ රිද්ම රටාවන් යොදාගෙන ගීතය නිර්මාණය වී ඇති බව
  - ගීතයේ නාදමාලාව ප්‍රශස්ති ගී නාදමාලාවන් ආශ්‍රිත ව නිර්මාණය වී ඇති බව.

( මිනිත්තු 20 යි)

පියවර 4.1.4.2
- ඇමුණුම අංක 4.1.4.3 ට ඇතුළත් ප්‍රශස්ති ගීත ලියන ලද දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කරන්න.
- අංක 1 2 සහ 3 වශයෙන් පෙන්වා ඇති දෘශ්‍ය උපකරණවල එන ගීත ගුරුවරයා විසින් ගායනය කර පෙන්වන්න.
- සිසුන් කිහිපවරක් ගායනයෙහි යොදවන්න.
- පියවරෙන්, පියවර නාදමාලාව තහවුරු වනතෙක් කවි ගායනය කරවන්න.
- ගීතවල ස්වර ප්‍රස්තාර කිහිපවරක් ගායනය කරවන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදා කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- ගුරුවරයා ඉගැන්වූ ප්‍රශස්ති ගීතයක එක් කවියක් ගීත ස්වර ප්‍රස්තාර කරවන්න.
- ප්‍රශස්ති සඳහා භාවිත කළ අවනද්ධ භාණ්ඩ ලැයිස්තුවක් සකස් කර ඒවායේ රූප සටහන් ඇඳීමට අවස්ථාව ලබාදෙන්න.
- ඔබ ඉගෙන ගත් ප්‍රශස්ති ගීතයට බෙරපදයක් ප්‍රස්තාර කරවන්න.
- ගීත අභ්‍යාස පොතේ ලියා ගැනීමට සලස්වන්න.

( මිනිත්තු 40 යි)

පියවර 4.1.4.3

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • රජවරුන්ගේ ගුණ වර්ණනා කිරීමට ගයන ගීත විශේෂයක් බව<br>• කවිකාරමඩුවේ ගායනය කළ ගීත බව<br>• යොදාගත් අවනද්ධ භාණ්ඩ වලින් ගීතවල ගති ලක්ෂණ උද්දීපනය වන බව<br>• බෙරපද ගීත අලංකාර කිරීම සඳහා ඇතුළත් වී ඇති බව<br>• බස සංකීර්ණ බව |

(මිනිත්තු 20 යි)

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- මහනුවර යුගය හා සම්බන්ධ ප්‍රශස්ති ගීතවල ලක්ෂණ විස්තර කරයි.
- ප්‍රසංගාත්මක බව පිලිබිඹු වන ගීත විශේෂයක් බව පිළිගනියි.
- ප්‍රශස්ති ගීතයක් ගායනය කරයි.
- ප්‍රසංග අවස්ථාවන්හිදී ප්‍රශස්ති ගීත රංගනය සමග ගායනය කිරීමට සූදානමක් ඇති කර ගනියි.
- පොත්පත් පරිශීලනය කර ප්‍රශස්ති ගීත එක්රැස් කරයි.

ඇමුණුම 4.1.1.1


- තෙදිනි විරාජ -

තෙදිනි විරාජ රුවිනි විරාජ
රුහුණු සුරාජ කඳ දෙව් රාජ //

ඒ රන් මයුර වාහනයෙන්
රුපු සුන් බිඳ වැඩමවන්න
වැඩ හිටි කඳු මත වැඩ සිට
නර කැල වෙත සෙත සදන්න
කතරගමේ බල මහිමේ
දියත පතල කර හරින්න

අණ විණ වස් දොස් තුන් බිය
දුරලා සත රැක දෙවන්න
මැණික් ගඟේ නිමල දියෙන්
කිළිකුණු සෝදා හරින්න
කතරගමේ බල මහිමේ
දියත පතළ කර හරින්න

ගී පද - මහාචාර්ය සුනිල් ආරියරත්න
සංගීතය - ශ්‍රේෂන් ආනන්ද
ගායනය - විශාරද එඩ්වඩ් ජයකොඩි


4/4 EMINOR
INTRO.
VERSE

විජයතුමා තම්මැන්නේ -

විජය තුමා තම්මැන් නේ
පිරිවර සෙන් සමඟින් නේ
සිටි සැටි දැන් සිහි වෙන් නේ
මගේ පුතා නැළවෙන් නේ

අත්තනගලු වනයේ දී
මගියකු හට හිස දැන් දී
බුදු බව සැතු සඟබෝ දී
සිහි කරපන් සිත පෑ දී

ලොම් මාගම් පුර පව රා
අප මහ නා දෙරණිසු රා
මාගම රජ පරම්ප රා
ඇති කොට විසුවේ එව රා

තවුසෙකු සේ ඇඳ පැළ ඳා
පඬුවස් දෙවි මහනිරි ඳා
මාකඳුරින් ගොඩබට ඳා
මඟුලක් වී ලක මුළු ඳා


ගොස් දඹදිව් තලෙහි සි ටී
පෙර අප සිහලෙකු බුහු ටී
මුණී කෙසදා ගෙනා සැ ටී
උඹටත් දැන ගන්ට ව ටී

දනන් කෙරෙන් මෙ ලක දිවේ
පළමුව බොදු බැති වූ වේ
අප පියතිස් නරනිඳු වේ
ඉගෙන ගනිනි මගේ දූ වේ

දෙන දිවි මුත් රට වෙනුවෙ න්
ජාතික දරුවන් ලැබුවෙ න්
මිදී නොයෙක් සතුරු මුවෙ න්
ලක් මව් විසුවාය සුවෙ න්

ගී පද - ටිබෙට් ජාතික එස් මහින්ද හිමි
( දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල කාව්‍ය )
සංගීතය/ ගායනය - විශාරද සුදත් සමරසිංහ

විජය තුමා තැම්මැන්නේ - ගීත ප්‍රස්තාරය



ඇමුණුම 4.1.1.2


- ඔබ කණ්ඩායමට ලැබී ඇති කාර්ය පත්‍රිකාව හොඳින් කියවන්න.
- ගුරුවරයා ඉගැන්වූ ප්‍රශස්ති ගීත කණ්ඩායම් වශයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉන් ඔබ කැමති ප්‍රශස්ති ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
- ප්‍රශස්ති ගීත සඳහා යොදාගන්නා ලද අවනද්ධ භාණ්ඩ ලැයිස්තුවක් සකස් කරන්න.
- එම ලැයිස්තුවට ඇතුළත් අවනද්ධ භාණ්ඩවල රූප සටහන් අඳින්න.
- ඔබ ඉගෙනගත් ප්‍රශස්ති ගීතයට අදාළවන බෙරපදයක් ප්‍රස්තාර කරන්න.
- ගුරුවරයා ඉගැන්වූ ප්‍රශස්ති ගීත අභ්‍යාස පොතේ ලියාගන්න.
- ක්‍රියාකාරකම අවසන් වූ පසු තම කණ්ඩායම එක්වී පන්තියට ඉදිරිපත් කරන්න

ඇමුණුම 4.1.4.3

ගීත ලැයිස්තුව -

1. චන්ද නම් යස තේජ කුංකුම
2. තුරු රත්න සිරි ලෙසිනා
3. චන්ද නන්දන රාජ කුංජන

මැදුම් තනි තිත




නන්ද විජය ශ්‍රී වික්‍රම - රාජසිංහ නම් අප හිමි
ඉන්ද්‍රසිරින් නිති රැකදෙන් - කන්ද කුමරුනේ //

රාජවංශ විය රිවිකුල - නාම ගගන තල බබලන
රාජ මෙතුන් සිංහල කිවි - භෝජ රාජනේ

තේජ විකුම් යුතු වික්‍රම - රාජසිංහ සිරි නම් දූරු
රාජ රත්නමය අපහිමි - රාජ රාජනේ

මැදුම් මහ දෙතිත



ලකල මාතා අඟන  ලක සිරි
වඩන  සුර විපුල සිරි
සකල විඳ නිජ බැතිනි රියහර
බුජග දෘඪතර කැමැති නසුහර්දෘ

ප්‍රශස්ති ගී


1. චන්ද නන්දන රාජ කුංජන
පත්ම නංවන නාභිලංකර
පංචනීය රාම චන්ද්‍ර - රාජ රාජනේ

2. පංච නම් සුර නාභි නන්දන - මම් බැලුම් විලසින් සුරංගන
සත් රුවන් මිණි සේ ඇඳුම් ඇඳ - රාජ පාලනේ

3. සුද්ධ සුන්දර ශ්‍රී විරාජිත - ඉන්ද්‍ර පංකජ ලෝහිතංක
නන්දනන් ගිරි රාජදේව - රාජ රාජනේ

4. තෙයිතා ජිත් තක් තිරිකිට
තෙයි තාජිත් ජිත්තරිකිට ජිත්
තෙයි තාජිත් තොං තරිකිට
තෙයිතාජිත් නං තරිකිට
තක්කඩ ජික්කඩ දොංකඩ නංකඩ ජෙංගත් තරිකිට
සකල දියත පරසිඳුවර රාජසිංහ මේ.

මැදුම් තනි තිත



නිපුණතාව 5.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීමක් ලබයි.

නිපුණතා මට්ටම 5.1 : ශ්‍රී ලංකාවේ පැවැති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි.

ක්‍රියාකාරකම 5.1.1 : නූර්ති ගී ගයමින් එහි රංග සම්ප්‍රදාය හදාරමු...

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම් 5.1.1.1 ට අයත් නූර්ති ගීත පදමාලා හා ස්වර ප්‍රස්තාර, ඇමුණුම් 5.1.2.1 ට අයත් කාර්ය ගවේෂණ පත්‍රිකාව, නූර්ති ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටය හා කැසට් යන්ත්‍රය , සර්පිනාව තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.1.1

- ශ්‍රව්‍ය පටයේ ඇති නූර්ති ගීතයක් ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීත ශෛලීය පිළිබඳව සිසුන් විමසන්න.
- දැනට ගුවන් විදුලියේ හා රූපවාහිනියේ අසන්නට දකින්නට ලැබෙන නූර්ති ගීත පිළිබඳව කථා බහක යෙදෙන්න.
- ශ්‍රවණය කළ ගීතය සිසුන් සමඟ එක්ව ගයන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - නූර්ති ගීත ඉතා රසවත් සංගීත අංගයක් බව
> - මුල් යුගයේ ඒවා ග්‍රැමෆෝන් තැටිවලින් ප්‍රචාරය වූ බව.
> - නූර්ති නාට්‍ය නැරඹීමට මෙන්ම එම ගීත ශ්‍රවණය සඳහා ශ්‍රාවකයන් පෙළඹුනු බව
> - නාට්‍ය නොබලා වුවත් නූර්ති ගීත පමණක් ගායනය වාදනය කරමින් රසවිඳිය හැකි බව

(මිනිත්තු 20යි)

පියවර 5.1.1.2

- පන්තිය කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- 5.1.1.2 ගවේෂණ කාර්ය පත්‍රිකාවේ පිටපත් දෙක එම කණ්ඩායම් දෙක අතර බෙදන්න.
- එහි සඳහන් ක්‍රියාකාරකම්හි කණ්ඩායම් යොදවන්න.
- එම කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 80 යි)

පියවර 5.1.1.3

- කාර්ය පත්‍රිකාව 5.1.1.1 හි සඳහන් නූර්ති ගීතයක් තෝරා ගන්න.
- එම ගීතය පෙළින් පෙළ සර්පිනාව වයමින් ළමුනට හුරු කරන්න.
- සමූහයටම ගීතය හොඳින් පුහුණු කරන්න.
- ගීතය හා එහි ස්වර ප්‍රස්තාරය සටහන් පොතේ ලියා ගැනීමට සිසුන්ව පොළඹවන්න.
- කාර්ය ගවේෂණ පත්‍රිකාවේ අවසන් ක්‍රියාකාරකම තම සටහන් පොතේ ලියා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් දෙක එම ඇමුණුමේ පිටපත පන්තියේ ප්‍රදර්ශනය සඳහා ඩිමයි කොළ දෙකක පැහැදිලි අත් අකුරින් ලියවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසයට නූර්ති ගීත එකතුවීමට බලිවාලා නූර්ති කණ්ඩායම් පැමිණීම බලපෑ බව
- හින්දුස්ථානි රාග, තාල හා වාද්‍ය භාණ්ඩ, නූර්ති සංගීතය සඳහා යොදාගෙන ඇති බව
- ස්ථායි අන්තරා ගීත ආකෘතිය, විචිත්‍ර ගීතනු, මෙම නූර්ති ගීත තුළ අඩංගු වී ඇති බව.
- ප්‍රථම සිංහල නූර්තියේ සිට ජෝන්ද සිල්වා සීදොන් බස්තියන්, චාර්ල්ස් ඩයස් යන මහතුන්ගේ අවධිය තෙක් නූර්ති සැබෑ ජයග්‍රාහී මාවතක ගමන් කළ බව
- නූර්ති සංගීතයේ පැවති කර්ණ රසායන බව නිසා එය රසිකයන්ගේ සිත් දිනා ගත් බව.


(මිනිත්තු 60 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- නූර්ති නාට්‍ය ශෛලියේ ආරම්භය හා ඊට දායකවූ ආයතන හා පුද්ගලයින් නම් කරයි.
- නූර්ති ගී ගායනයේදී තනුව නිවැරදිව ගායනා කිරීමෙන් එහි අනන්‍යතාවය රැකෙන බව පිළිගනියි.
- ස්වර ප්‍රස්තාරය ප්‍රයෝජනයට ගනිමින් නූර්ති ගීත නිවැරදිව ගායනය කිරීමට කැපවීමෙන් ක්‍රියා කරයි.
- නූර්ති ගීත ව්‍යවහාරික සංගීතයේ භාවිතා වී ඇති අයුරු සෙවීමට සුදානම් වෙයි.
- දැනට ප්‍රචලිත නූර්ති ගීත සොයා ඒවා වගු ගත කරයි.

ඇමුණුම් 55.1.1


සුවඳ පද්ම - නූර්තිය දුටු ගැමුණු - නිෂ්පාදක - නීතිඥ ජෝන් ද සිල්වා



ඇමුණුම 5.1.1.1



ඇමුණුම 5.1.1.1



ඇමුණුම් 5.1.2.1

ගවේෂණ උපදෙස් පත්‍රිකාව

නිමල්, සිරි සහ රේඛා යහළුවන් තිදෙනකි. මෑත දිනකදී ඔවුන් මරදාන ටවර් රඟහලේ කෞතුකාගාරය නැරඹීම සඳහා වූ චාරිකාවට සහභාගිවූහ. ඉන් පසුව ඇතිවූ කතාබහකි මේ.....

නිමල් - සිරි, ඒ කාලේ ටවර් රඟහලේ පෙන්නුව නාට්‍ය. හරි ලස්සනට තියෙන්න ඇති නේද?

සිරි - කියලා වැඩක් නෑ නිමල්, අපිට කොහේද එච්චර වාසනාවක්, කොළඹ කිට්ටුවක ඉඳලත් අපේ තාත්තලවත් ඒවා බලලා තියෙනවාද දන්නේ නෑ නේද ?

රේඛා - අපේ තිස්ස මාමා නම් ඒ දවස්වල නූර්ති නාට්‍ය බලන්න ටවර්හෝල් ඇවිල්ලා තියෙනවාලු. අම්මා කියලා තියෙනව මාමා කොළඹ ආවාම දවස් දෙක තුන යනකල් ගෙදර යන්නෙත් නෑ කියලා.

නිමල් - හා. හා එහෙනම් රේඛලාගේ තිස්ස මාමා නාට්‍ය පිස්සෙක් වෙන්ටැ.

රේඛා - එහෙම කියන්න එපා. තිස්ස මාමා කාටවත් වරදක් කරන්නෙත් නෑ. අදටත් නිකම් ඉන්නකොට, නූර්ති ගීත කෑලි තමයි කටේ තියෙන්නේ .............

නිමල් - සිරි දන්නවද ? නූර්ති නාට්‍ය රඟදක්වන්න 'බලිවාලා' කියලා කෙනෙක්ලු ලංකාවට ඇවිත් තියෙන්නේ ... එක් දහස් අටසිය අසූ ගණන් වලදිලු.

සිරි - ඒ මොන කතාවක්ද? බලිවාලා නෙමෙයි Elphinston Dramatic Company (එල්ෆින්ස්ටන් ඩ්‍රැමටික් කම්පැණි) ලංකාවට ඇවිල්ලා තියෙන්නේ බොම්බායේ ඉඳලා.

රේඛා- ඔය දෙන්නම දන්නේ බාගෙට. 1880 දී බලිවාලා නෘත්‍ය සමාගම හෙවත් Elphinston Dramatic Company ලංකාවට ඇවිල්ලා තියෙන්නේ බොම්බායේ ඉඳලා

නිමල් - හරි හරි සී. දොන් බස්තියන් මාමා තමයි පළවෙනියටම සිංහලෙන් රොලීනා කියලා නූර්තියක් කරලා තියෙන්නේ.

සිරි නිමල් දැන් හරි දියුණුයිනේ. ඒ වුණාට ඔයා දන්නේ නැනේ ඒකට සංගීතය සැපයුවේ කවුද කියලා.

නිමල් ඒ නාට්‍යයමද කියලා දන්නේ නැහැ. හැබැයි ඔය ගැන විස්තරයක් ටවර් හෝල් එකේ තිබුණා.

රේඛා මම ඒවා හොඳට කියවලා බැලුවා. ඒ අයගේ නම් තිබුණා. ඒකට යොදාගත්ත සංගීතා, භාණ්ඩ ගැනත් විස්තර තිබුණා. දන්නවද මොන සංගීතෙ ද යොදා ගත්තේ කියලා.

නිමල් මේ ඔයා මැද්දට පනින්න එපා.

රේඛා ඔයාලට හරියට කේන්ති යනවා. උතුරු ඉන්දීය හින්දුස්ථානී සංගීතය, තබ්ලාව, සර්පිනාව, වයලීනය, බටනලාව වගේ භාණ්ඩ තමා යොදා ගෙන තියෙන්නේ.

සිරි මට නම් රවිකිඤ්ඤය කියලා වචනයකුත් මතකයි.

නිමල් රවිකිඤ්ඤය කිව්වේ වයලීනයට නේ.

සිරි නිමල් ඒ දවස්වල අර කොම්පැණිය ආපු කාලෙම හොඳ හොඳ සංගීතඥයො ලංකාවට ඇවිල්ලා තියෙනවා. සංගීතය සපයන්න.

රේඛා ඔව් ඉතින් ... ඉස්සෙල්ලා මම කියන්න යනකොට ඉඩ දුන්න යැ. මම දැක්කා විශ්වනාත් ලෞජි, කාංජි ජය්‍යා ශංකර්, අබ්දුල් සතාර් කියල නම් වගයක් ලියලා තිබුණා.

නිමල් සිරි ඔයාට මතකද අර ටවර් ශාලාවේ එහා කෙළවරේ එල්ලලා තිබුණා පින්තූර දෙක එක්කෙනෙක් හරියට ලංකාවේ පළමුවැනි අගමැති තුමා වගේ.

රේඛා මේ ඔය දෙන්න කාටවත් අපහස කරන්න එපා. එතැන හිටියේ නීතිඥ ජෝන් ද සිල්වායි, නීතිඥ චාර්ල්ස් ඩයස් මහත්තයයි.

නිමල් හරි හරි අර අපිට උගන්නලා තියෙන සුවඳ පද්ම ගීතය තිබුණේ ජෝන්ද සිල්වා මහත්තයාගේ දුටු ගැමුණු නූර්තියේ නේ ද?

සිරි මතක නැද්ද රාමායනය, වෙස්සන්තර, සිරිසඟබෝ

රේඛා මම නම් ආස චාර්ල්ස් ඩයස් මහත්තයගේ විදුර නූර්තියේ එන'දම් වැසි වස්සන.. ගීතේට'' තව පද්මාවතී නූර්තියේ ''සෝබමාන දේව පුරා ............''. අම්මා... ලස්සන . .... ආ. තිස්ස මාමා කිව්වා. නූර්ති නාට්‍යවල ඇඳුම් හරිම ලස්සනයිලු. සුරංගනාවියෝ එහෙම වේදිකාවේ උඩ ඉඳන් බිමට පාත් වෙනවලු. පුදුම වැඩ තමයි ඒ කාලේ.. තිබිලා තියෙන්නේ.

නිමල් හරි ලස්සනට තියෙන්නෙ ඇති නේද ? ඒ වගේ උපක්‍රම යොදලා තියෙන්නේ නූර්ති වලම තමයි.

රේඛා ඒක නෙමේ දැන් රෑ වෙන්නත් ළඟයි. අපි හෙට හම්බවෙමුකෝ..
ආ... මට මතක් වුනේ දැන්... අපේ ගෙදර පොත් වගයක් තියෙනවා. ඒ අතරේ තියෙනවා ස්වර ලිපි සහිත සිංහල නූර්ති ගීත කියලා ලොකු පොතකුයි, 'සිංහල ගැමි නාටකය' කියලා.. පොතකු යි. මම ගෙදර ගිහින් ඒවා බලලා තව නූර්ති ගී ගැන තොරතුරු ටිකක් හෙට සොයාගෙන එන්නම් කෝ........

මේ දෙබස හොඳින් කියවා බිත්ති පුවත් පතක් සඳහා පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ කරුණු සාකච්ඡා කරන්න.

1. නූර්ති ආරම්භය ගැන විස්තර දක්වන්න.
2. නූර්ති නාට්‍යවලට යොදාගන්නා සංගීත භාණ්ඩවල දළ රූප සටහන් දෙකක් අඳින්න.
3. ඔබ දන්නා නූර්ති ගීතයක පද ලියන්න
4. සරල ගීත ලෙස කලක සිට ජනප්‍රිය වී ඇති නූර්තිගීත ලැයිස්තුවක් සකස් කරන්න.
5. එකල නූර්ති නාට්‍යවල රඟපෑ, සංගීතය සැපයූ, ශිල්පීන් කිහිප දෙනෙකු හඳුන්වන්න.
6. වැඩිම නූර්ති ගණනක් නිෂ්පාදනය කළ නිර්මාතෘවරුන් දෙපළ කවු ද?

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාග පිළිබඳ අත් දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 5.1 : ශ්‍රී ලංකාවේ පැවැති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනාගනිමින් අගය කරයි.

ක්‍රියාකාරකම 5.1.2 : මද්දල රිද්මයේ වතගොත සොයමු.
කාලය : කාලච්ඡේද 2 යි

ගුණාත්මක යෙදවුම් :
- මද්දලයක්
- මද්දලයක් වාදනය කරන රූප සටහනක් ඇමුණුම 5.1.2.1
- මද්දල් වාදනයක් සහිත නාඩගම් ගී ඇතුළත් ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටයක්.
- ඇමුණුම අංක 5.1.2.2 කියවීම් පත්‍රිකාව
- ඇමුණුම අංක 5.1.2.3 ගවේෂණ උපදෙස් පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.2.1 :
- මද්දලයක් හෝ එහි වාදන ස්වරූපය දක්වෙන රූප සටහනක් පන්තියට ඉදිරිපත් කරන්න
- එය පිළිබඳව සිසුන්ගෙන් අදහස් විමසන්න.
- මද්දල් වාදනය සහිත නාඩගම් ගීතය ශ්‍රවණයට සලස්වා එහි තාලවාද්‍ය භාණ්ඩය හඳුනාගැනීමට සිසුන් යොමු කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - දකුණු ඉන්දියාවේ කර්ණාට සංගීත සම්ප්‍රදාය හරයා ශ්‍රී ලංකාවට හුරු පුරුදු වූ සංගීත භාණ්ඩයක් බව
  - කර්ණාටක සංගීත සම්ප්‍රදාය ඇසුරෙන් අප ලද උතුම් දායාදයක් බව.
  - නාඩගම් සම්ප්‍රදායේ හා ව්‍යවහාරික සංගීතයේ දී වැඩි වශයෙන් මෙම සංගීත භාණ්ඩය භාවිත වන බව
  - මද්දලයට සුවිශේෂ වූ පද විශේෂයක් ඇති බව.

(මිනිත්තු 10යි)

පියවර 5.1.2.2 :
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ගන්න.
- ඇමුණුම 5.1.2.2 කියවීම් පත්‍රිකාව හා අංක 5.1.2.3 ගවේෂණ උපදෙස් පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 50යි)

පියවර 5.1.2.3 :
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

  - මනමේ සිංහබාහු වැනි නාඩගම් ආභාෂයෙන් නිර්මාණය වූ නාට්‍යවල මද්දලය වාදනය කෙරෙන බව.
  - නාඩගම් සම්ප්‍රදායේ රංගයක එකවර මද්දල දෙකක් අඩු තාල හා වැඩි තාල වශයෙන් වයන බව

(මිනිත්තු 20යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- මද්දලය පිළිබඳ විස්තර ලියයි.
- නාඩගම් ගී ශ්‍රවණය කිරීමට කැමැත්ත පල කරයි.
- මද්දලය වයා ඇති වර්තමාන සරල ගීත එක් රැස් කරයි.
- මද්දලය පිළිබඳ කරුණු රැස්කර පොත් පිංචක් නිර්මාණය කරයි.
- අනෙකුත් තාල වාද්‍ය භාණ්ඩවලට වඩා වෙනස් ව මෙහි ඇති තාල හා නාද රසය පිළිබඳ අගයයි.

ඇමුණුම 5.1.2.1

මද්දලයක් වාදනය කරන රූප සටහනක්



නෝමන් ගුණසිංහ මහතා

ඇමුණුම 5.1.2.2

කියවීම් පත්‍රිකාව

මද්දලය යන නම 'මද්දලං' යන දෙමළ පදයෙන් බිඳී ආවකි. එය සිංහලයේ 'දෙමළබෙරය' යන නාමයෙන්ද ව්‍යවහාර කරති. ඇතැම් තැනක 'මත්තාලම' යනුවෙන් ද දක්වේ.

මද්දල 2 ක් වැයීම සාම්ප්‍රදායික සිරිතයි. එහි දී අඩුතාල් හා වැඩි තාල් වැයීම යනුවෙන් එකම තාලයට අයත් පද දෙකක් මද්දල් දෙකකින් එකට වැයීම සිදුවේ. මෙහි දී වාද්‍ය ශිල්පීන් දෙදෙනා මුහුණට මුහුණ ලා වාදීවීම සම්ප්‍රදායයි.

මද්දලය තාල වාද්‍ය භාණ්ඩයකි. නාඩගම් සම්ප්‍රදාය තුළ භාවිත වන අවනද්ධ භාණ්ඩයකි. දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතයේ ඇසුර නිසා අපට ලැබුණ සංගීත භාණ්ඩයකි. දැවයෙන් කඳ සකස්වී ඇති අතර බෙර ඇස, සතුන්ගේ හම් වලින් නිමවී ඇත. හරක් මුව හෝ එළුහම් මේ සඳහා යොදාගනී. කදෙහි දැව සඳහා කොහොඹ, ඇසළ, කොස්, දැව යොදා ගනියි. මද්දලයේ විවෘත හඬක් ඇත. නාඩගම් සඳහා සංගීත භාණ්ඩ භාවිත නොවූ අතර මද්දලයේ නාදය ශ්‍රැති කරගෙන ගායනය සිදුවිය.

තිර්ලානා

| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| අඩු තාලය | රත් | තං | කිට | ද්‍රිත් | තා | ට |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| වැඩි තාලය | ජේං | ණේං | ත්‍රී | කිට | තා | — |

පසන්

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| අඩු තාලය | තා | — | ට | ත | තා | ං | දෝ | ට |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| වැඩි තාලය | දි | කු | ත් | තා | — | කු | දෝ | ට |

තංගපාට

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩු තාලය | තේ | ට | කි | ත | ට | කි | ත | ට | කි | ත | ට | කි |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| වැඩි තාලය | දි | ත් | ත | ට | ත | ට | ග | කි | ත | ග | ත | ට |

දිල්ලම් කීර්තනම්

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩු තාලය | දි | කු | ට | ත | ති | කි | ට | ත | කු | ට | ත | ති | කි | ට |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| වැඩි තාලය | දිත් | කුං | තං | තරි | කිට | තරි | කිට | තත් | කුත් | තං | තරි | කිට | තත් | කිට |

ඇමුණුම 5.1.2.3


ගවේෂණ උපදෙස් පත්‍රිකාව

- ඇමුණුම් අංක 5.1.2.2 කියවීම් පත්‍රිකාව කියවා අවබෝධ කර ගන්න.
- ඒ අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- සිසු අභ්‍යාස පොත්, පිළිතුරු ලිවීමට යොදාගන්න.

1. මද්දලයේ ආරම්භය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
2. හිස් තැන් පුරවන්න.
   i) මද්දල් දෙකින් .......................... සහ .....................වාදනය කරයි.
   ii) මද්දලය ............................ සම්ප්‍රදායට අයත් සංගිත භාණ්ඩයකි
   iii) ...................... ආභාෂයෙන් මෙම සංගීත භාණ්ඩය ශ්‍රී ලංකාවට ලැබී ඇත.
   iv) .................................. ...................... හා වැනි දැව වර්ග යොදාගෙන මෙම භාණ්ඩය සකස් කර ඇත.
   v.) i දොම් /කිට/කිට/දොම්/
   ii ගුඳ / ගුඳ / ගති / ගත/ ......................................................................
   iii දි කු ං තා / - කු දොං /
   ඉහත දැක්වෙන බෙරපද වලින් මද්දල පදය සොයා හිස්තැනට ලියා දක්වන්න.

3. පහත දැක්වෙන්නේ නාඩගම් ගී පදයක් සමඟ යෙදෙන මද්දල පදයකි. එම ගී පාදය ගායනය කරන විට පහත දැක්වෙන මද්දල පදය අත්ලෙන්, අත්ල ගසමින් තාල තබන්න.

* ගුරු උපදෙස් ලබා ගනිමින් පහත දැක්වෙන ගීතය ගයමින්, අතින් තාල තබන්න.



නිපුණතාව 5.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාග පිළිබඳ අත් දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 5.1 : ශ්‍රී ලංකාවේ පැවැති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනාගනිමින් අගය කරයි.

ක්‍රියාකාරකම 5.1.3 : නාඩගම් රංග සම්ප්‍රදායෙන් ශෛලීන්හි සංගීතය හා ගීත ගායනය
කාලය : කාලච්ඡේද 04 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 5.1.3.1 ට අයත් නාඩගම් ගීත හා ස්වර ප්‍රස්තාර
- ඇමුණුම් 5.1.3.2 ට අයත් කාර්ය ගවේෂණ පත්‍රිකාව
- ඇමුණුම් 5.1.3.3 ට අයත් කාර්ය පත්‍රිකාව, නාඩගම්ගීත ඇතුළත් ශ්‍රව්‍යපටය හා යන්ත්‍රය, සර්පිනාව, තබ්ලාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.3.1 :
- ශ්‍රව්‍යපටයේ ඇති නාඩගම් ගීයක් ශ්‍රවණයට සලස්වන්න.
- නාඩගම් ගීත පිළිබඳව සිසුන් විමසන්න.
- නාඩගම් ගීත හා ශෛලිය පිළිබඳව සිසුන්ගේ අදහස් විමසන්න.
- නැවත එම ගීතය සර්පිනාව වයමින් සිසුන් සමග ගායනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක් යෙදෙන්න.

> - නාඩගම් ගී ඇසෙන විට නිරායාසයෙන්ම රංගනයට පෙළඹෙන බව
> - නාඩගම් ගීත උස් හඬින් ගැයෙන බව
> - තාල භාණ්ඩ වාදනයෙන්, ගීතයට ප්‍රාණවත් රිද්මයක් ලබාදෙන බව

(මිනිත්තු 20 යි)

පියවර 5.1.3.2 :
- පන්තිය කුඩා කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ඇමුණුම 5.1.3.2 කියවීම් පත්‍රිකාව හා අංක 5.1.3.3 කාර්ය ගවේෂණ පත්‍රිකා එම කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 5.1.3.1 පත්‍රිකාවේ සඳහන් ගීත ස්වර ප්‍රස්තාරය පන්තියට ඉදිරිපත් කරන්න.
- සර්පිනාව තා තබ්ලාව උපයෝගී කර ගනිමින් එම ගීත ගායනය පුහුණු කරන්න.

(මිනිත්තු 80යි)

පියවර 5.1.3..3 :
- කණ්ඩායම් දෙකේ 5.1.3.3 කාර්ය ගවේෂණ පත්‍රිකාව සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඇමුණුම් 5.1.3.1 ට අයත් ගීතය ගැයීමට ඉදිරිපත් වන කුඩා කණ්ඩායම්වලට ඒ සඳහා අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.


> - නාඩගම් නාට්‍ය සඳහා දකුණු ඉන්දියානු ආභාෂය ලැබී ඇති බව
> - නාඩගම් රංග සම්ප්‍රදායේ ඊට ආවේණික ශෛලියක් ඇති බව.
> - නාඩගම් සඳහා කර්ණාටක සංගීතය උපයෝගී කරගත් බව

(මිනිත්තු 60 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- නාඩගම් රංග සම්ප්‍රදාය හා එහි සංගීතය ගැන තොරතුරු පැහැදිළි කරයි.
- නාඩගමකට ආවේනික වූ  අංග විස්තර කරයි.
- උරුට්ටුව සහිත නාඩගම් ගීයක් ගායනය කරයි.
- නාඩගම්වල තොරතුරු සෙවීමට පෙළඹේ.
- සඳහා නාඩගම් ගීත ගායනය කරමින් රසාස්වාදයේ යෙදෙයි.

ඇමුණුම 5.1.3.1



ඇමුණුම 5.1.3.1-

ස්වර්ණතිලකා නාඩගම්



සොබනා ජාවකුත් හිස බැඳ
ඥාණ බලෙන් සුරගුරුන් පරදවන
මමය සිටින මෙම පුරයෙ දීප්තියෙන//
සබයෙ සපිරි සිංගාරයට පැමිණෙන



ඇමුණුම 5.1.3.2

කියවීම් පත්‍රිකාව

1 ලංකාවේ නාඩගම් සඳහා දකුණු ඉන්දියාවේ තෙරුක්කුත්තු නම් වීදි නාට්‍ය ගී තනුවල ආභාෂය ලැබී ඇත. සමහර නාඩගම් තනුවලට බලපා ඇත්තේ කතෝලික කන්තාරු ගී තනුය.

2 නාඩගම් ලංකාවේ වෙන්නප්පුව හලාවත, මීගමුව, තංගල්ල හික්කඩුව හා බලපිටිය වැනි මුහුදුබඩ පෙදෙස්වල ව්‍යාප්ත විය.

3 අලගනායිදු නම් ද්‍රවිඩ සංගීතඥයකු ප්‍රථමයෙන් 'හරිශ්චන්ද්‍ර නම් නාඩගම ලංකාවේ රඟ දක්වා ඇත.

4 සිංහල නාඩගමක් ප්‍රථමයෙන් නිෂ්පාදනය කළේ පිලිප්පු සිංඤෝ මහතායි.

5 එහි නම වූයේ 'ඇහැලේපොල නාඩගමය ...'

6 ඊට පසුව චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ විසින් වෙස්සන්තර, විධුර, දික්තල - කාලගෝල වැනි නාඩගම් නිපදවා ඇත.

7 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයින් පැරණි නාඩගම් අනුසාරයෙන් මනමේ, සිංහබාහු යන නාට්‍ය නිපදවීය.

8 නාඩගම් සඳහා මද්දල දෙකක් වාදනය කරයි.

9 පොතේ ගුරු , බහුබූතයා, සෙල්ලන් ළමා වැනි චරිත දක්නට ලැබෙන්නේ නාඩගම් වලයි.

10 නාඩගම් රංග සම්ප්‍රදාය ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායට අයත් වෙයි.

11. නාඩගම් සඳහා දකුණු ඉන්දීය කර්ණාටක සංගීතය යේ ආභාසය ලැබී ඇත.

12 දෙබස් ගීත ස්වරයෙන් කීම ද නාඩගම් වල සුවිශේෂ ලක්ෂණයකි

13 මෑත කාලයේ දී මද්දල් දෙකට අමතරව සර්පිනා, වයලීනය හා බටනලාව ද සහාය වාදනය සඳහා යොදා ගනී.

ඇමුණුම 5.1.3.3

ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| ආරම්භය | 1 | 2 |
| නාඩගම් නිර්මාතෘවරු | 1 | 2 |
| ප්‍රචලිත නාඩගම් | 3 | 4 |
| ගී තනු පිළිබඳ අදහස් | | |
| විශේෂ ලක්ෂණ 4 ක් | 1<br>3 | 2<br>4 |
| යොදා ගත් සංගීත භාණ්ඩ | | |

නිපුණතාව 6.0 : සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 6.1 : ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි.

ක්‍රියාකාරකම 6.1.1 : ' ....... රටා මවමු රිද්මයෙන්...'

කාලය : කාලච්ඡේද 03 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 6.1.1 ට ඇතුළත් විස්තර උපදෙස් පත්‍රිකාවේ පිටපත්, ඇමුණුම් 6.1.1.2 ගවේෂණ පත්‍රිකාව මීට පෙර ශ්‍රේණියක භාවිත කළ චිත්‍ර රටා හැඩතල සහිත දෘශ්‍යාධාරයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.1. :
- චිත්‍ර රටා හැඩ තල යොදා ඇති දෘෂ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එවැනි වෙනත් හැඩතල සහිත චිත්‍ර රූප කිහිපයක් ඇඳ දක්වීමට (කලු ලෑල්ල) සිසුවෙකුට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක් යෙදෙන්න.
  - අප අවට පරිසරයෙන් ඇසෙන විවිධ හඬවල් අතර ද රිද්මායානුකූල බවක් ඇති බව.
  - දුම්රිය මගක සිල්පර කොටන් යොදා ඇති ආකාරයේ ද රිද්මයානුකූල රටාවක් ඇති බව.
  - සාමුහික ක්‍රියාකාරකම් වලට රිද්ම රටා වැදගත් වන බව.

(මිනිත්තු 10යි)

පියවර 6.1.2 :
- පන්තිය කණ්ඩායම් හතරකට බෙදන්න.
- උපදෙස් පත්‍රිකාවේ පිටපත් එම කණ්ඩායම් අතර බෙදන්න.
- ගවේෂණ පත්‍රිකා පිටපත් ද කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- රිද්ම රටා හය කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.

(මිනිත්තු 50යි)

පියවර 6.1.3 :
- කුඩා කණ්ඩායම්වල නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න.
- ගැටළු සහිත කණ්ඩායම් හැඳින රිද්ම රටා පිළිබඳ දැනුවත් කරන්න.
- තෝරා ගත් රිද්ම රටා කිහිපයක් ගෙන අත් තැලීම් මගින් රිද්ම රටා නිරූපණය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සෑම තාලයකටම ගැලපෙන සේ රිද්ම රටා නිර්මාණය කළ හැකි බව.
  - රිද්මයානුකූල චලන නිර්මාණය කිරීමට ද මේ රිද්ම රටාවන් උපයෝගී කර ගත හැකි බව.
  - එකී සෑම රිද්ම රටාවක්ම අත් තැලීමෙන් හෝ භාණ්ඩ වාදනය කරමින් හඬ නිරූපණය කළ හැකි බව.
  - රිද්මය ක්‍රමානුකූලව ඉපදවීමෙන් එය තාලයක් දක්වා වර්ධනය කළ හැකි බව.
  - සෑම තාලයක් තුළම රිද්මයානුකූල රටාවන් ඇති බව.

( මිනිත්තු 60යි)

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- විවිධ තාලවලට බැඳි රිද්මරටා අත් තලමින් නිරූපනය කරයි.
- විවිධ රිද්මරටා නිර්මාණය කරයි.
- තෝරාගත් භාණ්ඩ මගින් රිද්ම රටා වාදනය කරයි.
- අත්හදා බැලීම් හි නිරත වෙයි.
- විවිධ රිද්ම රටා ආශ්‍රිතව වාදනය නිර්මාණය කරයි.

ඇමුණුම 6.1.1

උපදෙස් පත්‍රිකාව

- මීට පෙර වසරක දී ඔබ විවිධ හැඩතල ඇති රූප රටා චිත්‍ර රටා පිළිබඳව අධ්‍යයනය කර ඇත. එකම හැඩ තලයකින් යුත් රටා සමූහයක් , රිද්මයානුකූලව අත් තැලීමක්, භාණ්ඩයකින් නාද නිකුත් කිරීමත්, රිද්ම රටාවක මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

- රිද්ම රටාවන් සඳහා කතිර හැඩයක් (X) , කෙටි ඉරි කැබැල්ලක් (-) භාවිත කරයි. (X) කතිර ලකුණ අයත් මාත්‍රාව මත හඬ නැගීමත් අත් තැලීමත් සිදු කරයි. (-) මෙම ලකුණ මත මාත්‍රාවක හඬ ඇදීමත් සිදු කරයි.

උදා මාත්‍රා දෙකේ රිද්ම රටාව

| | | | | |
|---|---|---|---|---|
| i | 1 2 | 1 2 | 1 2 | 1 2 |
| ii | x x | x x | x x | x x |
| iii | x x | x x | x x | x x |

- මේ අනුව පහත සඳහන් මාත්‍රා බෙදීම්වලට අනුව විවිධ රිද්ම රටා ගොඩ නගා ගත හැක.

- විවිධ මාත්‍රා සංඛ්‍යාවන්ට ඇතුළත් රිද්ම රටා

| | | | | |
|---|---|---|---|---|
| i | 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |
| ii | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
| iii | 1 2 | 1 2 3 | 1 2 | 1 2 3 |
| iv | 1 2 3 | 1 2 3 4 | 1 2 3 | 1 2 3 4 |
| v | 123 456 | 123 456 | 123 456 | 123 456 |

ඇමුණුම 6.1.1.2

## ගවේෂණ පත්‍රිකාව

- පහත සඳහන් රිද්ම රටා සම්පූර්ණ කරන්න.

| 1. | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| i | x | | | | x | x | | | |
| ii | x | | | - | | | x | | |
| iii | x | x | | | | | - | - | |
| iv | x | - | | x | | | - | - | - |
| v | - | x | | | | | | | |
| vi | x | | | - | | | | | |
| vii | | | | | | | | | |
| viii | | | | | | | | | |
| ix | | | | | | | | | |
| x | | | | | | | | | |

| 2. | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| i | x | x | x | | | | | | | - | - | - |
| ii | x | | | | - | | | | | | | |
| iii | x | | | x | x | | | | | | | |
| iv | x | x | | | | | | | | | | |
| v | x | | | x | | x | x | | | | | |
| vi | | | | | | | | | | | | |
| vii | | | | | | | | | | | | |
| viii | | | | | | | | | | | | |
| ix | | | | | | | | | | | | |
| x | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3. | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| i | x | x | x | | | | | | | | | | | | | |
| ii | | | | | | | | | | | | | | | | |
| iii | | | | | | | | | | | | | | | | |
| iv | | | | | | | | | | | | | | | | |
| v | | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| i | | | | | | | | | | |
| ii | | | | | | | | | | |
| iii | | | | | | | | | | |
| iv | | | | | | | | | | |
| v | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5. | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| i | | | | | | | | | | | | | | |
| ii | | | | | | | | | | | | | | |
| iii | | | | | | | | | | | | | | |
| iv | | | | | | | | | | | | | | |
| v | | | | | | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6. | 123 | 456 | 123 | 456 | 123 | 456 | 123 | 456 | |
| i | x-- | x-- | x-- | x-- | x-- | | | | |
| ii | x-x | | | | | | | | |
| iii | xxx | --- | | | | | | | |
| iv | xx- | | | | | | | | |
| v | xx- | xx- | | | | | | | |

නිපුණතාව 6.0 : සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 6.1 : ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි.

ක්‍රියාකාරකම 6.1.2 : ' රිද්ම රටාවකට ස්වර යොදමු ...'
කාලය : කාලච්ඡේද 03 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 6.1.2.1 ට ඇතුළත් ගවේෂණ උපදෙස් පත්‍රිකාව, ඇමුණුම් 6.1.2.2 උපදෙස් පත්‍රිකාව, ඩිමයි කොළ, යතුරු පුවරු හා වයලීනයක්
- ඇමුණුම් 6.1.2.2 ට ඇතුළත් ස්වර ප්‍රස්තාරය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.2.1. :
- ඇමුණුම් 6.1.2.2 ඇතුළත් දෘශ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇතුළත් රිද්ම රටාව, පද මාලාව හා ස්වර ගැන සිසුන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක් යෙදෙන්න.

> - පද මාලාව ප්‍රස්තාර කර ඇති ස්වර හා රිද්ම රටාව අතර සමාන රූපයක් දක්නට ලැබෙන බව.
> - දෘෂ්‍යාධාරයේ රිද්ම රටාව සඳහා 'ස රි ග ම ප' යන ස්වර පහ පමණක් යෙදී ඇති බව.
> - කිසියම් ක්‍රම වේදයක් මේ ස්වර යෙදීමේ දී අනුගමනය කළ හැකි බව.

(මිනිත්තු 10යි)

පියවර 6.1.2.2 :
- පන්තිය කණ්ඩායම් හතරකට බෙදන්න.
- උපදෙස් පත්‍රිකාවේ පිටපත් එම කණ්ඩායම් අතර බෙදන්න.
- ඇමුණුම් 6.1.2.2 කාර්ය ගවේෂණ පත්‍රිකාව කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- ගැටලු සහිත අවස්ථාවලදී ගුරුවරයා සහාය වන්න.
- කණ්ඩායම් හතරේම නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කරවන්න.

(මිනිත්තු 50යි)

පියවර 6.1.2.3 :
- කණ්ඩායම්වල නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කිරීමේදී සදොස් තැන් ඇත්නම් නිදොස් කරන්න.
- සෙසු කණ්ඩායම්වල යෝජනා ආදිය විමසන්න.
- කණ්ඩායාම් වලින් ඉදිරිපත් වන නිර්මාණ සර්පිනාව ආධාරයෙන් සමස්ත පන්තිය සමඟ ගයන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - සංගීත නිර්මාණ කාර්යයේදී ප්‍රස්තාරකරණය ඉතා වැදගත් බව.
> - රිද්ම රටාවක් උපයෝගී කරගෙන ස්වර යෙදීමෙන් තනු නිර්මාණය සඳහා මූලික හුරුවක් ලැබෙන බව.
> - x, - , + හා ++ ‿ වැනි සංකේත රිද්ම රටා ප්‍රස්තාරකරණයේ දී වැදගත් වන බව.
> - කිසියම් ක්‍රමානුකූල රටාවකට අනුව ස්වර යෙදීමෙන් තනුවක් නිර්මාණය කරගත හැකි බව.

(මිනිත්තු 60යි )

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- රිද්ම රටාවකට ස්වර යෙදීමෙන් තනු නිර්මාණය පිළිබඳ අත්හදා බැලීම් කරයි.
- රිද්ම රටාවකට අනුව ස්වර යෙදීමේ පුහුණුව ගී තනු නිර්මාණයට පෙරහුරුවක් බව පිළි ගනී.
- විවිධ රිද්ම රටා නිර්මාණය කරමින් ඊට ස්වර යොදයි.
- ස්වර රටා යම්කිසි ක්‍රමයකට යොදමින් ගී තනු නිර්මාණයට පෙළඹෙයි.
- නව තනු නිමවමින් තම නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

ඇමුණුම 6.1.2.1

**ගවේෂණ පත්‍රිකාව**

1. මාත්‍රා 2 න් 2 විවිධ රිද්ම රටා සඳහා ස්වර යෙදීම

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|
| x | x | x | x | x | x | x | x |
| x | – | x | x | x | – | x | x |
| x | – | – | xx | x | x | xx | x |
| x | x | x | x | x | – | – | – |
| x | x | x | x | x | – | – | – |

- මෙහි පේළි ගණන 10 ක් වනසේ ඔබට අභිමත රිදම රටා ලියා ස්වර යොදන්න.

මාත්‍රා 3 විවිධ රිද්ම රටා සඳහා ස්වර යෙදීම

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | – | – | x | – | – | x | – | – | x | x | – |
| x | x | x | x | – | – | x | x | x | x | – | – |
| + | xx | – | + | xx | – | x | x | xx | x | – | – |

පේළි ගණන 5 ක් නොඉක්මවන සේ ස්වර රටා යොදන්න.

03. මාත්‍රා 4 විවිධ රිද්ම රටා සඳහා ස්වර යෙදීම

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | x | x | x | x | – | – | – | x | x | x | x | x | – | – | – |
| x | – | x | – | x | – | x | – | x | – | – | – | – | – | – | – |
| x | x | x | x | x | – | – | – | x | x | x | x | x | – | – | – |

04. බෙම්ටෝ තාලයට ගොඩනැගූ රිද්ම රටාවට ස්වර යෙදීම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| xxx | x–– | xxx | x–– | xxx | xxx | x–– | ––– |

ඔබ කැමති ප්‍රමාණයකට මේ රිද්ම රටාව ගොඩනඟා ඊට ගැලපෙන ස්වර යොදන්න.

ඇමුණුම 6.1.2.2

උපදෙස් පත්‍රිකාව


මෙයට පෙර පාඩමේ දී විවිධ රිද්ම රටා ගොඩ නැගීමට ඔබ සමත් විය. එසේ ගොඩ නගන ලද රිද්ම රටාවන්ට ස්වරය යොදා තනුවක් නිර්මාණය කර ගැනීමට මේ පාඩමින් හුරුව ලබමු.

මාත්‍රා දෙකෙන් දෙක රිද්ම රටාවකට අනුව ගැයෙන ව්‍යවහාරික සංගීතයේ ජනප්‍රිය ගීතයක් තුළ ගොනුවී ඇති පද හා ස්වර පිළිබඳව අධ්‍යයනයක් කරමු.



- ඒ අනුව මාත්‍රා දෙකෙන් දෙකට යෙදී ඇති රිද්ම රටාවේ ' x ' සළකුණට සමාන්තරව ස්වරයක් හා අකුරක් යෙදී ඇති අයුරු පැහැදිලි වේ.
- '-' සළකුණ පද හා ස්වර ඇඳීමේ දී යොදා ඇත. පද ඇදීම සඳහා 'S ' අකුර යොදා ගැනීම ව්‍යවහාරික සංගීතයේ පවතින ප්‍රස්තාර රීතියකි. ස්වර ඇදීමට '-' (කෙටි කඩ ඉර) සළකුණ භාවිත කෙරේ.
- මෙසේ විවිධ තාල වලට බැඳී රිද්ම රටාවකට ස්වර යෙදිය හැකිවේ.
- තවත් එසේ ජනප්‍රිය ගීතයකට පද කොටසක් ගෙන අවධානය යොමු කරමු. මෙය බෙම්ටො තාලයට අනුව පද බැඳුනෙකි.

උදා -





- මේ අනුව රිද්ම රටාවන් අනුව පද හා ස්වර යෙදීමේදී සැළකිය යුතු කරුණු කිහිපයක් වෙයි.

- පද මාලාවේ විරිත් ලක්ෂණය පද බෙදී ඇති රිද්මය


උදා - 2 න් 2 ට, 3 න් 3 ට, 4 න් 4 ට

- ගීතයක නම් පද මාලවේ අර්ථය ඉස්මතු වන සේ ස්වර යෙදීම

උදා -



- රිද්ම රටාවේ සුවිශේෂී තැන්




(සැළකිය යුතුයි + ලකුණ යෙදෙන්නේ විරාම ස්ථාන දැක්වීම සඳහා ය.)

1. රිද්ම රටාවකට ස්වර යෙදීමේ දී ඒ සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේද කිහිපයකි. ආරෝහණ /අවරෝහණ ලක්ෂණයට අනුව ස්වර යෙදීම

2. ආරෝහණ/ අවරෝහණ ස්වරූපයෙන් ස්වර කිහිපයක් මග හැර ස්වර යෙදීම.
උදා - සගගරි / ගමප - / පධනිධ / ප - - -


3. කිසියම් රටාවකට අනුව ස්වර යෙදීම
උදා -



4. එක් ස්වරයක් යෙදීම ස්වර දෙකක් යෙදීම හෝ ඊට එක් සංඛ්‍යාවක් යෙදීමට සුදුසු පරිදි තීරණය කළ යුතු ය.

5 මෙහි සඳහන් ක්‍රම වේදයන්ට අමතරව ඔබගේ අදහස් එක් කරමින් ඇමුණුම 6.1.2.1. ගවේෂණ කාර්ය පත්‍රිකාවේ සඳහන් අභ්‍යාස සඳහා සුදානම් වන්න. කණ්ඩායම් ක්‍රියාකාරකම් ඔබේ පෞද්ගලික සටහන් පොතේ සටහන් කරගන්න.

ඇමුණුම 6.1.2.2



නිපුණතාව 7.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

ක්‍රියාකාරකම 7.1.1 : 'රිද්ම රටා ප්‍රස්තාර කරමු'

කාලය : කාලච්ඡේද 2 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.1.1, ඇමුණුම 7.1.1.2 ඇතුළත් චිත්‍ර
- ඇමුණුම 7.1.1.3, කාර්ය පත්‍රිකා පිටපත්
- සර්පිනාව, තම්මැට්ටම වැනි අවනද්ධ භාණ්ඩයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1.1 :
- ඇමුණුම 7.1.1.1 ඇතුළත් චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- එම චිත්‍රයේ ස්වභාවය විමසන්න.
- එම චිත්‍ර තුළ හැඩ තල යෙදී ඇති අයුරු විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින්, සාකච්ඡාවක යෙදෙන්න.
  - එකම හැඩතල නැවත නැවත කිසියම් ආකාරයට පෙළ ගැසීම නිසා මෝස්තරයක් ගොඩ නැගෙන බව හා රටාවක් මැවෙන බව
  - මෝස්තරයක් තුළ රිද්මයක් ඇති බව
  - කිසියම් රිද්මයක් නැවත නැවත පෙළ ගැසීම තුළින් රිද්ම රටාවක් ගොඩ නැගෙන බව.
  - සංගීතමය හඬ ද නැවත නැවත පෙළ ගැසීම තුළින් රිද්ම රටාවක් ගොඩ නැගෙන බව.

(මිනිත්තු 10යි)

පියවර 7.1.1.2 :
- දෘශ්‍ය උපකරණය 7.1.1.2 ප්‍රදර්ශනය කරන්න.
- එහි දැක්වෙන ස්වර ප්‍රස්තාරය සිසුන් සමඟ ගයන්න.
- ස්වර ප්‍රස්තාරයට අයත් රිද්මය දෘශ්‍ය උපකරණයේ දැක්වෙන අංක යොදා ගනිමින් කිහිපවරක් සිසුන් ලවා කියවන්න.
- කතිර ලකුණු වලින් දැක්වෙන අන්දමට රිද්ම රටාව අත්තලමින් නිරූපනය කරවන්න.
- එය ප්‍රස්තාර කර ඇති ආකාරය පහදා දෙන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 7.1.1.3 කාර්ය පත්‍රිකාවේ දැක්වෙන උපදෙස් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.
- ස්වයං අධ්‍යයනයට මග පෙන්වන්න.

(මිනිත්තු 40 යි)

පියවර 7.1.1.3 :
- ප්‍රස්තාර කළ රිද්ම රටා කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- ක්‍රියාකාරකමට අදාළ ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් කරන්න.
- හැකි අවස්ථාවකදී සිසුන් ලවා රිද්ම රටා ප්‍රතිනිර්මාණය කිරීමට මග පෙන්වන්න.

- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.


| |
|---|
| • සංගීතයේ ගායන වාදන වලට රිද්මයක් සහ රිද්මරටාවක් යෙදෙන බව.<br>• භාණ්ඩ මගින් කරනුයේ මෙවැනි රිද්ම රටාවන්ට නාද ලබාදෙන බව<br>• එම රිද්ම රටාවකට අවනද්ධාක්ෂර යෙදීමෙන් තාලපදයක් බිහිවන බව.<br>• එකම තාලයක එක් එක් විභාගයේ රටාව විවිධ අයුරින් වෙනස් කිරීමෙන් අලංකාර තාල රූප ගොඩනැගෙන බව |

(මිනිත්තු 30යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- රිද්මය සහ රිද්ම රටාවේ වෙනස පැහැදිලි කරයි.
- ගායන වාදන තුළ රිද්ම රටා යෙදෙන බව පිළිගනියි.
- විවිධ රිද්ම රටා ශ්‍රවණය මගින් හඳුනා ගනිමින් ප්‍රතිනිර්මාණය කරයි. ප්‍රස්තාර කරයි.
- එදිනෙදා ජීවිතයේ දී තමාට අසන්නට ලැබෙන ගායන වාදනවල ඇති රිද්ම රටා වන්හි විවිධතා හඳුනා ගනියි.
- තම ජීවිතයේ සියළු කාර්යයන් කිසියම් රිද්මයක අනුව හැඩගසා ගනියි

ඇමුණුම 7.1.1.1

දෘශ්‍ය උපකරණය 01



ඇමුණුම 7.1.1.2

දෘශ්‍ය උපකරණය 02

A

| | | | |
|---|---|---|---|
| ස ස රි | ග - - | ම ග රි | ස - - |
| ග ග ම | ප ප ධ | ප - - | - - - |
| ප ප ධ | නි - - | ස් නි ධ | ප - - |
| ධ ධ ප | ම ප ම | ග - - | - - - |

B

| | | | |
|---|---|---|---|
| 1 2 3 | 1 - - | 1 2 3 | 1 - - |
| 1 2 3 | 1 2 3 | 1 - - | - - - |

C

| | | | |
|---|---|---|---|
| x x x | x - - | x x x | x - - |
| x x x | x x x | x - - | - - - |

ඇමුණුම 7.1.1.3

කාර්ය පත්‍රිකාව 01

ගුරුවරයාට උපදෙස්.

- පහත දැක්වෙන සේ මාත්‍රා තුනේ සහ හතරේ රිද්ම රටා ගොඩ නගා ගන්න.
- එක් එක් රිද්ම රටාව මාත්‍රා බෙදෙන අයුරු පැහැදිලිවනසේ තම්මැට්ටමක් වැනි අවනද්ධ භාණ්ඩයකින් වයමින් හෝ වෙනත් ආකාරයකට තට්ටු කරමින් කිහිප වරක් සිසුන් ශ්‍රවණයට යොමු කරන්න.

- සිසුන් කණ්ඩායම් වශයෙන් ගෙන ඇසෙන රිද්ම රටාව ප්‍රස්තාර කරවීමට යොමු කරන්න.

මාත්‍රා තුනේ රිද්ම රටා

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| X | X | X | X | - | - | X | X | X | X | - | - |
| X | XX | XX | X | - | - | X | XX | XX | X | - | - |
| XX | XX | XX | X | - | - | XX | XX | XX | X | - | - |
| X | - | XX | X | - | - | X | - | XX | X | - | - |

මාත්‍රා හතරේ රිද්ම රටා

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| X | - | X | - | X | X | X | X |
| XX | XX | X | XX | XX | XX | X | - |
| X | XX | XX | XX | X | XX | X | - |
| XX | X | XX | X | XX | XX | X | - |

සිසුන්ට උපදෙස් -

- ඔබට ඇසෙන රිද්ම රටාව හොඳින් ශ්‍රවණය කරන්න.
- එහි එක් එක් මාත්‍රාවට අයත් හඬ වෙන්කොට හඳුනාගන්න.
- එක් එක් මාත්‍රාවට අයත් හඬ කතිර ලකුණක් යොදා ගනිමින් ලියා දක්වන්න.
- රිද්ම රටාව තාලානුකූලව ප්‍රස්තාර කර දක්වන්න.
- විවෙක අවස්ථාවන්හි දී ඔබට ඇසෙන ගීතවලට වාදනය කර ඇති තාල තුළ ඇති රිද්ම රටා ප්‍රස්තාර කිරිමට උත්සාහ ගන්න.
- එසේ ගොඩ නැගෙන රිද්ම රටා උපකරණයකින් තට්ටු කරමින් හෝ වාද්‍ය භාණ්ඩයකින් නැවත නැවත ප්‍රතිනිර්මාණය කරන්න.

නිපුණතාව 7.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් සංගීත කෘති ඇසුරු කරයි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

ක්‍රියාකාරකම 7.1.2 : 'ලිඛිත ගී පද ගැයුමෙහි වෙනස' හඳුනා ගනිමු.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- කාර්ය පත්‍රිකා අංක 7.1.2.1, 7.12.2.. 7.1.2.3
- සර්පිනාවක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.2.1 :
- ඇමුණුම් 7.1.2.1 හි දැක්වෙන 'සුවඳ රෝස මල් නෙලා' ගීතය ගයා වයා පෙන්වන්න.
- කාර්ය පත්‍රිකා 7.1.2.2 හි දැක්වෙන ක්‍රියාවන්හි සිසුන් යොදවන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - ලිඛිතව දැක්වූ ගී පද ගායනයේ දී තාලයට රිද්මයට අනුව ඇඳ පැද ගැයෙන බව
  - තාලයකට ගැයෙන ගී පද ශ්‍රවණය කර ප්‍රස්තාර කළ හැකි බව
  - ගායනයේ හෝ වාදනයේ තාල ලක්ෂණය ඇතිවන බව
  - සඳැස්මත් හා ගීමත් නිර්වචනය කළ හැකි බව

(මිනිත්තු 20 යි)

පියවර 7.1.2.2 :
- කාර්ය පත්‍රිකා 7.1.2.2 හි දැක්වෙන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- කාර්ය පත්‍රිකා 7.1.2.2 හි දැක්වෙන ක්‍රියාකාරකමෙහි යොමු කර ගවේෂණයේ යොදවන්න.
- වෙන්කර දැක්විය හැකි කොටස් සිසුන්ට කියවීමට සලස්වන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කාර්ය පත්‍රිකා අංක 7.1.2.3 කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 40 යි)

පියවර 7.1.2.3
- සපයාගත් තොරතුරු කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- ක්‍රියාකාරකමට අදාල ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 20)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක
- සැඳැස්මත් හා ගී මත් යනු විස්තර කරයි.
- සැඳස්මත් ගණන ගායනයේ දී වෙනස්විය හැකි බව පිළි ගනියි.
- සැඳස්මත් , ගීමත් ගණනය කරයි.
- අප අසන ගී වල ලිඛිත පද, ගායනයේ දී තාලයට අනුගත වන අයුරු විමසයි.
- ගායනයට උචිත වනසේ මාත්‍රා පිහිටුවා ගී පද නිර්මාණය කරයි.

ඇමුණුම 7.1.2.1

සුවඳ රෝස මල් නෙලා

සුවඳ රෝස මල් නෙලා මාල ගොතාලා
ගෙලේ දමා ඉනේ ඔතා සිරස සදාලා
දෑස සිනියා පිච්ච ඩේලියා
බලා නෙලා ගනිමි මෙම
උයනෙ සරාලා

මාල ගොතාලා ගීත ගයාලා
තබා පතුල් රඟන රඟා
බලමු සියල්ලා //

මිහිරි ගීත ගයා ගයා පේලි සෑදීලා
සිනා පපා වටේ යතා නටති පීනලා
බාල වූ ළමා සදති මල් දමා
දෙපා පදින් පදට තබා
කිකිණි සලාලා


දෑත නගාලා - නේත්‍ර විදාලා
ළමා කමල් සැදෙති සුරන්
රඟ පරදාලා

පද රචනය - ආර්. එන්. එච්. පෙරේරා
ගායනය - සී. ටී. ප්‍රනාන්දු

කාර්ය පත්‍රිකාව - ඇමුණුම 7.1.2.2

ගුරුවරයාට උපදෙස්

- පහත දැක්වෙන ගී පද දෙක ගයා වයා පෙන්වන්න.




- ගායනය සමග අත්තැලීම ආරම්භ කරන්න.
- අත්තැලීම මත වචන වෙන්වන අයුරු පිළිබඳව සිසු අවධානය යොමු කරන්න.
- පද ප්‍රස්තාර කිරීමට උපදෙස් දෙන්න.

සිසුන්ට උපදෙස්

- ගුරුවරයා ගයා/වයා පෙන්වන ගීතය ගුරුවරයා සමග සෙමින් ගායනය කරන්න.
- එම ගීතයේ තාලයට අත් තලන්න.
- ඒ අනුව ගීත පද දෙක පද ප්‍රස්තාර කරන්න.
- ගුරුවරයාට ඉදිරිපත් කර නිවැරදි කර ගන්න.

කාර්ය පත්‍රිකාව - ඇමුණුම 7.1.2.3

ගුරුවරයාට උපදෙස්

- පහත දැක්වෙන ජන කවිය ප්‍රදර්ශනය කරන්න.
  කොබෝ කුරුලු වනේ
  එබෝ සතුනි වනේ
  හබන් කුකුලු වනේ
  කිව මගෙ දරුවනේ

- පහත දැක්වෙන ගී පාදය කලු ලෑල්ලේ ලියා සිසුන්ට දර්ශනය වන සේ ලඝු ගුරු සංකේත යොදන්න.
  <u>කො</u> බෝ + <u>කු</u> <u>රු</u> <u>ලු</u> <u>ව</u> නේ
  ලඝු අක්ෂර 05- මාත්‍රා 05
  ගුරු අක්ෂර 02- මාත්‍රා 04
  සම්පූර්ණ මාත්‍රා ගණන - 09
- අනෙක් පාද ද මේ අනුව අක්ෂර වෙන්කොට මාත්‍රා ගණනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පහත දැක්වෙන සටහන කියවීමට සලස්වන්න.

> ගීතයක එක් එක් පාදයේ ලඝු ගුරු ආදී අක්ෂර වලට හිමි මාත්‍රා ගණන 'සඳැස්මත් '' නැතහොත් ' ජන්දස්මාත්‍රා' නමින් හැඳින්වේ. ඒ අනුව කොබෝ කුරුලුවනේ නම් ගී පාදයේ සැඳැස්මත් ගණන 09 කි.

- එම ජන ගීය ගායනය කර පෙන්වන්න.
- ගායනය කරන අතර තුර සිසුන් තාල තැබීමට යොමු කරන්න.
- අත්තැලීම හා තාලය අනුව පද බෙදීමට සලස්වන්න.
- පළමු පියවර

  කොබෝ / කුරුලු/ වනේ /

- දෙවන පියවර

  තාලයේ ගති ලක්ෂණය පෙනෙන සේ ඇදෙන තැන් කඩඉරකින් දක්වමින් ඒකක 03 ක් පෙනෙන සේ සම්පූර්ණ කරවන්න.

  කොබෝ -/ කුරුලු /වනේ - / - - -/

- පළමු පාදයේ ඒකක සංඛ්‍යාව නැතහොත් මාත්‍රා ගණන ගණන් කිරීමට යොමු කරන්න.
- පහත දැක්වෙන සටහන කියවීමට සලස්වන්න.

> ගීතයක් ගායනයේ දී පාදයේ අක්ෂරවලට හිමි මත් ගණන බොහෝ විට වැඩිවේ. ඉතා කලාතුරකින් අඩුවන අවස්ථා ද ඇත. ගීතයක් ගායනයේදී හිමි වන මත් ගණන '' ගී මත්'' නම් වේ. ඒ අනුව ඉහත ගී පාදයේ ගීමත් ගණන 12 කි.

- කාර්ය පත්‍රිකාව අංක 7.1.2.3 පහත දැක්වෙන ගී පාදවල සැදූස්මත් හා ගීමත් ගණන සොයන්න (ගායනය කරන ආකාරය අනුව ප්‍රස්තාර කර ඇත.) ගුරුවරයාගේ ගායන හඬට සවන් දෙන්න.

1. මොර / හිඹුටු / දම් / පනා - /

2. සදවා / sසුදු / වැලිපි / විතුරු /

4. නුඹෙ අම් / මා - - - / කි ර ට ගි / යා - - - /

5. බුද්ධ / ං සර / ණේ - - /- - -/
   සිර ස / දරා - / ගෙන - /- - -/

6. මාs ල් මල් / මල් මල් මල් / මාs sල් මල් /මල් මල් මල්

   මාs ල් මල් / මල් මල් මල් / මා ල s / s s s

| | | |
|---|---|---|
| නිපුණතාව 7.0 | : | සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් සංගීත කෘති ඇසුරු කරයි. |
| නිපුණතා මට්ටම 7.1 | : | ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි. |
| ක්‍රියාකාරකම 7.1.3 | : | යති යෙදෙන ගී පද ප්‍රස්තාර කරමු. |
| කාලය | : | කාලච්ඡේද 02 |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 7.1.3.1 හා ඇමුණුම 7.1.3.2 කාර්ය පත්‍රිකා<br>• සර්පිනාවක් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය.

පියවර 7.1.3.1

- සෙත්සිරි දෙන මහ ගුණ මුහු දානන් ' මාත්‍රා 4 න් 4 ට ගයා වයා දක්වන්න.
- '' පිනවන දුටුදන සැම'' ගීතය මාත්‍රා 4 න් 4 ට ගයා/වයා දක්වන්න.
- එම ගීත දෙක අතර වෙනස සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පහත කරුණු මතු කරමින් කෙටි සාකච්ඡාවක් කරන්න.

> - ගී පද වල මත් සංඛ්‍යාව බොහෝවිට ලිඛිත තත්ත්වයට වඩා ගායනයේ දී වෙනස්වන බව
> - එසේ වනුයේ ඇඳ පැද ලෙලවා විවිධ අලංකාර යොදා ගායනය කරන නිසා බව
> - ගායනයේ දී පද අතර සමබරතාවය රැකිය යුතු බව

(මිනිත්තු 10යි)

පියවර 7.1.3.2 :

- කාර්ය පත්‍රිකා අංක 1 හි දැක්වෙන ක්‍රියාකාරකමෙහි සිසුන් සමග යෙදෙන්න.
- සාකච්ඡා කරන්න
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කාර්ය පත්‍රිකා අංක 02 බෙදා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 60 යි)

පියවර 7.1.3.3 :

- සපයා ගත් තොරතුරු කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- ක්‍රියාකාරකමට අදාළ ප්‍රශ්න නගමින් සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවේ යෙදෙන්න

> - ගීත ඇඳ පැද ලෙලවා අලංකාරව ගැයීම නිසා යති පිහිටන බව
> - අවශ්‍ය තන්හි යතිය පිහිටුවීම නිරායාසයෙන් සිදුවන්නක් බව
> - ඉන් ගී පාදයන්හි සමබරතාවය රැකෙන බව
> - ප්‍රස්තාර කිරීමේ දී යතිය පිළිබඳ සැළකිලිමත් විය යුතු බව

(මිනිත්තු 10 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- යතිය යනු පැහැදිලි කරයි.
- යතිය නිරායාසයෙන් පිහිටන ලක්ෂණයක් බව පිළි ගනී.
- යති සහිත ගී පද ප්‍රස්තාර කරයි
- නිර්මාණකරණයේ දි ගීතයක් අලංකාර කර ගැනීම සඳහා මෙවැනි අංග වැදගත් බව පිළිගනී.
- යතිය සහිත ගී  පද ලැයිස්තු ගත කරයි.

කාර්ය පත්‍රිකා අංක 1

ගුරුවරයාට උපදෙස්

ඇමුණුම 7.1.3.1

- වචනවලට හිමි මත් ගණන සහ ගායනයේ දී ලැබෙන මත් ගණන වෙන්කර හඳුනාගැනීමට හැකි වනසේ පහත දැක්වෙන ගී පද කළුලැල්ලේ ලියා දක්වන්න.
  කොබෝ - කුරුලු වනේ - සැදූස්මත් 09

- පළමු හා දෙවන පද ගයා /වයා දක්වන්න
- ගායනය කරන ආකාරය අනුව පද ප්‍රස්තාර කර දක්වන්න

  කොබෝ - / කුරුලු -/ වනේ -/ - - - /  - ගීමත් 12 කි

- 'නේ' යන අක්ෂරයට හිමි මත් ගණන 2 ක් බවත් ගායනයේ දී එය මාත්‍රා  5 ක් දක්වා වැඩිවන බවත් සාකච්ඡා කරන්න. පහත දැක්වෙන සේ ලියා පෙන්වන්න.

  කොබෝ - / කුරුලු /වනේ - / - - - /

පහත දැක්වෙන සටහන කියවීමට සලස්වන්න.

| |
|---|
| ගීයක කිසියම් අක්ෂරයකට හිමි මත් ගණනට වඩා වැඩි වනසේ යෙදී ඇති තැන' යතිය' නමින් හැඳින්වේ . ඒ අනුව ඉහත ගීයේ යතියට හිමි මාත්‍රා ගණන 5 කි. එනම් 'නේ .... ' යන කොටසය. ගායනයේ දී අලංකාරය හා සමබර තාවය රැකෙන අන්දමට යතිය යෙදේ. යති නොමැති ගීතද භාවිතයේ ඇත. පද මැද හා අග  යති පිහිටන අවස්ථා ද ඇත. |

ඇමුණුම 7.1.3.2

කාර්ය පත්‍රිකා 02

පහත දැක්වෙන ගී පදවල සැඳැස්මත් ගණන සොයන්න.

1. උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා
2. බුද්ධං සරණේ සිරස දරාගෙන
3. සෙත්සිරි දෙන මහ ගුණ මුහු දානන්

- ඉහත ගී පද ගුරුතුමා /තුමිය ගායනය කරන ආකාරය අනුව පද ප්‍රස්තාර කරන්න.
- එක් එක් ගී පාදයේ ගීමත් ගණන සොයන්න.
- ගී පද ලියා යතිය පිහිටන තැන ලකුණු කරන්න.
- පද අග යති, පද මැද, ග යති පිහිටන (සයතිපැදි) සහ යති නැතිපැදි (නියති පැදි ) වශයෙන් ඉහත ගී පද තුන වර්ග කරන්න.
- යතිය නිසා ගායනයේ දී සිදුවන වාසි කිහිපයක් ලියන්න
- යතිය යනු පැහැදිලි කරන්න.
- ගුරුතුමි/ තුමිය සමග සමාලෝචනයක යෙදෙන්න.

නිපුණතාව 7. : සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරුකිරීමටත්. දේශීය සංගීතාංග ලෝකයවෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

නිපුණතාමට්ටම 7.2 : බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි.

ක්‍රියාකාරකම 7.2.1 : '' බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරමු ''

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.2.1.1 හා ඇමුණුම 7.2.1.2, ඇමුණුම 7.2.1.3 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- කාර්යපත්‍රිකා ඇමුණුම 7.2.1.4 ඡායාපිටපත්
- බටහිර ප්‍රස්තාර කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 7.2.1.1 :

- ඇමුණුම 7.2.1.1 ඇතුළත් හින්දි ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති '' පියාකී නජරියා '' ගීතය ස්වර ප්‍රස්තාරය මත ඇති වචන පෙන්වමින්, ස්වර සහ පද යෙදී ඇති අයුරු දක්වමින් ගයන්න.
- ඇමුණුම 7.2.1.2, ඇතුළත් ව්‍යවහාරික සංගීත ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති '' කොපර කොපර පිපිඤ්ඤා '' ගීතය ස්වර ප්‍රස්තාරය මත ඇති ස්වර සහ විවිධ සංකේත යෙදී ඇති අයුරු දක්වමින් ගයන්න.
- ඇමුණුම 7.2.1.3, ඇතුළත් බටහිර සංගීත ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති '' ලංකා ලංකා '' ගීතය ස්වර ප්‍රස්තාරය මත ඇති ස්වර සහ විවිධ සංකේත යෙදී ඇති අයුරු දක්වමින් ස්වර ගායනය කර පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

  - එක් එක් සංගීත පද්ධතීන්ට ආවේනික වූ විවිධ ස්වර ප්‍රස්තාර ක්‍රම ඇති බව.
  - ශ්‍රී ලංකාවේ ඉහත ප්‍රස්තාර ක්‍රම තුනම භාවිත වන බව.
  - ඉංග්‍රීසි බස යොදා ගනිමින් අපේ රටට ආවේනික දේ අනෙක් රටවලට සන්නිවේදනය කළ හැකි වන්නා සේ බටහිර ස්වරප්‍රස්තාර කිරීමේ ක්‍රමය යොදා ගනිමින් අපේ රටේ ගායන වාදන අනෙක් රටවලට ද හඳුන්වා දිය හැකි බව.
  - බටහිර සංගීත ප්‍රස්තාර ක්‍රමය ඉගෙනීමෙන් විශ්ව සංගීතය අධ්‍යයනය කළ හැකි බව.
  - ඒ මගින් අන්තර්ජාලයේ ඇති සංගීත ප්‍රස්තාර ද ගායනයේ වාදනයේ යොදා ගත හැකි බව.

(මිනිත්තු 20 යි)

පියවර 7.2.1.2 :
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 7.2.1.4 කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ දැක්වෙන උපදෙස් පහදා දෙන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.
- ස්වයං අධ්‍යයනයට මගපෙන්වන්න.

(මිනිත්තු 40 යි. )

පියවර 7.2.1.3 :
- ප්‍රස්තාර කළ කොටස් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- ක්‍රියාකාරකමට අදාල ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් කරන්න.
- හැකි අවස්ථාවකදී සිසුන් ලවා ශුද්ධ ස්වර පමණක් ඇති සරල ප්‍රස්තාර බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමට මග පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • බටහිර ප්‍රස්තාර ක්‍රමයේ දී ලෝකය පිළිගත් සම්මත හා නිශ්චිත සංකේත යොදා ගන්නා බව<br>• විවිධ අදහස් ප්‍රකාශ කිරීමට රූපමය අයුරින් විවිධ සංකේත යොදා ගන්නා බව<br>• ඒ එක් එක් සංකේතයට නියමිත පිළිගත් හැඩයක් තිබෙන බව<br>• ප්‍රස්තාර කඩදාසියේ සෑම ස්වරයකටම/ සංකේතයකට ම වෙන්වූ ඉඩක් ඇති බව<br>• ප්‍රස්තාර ලිවීමට රේඛා 5 ක මණ්ඩල සහිත කඩදාසියක් හැම විටම යොදා ගන්නා බව.<br>• සංගීත නිර්මාණකරුවා නිර්මාණය කළ සංගීත ප්‍රස්තාරය ඔහුගේම අදහසට අනුව ඒ ආකාරයෙන්ම සෑම පුද්ගලයෙකු ලවා එකම අයුරකින් ගායනය හෝ වාදනය කිරීමට බටහිර ප්‍රස්තාර ක්‍රමයෙන් ඉඩ සැළසෙන බව. |


(මිනිත්තු 20 යි )

තක්සේරු සහ ඇගයීම් නිර්ණායක

- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති විවිධ සංකේත පැහැදිලි කරයි.
- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති වාසිදායක තත්වයන් පිළිගනියි.
- ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ප්‍රස්තාර බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරයි.
- එදිනෙදා ජීවිතයේ දී හමුවන බටහිර ප්‍රස්තාර කොටස් පෙරදිග ක්‍රමයට පෙරලමින් භාවිත කරයි.
- පොත්, පුවත්පත්, සඟරා වල හමුවන පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කළ ගීත බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරයි.


ඇමුණුම 7.2.1.1

දෘශ්‍ය උපකරණය 01





දෘශ්‍ය උපකරණය 01

ඇමුණුම 7.2.1.2



ඇමුණුම 7.2.1.3

දෘශ්‍ය උපකරණය 03



**කාර්යපත්‍රිකාව** ඇමුණුම 7.2.1.4


( බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරමු.)

මෙම කාර්ය පත්‍රිකාවේ ඇති උපදෙස් අවධානයෙන් යුතුව කියවමින් දී ඇති රූප සටහන් හොඳින් අධ්‍යයනය කරමින් කොටසින් කොටස ඔබේ අභ්‍යාස පොතේ ගොඩ නගන්න. මේ සඳහා බටහිර සංගීතයට වෙන්වූ ප්‍රස්තාර කඩදාසියක් භාවිත කිරීම වඩාත් ප්‍රතිඵලදායකය.


01. මිලිමීටර් 3 ක් පමණ පළලකින් රේඛා 11 ක් පැන්සලයකින් අඳින්න. ( එකම පළලක් භාවිත කරන්න)

02. 6 වන රේඛාව මකා දමන්න.

03 මකා දැමූ රේඛාව මධ්‍ය '' ස '' ස්වරයට අයත් රේඛාවයි. මෙම සෑම රේඛාවන් මත සහ සෑම රේඛාවන් දෙකක් අතරත වශයෙන් එක් එක් ස්වර පිහිටයි. පහත රූපසටහනේ දැක්වෙන පරිදි රේඛාව මත සහ රේඛාවන් අතරත වශයෙන් ස්වර ලකුණු කරන්න. මෙහිදී ස්වර ලකුණු කිරීම සඳහා රූප සටහනේ දැක්වෙන පරිදි ඕවල් හැඩයේ දකුණට ඇලවුණු ස්වභාවයේ ( රවුමක්) සංකේතයක් යොදා ගන්න. අත හුරු වීමට 10 වරක් අඳිමින් අභ්‍යාසයේ යෙදෙන්න.



04. මකා දැමූ රේඛාව මධ්‍ය '' ස '' ස්වරයට අයත් රේඛාවයි. මධ්‍ය ස ස්වරයෙන් ඉහළට මධ්‍ය සහ උච්ච ස්වරත් මධ්‍ය ස ස්වරයෙන් පහළට මන්ද්‍ර ස්වරත් පිහිටයි. ඒ අනුව ඉහළ රේඛා පහේ මධ්‍ය හා උච්ච ස්වරත්, පහළ රේඛා පහේ මන්ද්‍ර ස්වරත් පිහිටයි. මෙවැනි සමාන්තර රේඛා 5 ක් Staff නැතහොත් Stave යනුවෙන් හඳුන්වයි. මධ්‍ය හා උච්ච ස්වර ඇතුළත් කරන රේඛා 5 නම්කරනුයේ Treble Clef යනුවෙනි. මන්ද්‍ර ස්වර ඇතුළත් කරන රේඛා 5 නම්කරනුයේ Bass Clef යනුවෙනි. එම රේඛා සමූහ වෙන්ව හඳුනා ගැනීමට සංකේත දෙකක් භාවිත වේ. පහත දැක්වෙන රූපසටහනේ පරිදි ඇඳ දක්වන්න.( මෙය ඇඳීමට පෙර අංක 5 සහ 6 ඡේද කියවා එහි දැක්වෙන කාර්යයන් නිම කරන්න. එය ඔබට මෙය නිවැරදිව ඇඳීමට මග පෙන්වනු ඇත )




05. එම සංකේත ඇඳීමට පහසු කර ගැනීමට පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න. රේඛා 5 මත එක් එක් සංකේතය ඇඳීමට පටන් ගන්නා ස්ථානය හොඳින් හඳුනා ගන්න. ගුරුවරයාගෙන් අසා දැනගන්න.




06 ට්‍රෙබල් ක්ලෙෆ් සංකේතය අයත් වන්නේ ඉහළ රේඛා පහටය. එය ඇඳීමට පටන් ගන්නේ රේඛා පහේ පහළ සිට දෙවැනි රේඛාවේ සිටය. එහි ඇති රවුම් හැඩය පහළ සිට දෙවන රේඛාව වටා පිහිටයි. බේස් ක්ලෙෆ් සංකේතය ඇඳීමට පටන් ගන්නේ රේඛා පහේ ඉහළ සිට ඇති පළමු රේඛාවේ සිටය. එහි ඇති රවුම් හැඩය ද ඉහළ සිට දෙවන රේඛාව වටා පිහිටයි. ඔබ ඇඳ ගත් රේඛා මණ්ඩලයක් තුල හෝ බටහිර ප්‍රස්තාර කඩදාසියක ඉහත සංකේත දෙක 10 වරක් බැගින් අඳින්න. ( අංක 4 ඡේදයේ දැක්වෙන රූපසටහන දැන් ඔබට නිවැරදිව අඳින්නට හැකිවනු ඇත)


07. ට්‍රෙබල් ක්ලෙෆ් සහ බේස් ක්ලෙෆ් යන දෙකම ඇතුළත් වන රේඛා 10 " Great Staff " '' ග්‍රේට් ස්ටාෆ් '' යනුවෙන් නම් කෙරේ. එහි අදහස '' මහාරේඛා මණ්ඩලය '' යන්නය. පියානෝව වාදනයේ දී වම් සහ දකුණු යන අත් දෙකම භාවිත කරමින් මන්ද්‍ර, මධ්‍ය සහ උච්ච යන සප්තකවල ස්වර එකවර වාදනය වේ. දකුණු අතින් ප්‍රධාන තනුවද, වම් අතින් ඊට ගැලපෙන ලෙස වෙනත් ස්වර ඛණ්ඩ ද වාදනය වේ. ඒ නිසා අත් දෙකම මගින් වෙන වෙනම ස්වර වාදනය කිරීමට ට්‍රෙබල් ක්ලෙෆ් සහ බේස් ක්ලෙෆ් යන දෙකම ඇතුළත් වන රේඛා 10 ම භාවිත කළ යුතුවේ.

එහෙත් වයලීනයක් වැනි එක් අතකින් පමණක් ස්වර වාදනය කරන භාණ්ඩයකට ස්වර ප්‍රස්තාර කිරීමට අවශ්‍ය වන්නේ ට්‍රේබල් ක්ලෙෆ් ඇතුළත් රේඛා 5 පමණි. චෙලෝ නම් භාණ්ඩයේ පහළ ස්වර පමණක් ඇතුළත් නිසා ස්වර ප්‍රස්තාර කිරීමට අවශ්‍ය වන්නේ බේස් ක්ලෙෆ් ඇතුළත් රේඛා 5 පමණි. මෙවැනි රේඛා 5 ක් පමණක් යොදා ගැනීමේ දී එය " Short Staff " '' ෂෝට් ස්ටාෆ් '' යනුවෙන් නම් කෙරේ. එහි අදහස '' කුඩාරේඛා මණ්ඩලය'' යන්නයි. ට්‍රෙබල් හෝ බේස් ක්ලෙෆ් තනිව යොදා ගනු ලබන අවස්ථා වලදී එම රේඛා 5 න් මතු නොවන ස්වර ලකුණු කිරීමට අවශ්‍ය අවස්ථාවලදී ඉතා කුඩා කඩ ඉරක් යොදා ගනිමින් ස්වරවලට අයත් රේඛා මතුකර ගනු ලැබේ. රේඛා පහට ඉහලින් හෝ පහලින් එසේ කඩඉරි යොදා ගනු ලැබේ. එම කඩ ඉර " Leger Line " ලෙජර් ලයින් යනුවෙන් නම් කෙරේ.


08. ට්‍රෙබල් ක්ලෙෆ් එකට අයත් ස්වර පිහිටන ස්ථාන පහත දැක්වෙන රූප සටහන මගින් අධ්‍යයනය කරන්න. පළමුව රේඛා දෙකක් අතරත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු. නිවැරදිව සංකේත යොදා ගනිමින් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න.




09. දෙවනුව රේඛා මත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු. නිවැරදිව සංකේත යොදා ගනිමින් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න.





10. බේස් ක්ලෙෆ් එකට අයත් ස්වර පිහිටන ස්ථාන පහත දැක්වෙන රූප සටහන මගින් අධ්‍යයනය කරන්න. පළමුව රේඛා දෙකක් අතරත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු. නිවැරදිව සංකේත යොදා ගනිමින් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න.





11. දෙවනුව රේඛා මත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු. නිවැරදිව සංකේත යොදා ගනිමින් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න.




12. ඔබ ලකුණු කළ ස්වර අතරත මධ්‍ය '' ස '' ස්වරය තවමත් ලකුණු කර නැත. එය පිහිටන්නේ ට්‍රෙබල් ක්ලෙෆ් රේඛා 5 ට පහළින් සහ බේස් ක්ලෙෆ් රේඛා පහට ඉහළින් ඒ දෙක අතරමැදය. ( 4 වන ඡේදයේ රූපසටහන නැවත බලන්න ) ලෙජර්ලයින් එකක් යොදා ගෙන මධ්‍ය ස ස්වරය ලකුණු කරන අයුරු පහත රූපසටහනේ දැක්වේ. එය අඳින්න. '' ස '' ස්වරයට ඉහළින් රි ස්වරයද, '' ස '' ස්වරයට පහළින් මන්ද්‍ර නි ස්වරය ද, ලකුණු කර ඇත.



13. ග්‍රේට්ස්ටාෆ් එකෙහි රේඛාවන් **මත** ස්වර පිහිටන ආකාරය දැන ගැනීමට පහත ප්‍රස්තාර සටහන නැවත අඳින්න.




14. ග්‍රේට්ස්ටාෆ් එකෙහි රේඛාවන් **අතර** ස්වර පිහිටන ආකාරය දැන් ඔබට තනිවම ලිවීමට හැකි වේ. එසේ ඇඳ ලියා අදාල ස්වර නම්කරන්න.

15. ඔබ කණ්ඩායමේ සියලු දෙනා එකතු වී පහත දැක්වෙන කාර්යයන් නිමකරන්න. මේ සඳහා ගුරුවරයා සපයන ඩිමයි කඩදාසිය භාවිත කරන්න. අවසානයේ පන්තියට ඉදිරිපත් කරන්න.

(අ ) ට්‍රෙබල් ක්ලෙෆ් රේඛා 5 පමණක් භාවිත කර මන්ද්‍ර '' ප '' ස්වරයේ සිට අති උච්ච '' ස '' ස්වරය දක්වා ආරෝහණ පිළිවෙළට ලකුණු කරන්න.

( ආ) පහත දැක්වෙන ඉංග්‍රීසි පද ඔබේ බසින් පැහැදිලි කරන්න.

a) Staff නැතහොත් Stave
b) Grate Staff
c) Short Staff
d) Treble Clef
e) Bass Clef
f) Leger Line
g) F,A,C,E, ට්‍රෙබල් ක්ලෙෆ් තුළ පිහිටන්නේ කෙසේද?
h) E,G,,B, D, F, ට්‍රෙබල් ක්ලෙෆ් තුළ පිහිටන්නේ කෙසේද?

නිපුණතාව 7. :සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

නිපුණතාමට්ටම 7.2 : 'බටහිර සංගීත ප්‍රස්තාර කරණයේ මූලිකාංග විමසයි.'

ක්‍රියාකාරකම 7.2.2 : '' බටහිර ප්‍රස්තාර කරණයෙහි සංකේත සහ වටිනාකම් විමසමු''
කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.2.1 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ඇමුණුම 7.2.2.1 කාර්යපත්‍රිකා හි ඡායාපිටපත්.
- බටහිර ප්‍රස්තාර කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර. 7.2.2.1 :
- ඇමුණුම අංක 01 ඇතුළත් ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති ස්වර නිශ්චිත ලයකට එක් එක් මාත්‍රාව පිළිබඳ අවධානය යොමුකරමින් ගායනය කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • සංගීත ප්‍රස්තාර වල දී එක් එක් ස්වර විවිධ මාත්‍රා සංඛ්‍යාවන්ගෙන් යුකත වන බව.<br>• එක් එක් සංගීත පද්ධතීන්ට ආවේනික වූ විවිධ ස්වර ප්‍රස්තාර ක්‍රම ඇති බව.<br>• බටහිර ප්‍රස්තාර වල දී එක් එක් ස්වරයේ මාත්‍රා සංඛ්‍යාව දැන්වීමට එකිනෙකට වෙනස් සංකේත භාවිත කරන බව.<br>• පෙරදිග ප්‍රස්තාර වලදී කිසියම් ස්වරයක් ඇදෙන ප්‍රමාණය දැක්වීමට කඩ ඉරි භාවිත කරන බව. |

(මිනිත්තු 20 යි)

පියවර. 7.2.2.2 :
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- කාර්යපත්‍රිකාවේ දැක්වෙන උපදෙස් පහදා දෙන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.
- ස්වයං අධ්‍යයනයට මගපෙන්වන්න.

(මිනිත්තු 40 යි )

පියවර. 7.2.2.3 :
- ප්‍රස්තාර කළ කොටස් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- ක්‍රියාකාරකමට අදාළ ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් කරන්න.
- හැකි අවස්ථාවකදී සිසුන් ලවා සරල ප්‍රස්තාර ( ස්වරස්ථාපන ගී වැනි ) බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමට මග පෙන්වන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බටහිර ප්‍රස්තාර ක්‍රමයේ සංකේත රාශියක් භාවිත වන බව.
  - ඒ එක් එක් සංකේතයෙන් විවිධ අදහස් ප්‍රකාශ කරන බව.
  - විවිධ මාත්‍රා සංඛ්‍යාවන්ට වෙන් වෙන් වශයෙන් සංකේත යෙදෙන බව.
  - ඒවා සෙමිබ්‍රිව්, මිනිම් ආදී වශයෙන් නම් කෙරෙන බව.
  - තවදුරටත් මේ සම්බන්ධව කරුණු රාශියක් ඉගෙනීමට ඇති බව සහ එම කරුණු 9,10 ශ්‍රේණිවලදී ඉගෙනීමට ඉඩකඩ ලැබෙන බව.

(මිනිත්තු 20 යි )

තක්සේරුව සහ ඇගයීම් නිර්ණායක.

- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති විවිධ සංකේත පැහැදිලි කරයි.
- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති වාසිදායක තත්වයන් පිළිගනියි.
- ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ප්‍රස්තාර බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරයි.
- එදිනෙදා ජීවිතයේ දී හමුවන සරල බටහිර ප්‍රස්තාර කොටස් පෙරදිග ක්‍රමයට පෙරළමින් භාවිත කරයි.

ඇමුණුම 7.2.2.1


දෘශ්‍ය උපකරණය 01.

1 2 3 4/1 2 3 4 / 1 2 3 4 / 1 2 3 4 /

ස - - -/ ස- - - / ස - ස - / ස - ස -/

ස ස ස ස/ ස ස ස ස/ සස සස සස සස / සස සස සස සස /

දෘශ්‍ය උපකරණය 02.



කාර්යපත්‍රිකාව 01. ඇමුණුම 7.2.2.1



මෙම කාර්යපත්‍රිකාව හොඳින් කියවමින් නියමිත කාර්යයන් ඉටුකරන්න. ගැටලු සහගත අවස්ථාවල දී ගුරුවරයාගෙන් විමසන්න.

01. පෙරදිග සංගීත ප්‍රස්තාර වල දී එක් එක් ස්වරයට හිමි මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට කඩ ඉරි භාවිත කෙරේ. උදාහරණ:- / ස - - - / මෙහි '' ස '' ස්වරය මාත්‍රා 4 ක් දක්වා ගැයේ/වැයේ. එහෙත් බටහිර සංගීතයේ දී එම එක් එක් ප්‍රමාණ දැක්වීමට එක් එක් සංකේත භාවිත කෙරේ. නිදසුන් ලෙස මාත්‍රා 4 ක කාලය හැඟවීමට සෙමිබ්‍රිව් සංකේතය  භාවිත කෙරේ.

02. එක් එක් සංකේතය ඔබේ සටහන් පොතේ ලියා දක්වා ඒවා නම් කරන්න.

03. එක් එක් සංකේතයෙන් හැඟවෙන වටිනාකම් හඳුනාගැනීමට දෘශ්‍ය උපකරණය අධ්‍යයනය කරන්න. ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

04. දෘශ්‍ය උපකරණයේ දැක්වෙන පරිදි වටිනා කම් හඳුනාගෙන පහත දැක්වෙන වගුව කණ්ඩායම සමග පුරවන්න. අවසානයේ ඔබේ පොතේ සටහන් කර ගන්න.

| | | සෙමිබ්‍රිව් | මිනිම් | ක්‍රොචට් | ක්වේවර් | සෙමි ක්වේවර් |
|---|---|---|---|---|---|---|
| සෙමිබ්‍රිව් එකකට |  | එකයි | | | | |
| මිනිම් එකකට |  | $\frac{1}{2}$ | එකයි | | | |
| ක්‍රොචට් එකකට |  | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි | | |
| ක්වේවර් එකකට |  | $\frac{1}{8}$ | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි | |
| සෙමි ක්වේවර් එකකට |  | $\frac{1}{16}$ | $\frac{1}{8}$ | $\frac{1}{4}$ | $\frac{1}{2}$ | එකයි |

02. පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය බටහිර ස්වර ප්‍රස්තාර කඩදාසියක ප්‍රස්තාර කරන්න. මෙහි දැක්වෙන්නේ මාත්‍රා 4 බැගින් වූ විභාග වේ. ක්‍රොචට් එකක වටිනාකම මාත්‍රා 01 ක් යැයි සිතන්න.

01 ම - - - /ම - - - /ම -ම- / ම - ම -/

ම ම ම ම /ම ම ම ම/ මම මම ම ම / මමමම මමමම මමමම ම/






02. 6 ශ්‍රේණියේ දී ඔබ අධ්‍යයනය කළ ස්වර ස්ථාපන ගීත අතුරින් '' කඳු කඳු නැගෙනා ගීතය '' බටහිර ස්වර ප්‍රස්තාර කඩදාසියක ප්‍රස්තාර කරන්න.

(ගුරුවරයාට උපදෙස් :- මෙම අවස්ථාවේ දී රිද්මයට අදාළ වන ටයිම් සිග්නේචරය පිළිබඳ අවධානය යොමු නොකෙරේ. අවශ්‍ය වන්නේ එක් එක් සංකේත යට හිමි මාත්‍රා ගණන් දැන ගැනීම පමණි.)


03. මෙතෙක් ඔබ අධ්‍යයනය කළේ ඉරට්ටේ සංඛ්‍යාවන්ට අදාල සංකේත වේ. මාත්‍රා 03 ක් දක්වන්නේ කේසේද? මාත්‍රා තුනෙන් තුනට විභාග වන ගීතයක මාත්‍රා 6 ක් දක්වා ඇදෙන්නේ කෙසේ ද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු සපයා ගැනීමට ඉදිරි පාඩම්වල දී හැකිවනු ඇත.

04. ඉහත සඳහන් කළ ඕනෑම සංකේතයකට ඉදිරියෙන් තිතක් යෙදූ විට එම සංකේතයට නියමිත වටිනාකමට එයින් තවත් භාගයක වටිනාකමක් එකතු වේ. උදා - Semibreve එකකට තිතක් යෙදූවිට එය හඳුන්වන්නේ Dotted Semibreve යන නමිනි. එහි වටිනාකම මාත්‍රා 4 ක් සහ ඉන් භාගයක් වන මාත්‍රා 2 ත් එකතු වී 6 ක් ලෙස සඳහන් කළ හැකිය.

05. පහත දැක්වෙන වගුව පුරවන්න.

| නම | සංකේතය | සංකේතයේ මුල් වටිනාකම | තිතට එකතුවන වටිනාකම | මුලු වටිනාකම |
|---|---|---|---|---|
| ඩොටඩ් සෙමිබ්‍රීව් |  | 4 | 2 | 6 |
| ඩොටඩ් මිනිම් |  | | | |
| ඩොටඩ් ක්‍රොචට් |  | | | |
| ඩොටඩ් ක්වේවර් |  | | | |
| ඩොටඩ් සෙමි ක්වේවර් |  | | | |

07. පහත දැක්වෙන ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න.



# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

එළඹෙන අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණදිය හැකි පුරවැසි පිරිසක් රටට දායාද කර දීම නව සහශ්‍රකයේ දොරට වඩින පරිණාමන ගුරු භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ. මේ ගුරු භූමිකාව මැනවින් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ වෙත ඉදිරිපත් කර ඇත්තේ ශිෂ්‍ය කේන්ද්‍රිය (STUDENT - CENTRED), නිපුණතා පාදක (COMPETENCY - BASED), ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY - ORIENTED), ප්‍රවේශයක් ගන්නා විෂයමාලාවකි.

පූර්වයෙන් සංවර්ධනය කළ ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම් හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමග සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසු කණ්ඩායම් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත්, ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේ දී සිසුන් විවරණයට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත්, ගුරුවරයාට අවස්ථාව තිබේ. ගවේෂණයේ යෙදෙන සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්ය සමීපව නිරීක්ෂණය කරමින්, ඔවුන් මුහුණ පා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සැපයීමත් පන්තියේ සෑම ළමයකු ම ආසන්න ප්‍රවීණතා මට්ටම වෙත හෝ ළඟාකර වීමත් තක්සේරුව යටතේ ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එසේ ම ගවේෂණය හරහා සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම විනිශ්චය කර ප්‍රකාශයට පත් කිරීම ඇගයීම යටතේ සිදුවිය යුතු වේ.

තක්සේරුවේ යෙදී සිටින ගුරුවරුන්ට ස්වකීය සිසුන් වෙනුවෙන් ලබා දිය හැකි දෙයාකාර වූ මාර්ගෝපදේශ, ප්‍රතිපෝෂණය (FEED BACK), හා ඉදිරි පෝෂණය (FEED FORWARD), ලෙස හැඳින්වේ. සිසුන්ගේ දුබලතා හා නො හැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මග හරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනාගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත්, ලබා දීම ගුරු කාර්ය වේ. සිසු ඉගෙනුම අඛණ්ඩව ඉදිරියට ගෙන යාම සඳහා විෂය නිර්දේශයට ඇතුළත් නිපුණතා මට්ටම් කිනම් ප්‍රමාණයකින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනාගෙන සිසුන්ට දැනුම් දීම ද මේ තරමට ම වැදගත් ය. ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ද ගුරුවරුන් යොමු විය යුතු වේ.

තක්සේරුව හා ඇගයීම පහසුකර ගැනීම සඳහා පොදු නිර්ණායක පහක් යෝජනා කර තිබේ. මෙම නිර්ණායක අතුරින් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතා මට්ටමට අදාළ විෂය අන්තර්ගතය හා බැඳී ඇති අතර, දුෂ්කරතා අනුපිළිවෙලින් සකස් කරනු ලබන විෂය හැකියා තුනක් ලෙස පෙළගස්වා තිබේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇසුරෙන් සංවර්ධනය කර ගත යුතු අවසාන නිර්ණායක දෙක ඕනෑම විෂයයක් ඉගෙනීමේ දී වැදගත් වන පොදු හැකියා දෙකකි. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක විමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩනැගීම තහවුරු කිරිමටත්, ඇගයීම යටතේ එම චර්යා ගොඩනගා ගත් මට්ටම විනිශ්චය කර ඒ පිළිබඳ සිසුන් දැනුවත් කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

පාසල් මට්ටමේ තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල තවත් ඉදිරියට ගෙනයාම සඳහා ඉගෙනුම්-ඉගැන්වීම්-ඇගයීම් උපකරණ සකස්කර මේ කොටසට ඇතුළත් කර තිබේ. ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම් අර්ථවත්ව කාණ්ඩකර ගැනීම මේ යටතේ මුලින් ම සිදුවිය යුතු කාර්යයයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ඉගෙනුම්-ඉගැන්වීම් ඇගයීම් ප්‍රභේද කීපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කරගෙන තෝරාගෙන ඇති අතර එම ප්‍රභේද ඔස්සේ ගුරුවරයාගේ ඉගැන්වීමත්, ශිෂ්‍යයන්ගේ ඉගෙනුමත් කාලසටහනෙන් බැහැරට ගෙන යාමට හා වාරික සොයා බැලීම් හරහා සිසු ඉගෙනුම තහවුරු කිරීමට ගුරුවරයා ඉදිරිපත් විය යුතුවේ. ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩයේ පළමු ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරෙන අතර ක්‍රියාකාරකම් කාණ්ඩයේ සියලු ම ක්‍රියාකාරකම් කාල සටහන තුළ ක්‍රියාත්මක වන මුළු කාලය පුරා වාරිකව තක්සේරුවේ යෙදීම ද ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් කාණ්ඩයට අයත් සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වී අවසාන වූ කල පූර්වයෙන් තීරණය කර ගත් දිනක ගවේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමටත්, ඒවා විස්තාරණය කිරීමටත් සිසුන්ට ඉඩ සලසා දිය යුතු වේ. ඒ ඒ ක්‍රියාකාරකම තුළ සිදු කළ ආකාරයට ම මේ විස්තාරණය ද අවස්ථා කිහිපයක් ඔස්සේ සිදු කළ යුතු අතර පළමු විස්තාරණ අවස්ථාව ඉදිරිපත් කළ සිසු කණ්ඩායමටත් දෙවන අවස්ථාව අසා සිටි කණ්ඩායම්වලටත් අවසාන අවස්ථාව ගුරුවරයාටත් ලැබිය යුතු වේ. විවරණ හා විස්තාරණ අවස්ථාවල දී තමා අත්දුටු සියලු අපැහැදිලි තැන් පැහැදිලි කරමින් ද, සාවද්‍ය දේ නිවැරදි කරමින් ද, අඩු පාඩු සහිතව ඉදිරිපත් කරන ලද කරුණු සම්පූර්ණ කරමින් ද ඉගෙනුම් ඵල සඳහා පදනම සකසන විෂය කරුණු මතු කරමින් ද ඇගයීම් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරමින් ද ගුරුවරයා අවසාන සමාලෝචනය ඉදිරිපත් කළ යුතුයි. මේ අනුව ගුරුවරයා විසින් සිදු කළ යුතු සිසු ඇගයීම කිසි විටකත් අවසානයට කල් දමා නොමැති බව ඔබ තේරුම් ගත යුතු අතර සිසුන් විවරණයේ හා විස්තාරණයේ යෙදෙන අවස්ථා මේ සඳහා තෝරා ගත යුතු බව ද අමතක නොකළ යුතුයි. ඉගෙනුම්-ඉගැන්වීම්-ඇගයීම් උපකරණ හඳුන්වා දෙන ආරම්භක අවස්ථාවේ දී ගනුදෙනු ගුරු භූමිකාව ප්‍රමුඛ වන අතර ඉගෙනුම්-ඉගැන්වීම්-තක්සේරු- ඇගයීම් ක්‍රියාවලිය අවසානයේ දී සම්ප්‍රේෂණ ගුරු භූමිකාව යටතේ අවසාන විස්තාරණය කිරීමට ගුරුවරයාට සිදු වේ.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තුන්වන කොටස ක්‍රියාකාරකම් සන්තතිය තුළ නිම කළ යුතු ඇගයීම් අවස්ථා ගණනත්, ඒ එක් එක් ඇගයීම් අවස්ථාව සාර්ථක කර ගැනීම සඳහා තෝරාගෙන තිබෙන ඉගෙනුම්-ඉගැන්වීම්- ඇගයීම් උපකරණත්, සුතත්‍ය ඇගයීම් ක්‍රමයක් යටතේ වාර විභාවලට හා අවසාන විභාගයට ඉදිරිපත් විය හැකි ප්‍රශ්නවල ස්වභාවයත් හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. ජීවිතයේ සැබෑ අවස්ථා පදනම් කර ගත් විභාග ප්‍රශ්න ඔස්සේ යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම්-තක්සේරු-ඇගයීම් ක්‍රියාවලියට පණ පොවමින් ද ඒ ඒ ක්‍රියාකාරකම්වල හා ක්‍රියාකාරකම් කාණ්ඩවල නිශ්චිත ස්ථානවල තක්සේරුව හා ඇගයීම සිදු කරමින් ද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පෝෂණය කිරීමට ගුරුවරුන්ටත් ප්‍රබෝධයෙන් යුතු ව ඉගෙනුමේ නියැළීමට සිසුන්ටද මේ සියලු නවීකරණ මඟපාදා දෙයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාකාරකම් දීර්ඝ කිරීමේ උපකරණය

ක්‍රියාකාරකම් ඔස්සේ සිසුන් අධ්‍යයනය කළ විෂයකරුණු තුලින් අපේක්ෂිත නිපුණතා මට්ටමට ශිෂ්‍යයා ලඟා වී ඇත් දැයි සොයා බැලීමට හා ඇගයීමටත්, ලබාගත් ඉගෙනුමක් තවදුරටත් දීර්ඝ කිරීම සඳහාත් තවත් ක්‍රියාකාරකමක් ලෙස ඇගයීම සිදුවේ. මෙහිදී කුඩා විෂය කොටසකට සීමා නොවී නිපුණතා මට්ටමට යෝජනා කර ඇති සියලු විෂය කොටස් ආවරණය වනසේ ඇගයීමක් කිරීම සාධාරණය.

තෝරාගත් නිපුණතා මට්ටමට හෝ එවැනි මට්ටම් කිහිපයකට අදාල සියලු ක්‍රියාකාරකම් නිමකර අවසානයේ හෝ එක් එක් ක්‍රියාකාරකම අවසානයේ ගැලපෙන ලෙස සකස් කරගත් නිර්ණායක මත ඇගයීම සිදුකළ හැකිය. ඉගෙනුම දීර්ඝකිරීමේ උපකරණය හෝ ඇගයීම් සැළසුම ගුරුවරයා විසින් පූර්වයෙන් සැළසුම්කරගත යුතුවේ.

විභාග දෙපාර්තමේන්තුවේ සහතික කරණය සඳහා සංගීත විෂයයේ දී අවශ්‍ය ඇගයීම් සංඛ්‍යාව තුනක් වන අතර ඉගෙනුම දීර්ඝකිරීම සඳහා යොදාගත් ක්‍රියාකාරකම් තුලින් ශිෂ්‍යයා ලබාගත් ලකුණු ඒ සඳහා වාර්තා කළ හැකිය. මේ අනුව විභාග දෙපාර්තමේන්තුවෙන් මේ වන විටත් යෝජනා කර ඇති ඇගයීම් ප්‍රභේද වලට අමතරව ඉගෙනුම දීර්ඝ කිරීම සඳහා සංගීත ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රායෝගික පරීක්ෂණ:- Practical Test
- සංකල්ප සිතියම:- Concept Map
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්:-Quizzes
- ප්‍රශ්න හා පිළිතුරු පොත්:- Question and Answer book.
- ශිෂ්‍ය කාර්ය සාධන ගොනු:- Portfolios
- සිසු නිර්මාණ ප්‍රදර්ශන:- Exhibition & Presentation
- විවාද:- Debates
- සාකච්ඡා මණ්ඩල:- Panel Discussion
- සම්මන්ත්‍රණ:- Seminar
- ක්ෂණික කථා:- Impromptu Speeches
- භූමිකා රංගන:- Role Play
- සාහිත්‍ය විමසුම්:- Literature Reviews
- ක්ෂේත්‍ර පොත්/ ස්වභාව අධ්‍යයන වැඩ පොත්:- Field Books/ Nature Diaries

# ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් උපකරණය

## (ආදර්ශ ඇගයීම් පත්‍රිකාව)

1. ඇගයීම් අවස්ථාව :- 01 වාරය, උපකරණයේ අංකය 01.
2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:- 1.1,
3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය -
   - නිර්දේශිත රාගවලට අයත් කෙටි ස්වර ඛණ්ඩ, සර්ගම් මධ්‍යලය ගීත ගායනය /වාදනය
4. උපකරණයේ ස්වභාවය:-
   - ක්ෂණික ඉදිරිපත් කිරීමක්.
   - නිර්දේශිත රාගවලට අයත් ස්වර ගීත, රාගාංග ප්‍රකාශ වන පරිදි ගායනය/ වාදනය කිරීම.
   - ක්ෂණිකව සර්ගම්, මධ්‍යලය ගීත මතකයේ තබා ගනිමින් ගායනය වාදනය කිරීම.
5. අරමුණු.
   - රාගවලට අයත් ස්වර, ගීත, නිවැරදිව ගායනය/වාදනය කරයි.
   - දෘශ්‍ය මාධ්‍යයෙන් ස්වර හඳුනාගනිමින් නිවැරදිව රාග භාවය ප්‍රකාශ වන පරිදි ගායනය/වාදනය කරයි.
   - ප්‍රායෝගිකව අභ්‍යාස කළ රාග ක්ෂණිකව ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- අදාල ඇගයීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- මෙම ඇගයීම ප්‍රායෝගික ඇගයීමක් බවට සිසුන් දැනුවත් කරන්න.
- කණ්ඩායමක් ලෙසට හා තනිතනිව ප්‍රායෝගික කොටස් ඉදිරිපත් කළයුතු බව පහදා දෙන්න.

ගුරු උපදෙස් -

- කුසපත් ඇදීමේ ක්‍රමයට මෙම ඇගයීමේ දී එක් එක් ශිෂ්‍යයාට මාතෘකා සැපයේ පහත දැක්වෙන අයුරින් කුසපත් සකසා ගන්න.

1 පියවර

| |
|---|
| 1. බිලාවල් රාගයේ කෙටි ස්වර ඛණ්ඩයක් ගායනය කරන්න,<br><br>ග ප ම ග ම රි ස, ග ප ධ නි සං |

| |
|---|
| 2. කාෆි රාගයේ කෙටි ස්වර ඛණ්ඩයක් ගායනය කරන්න,<br><br>රි ප ම ප <u>ග</u> රි ස රි, ප - - - |

3. භූපාලි රාගයේ කෙටි ස්වර ඛණ්ඩයක් ගායනය කරන්න,

ස රි ග ප ධ ප, ග ප ධ ප, ග රි ස

4. බිලාවල් රාගයේ සර්ගම් ගීතයේ මුල් පාදය ගයන්න.

ග ප ධ නි/ ස̇ - ධ ප/ ම ග ම රි / ස රි ස -

5. කාෆි රාගයේ සර්ගම් ගීතයේ මුල් පාදය ගයන්න.

ස ස රි රි / ග ග ම ම/ ප - - ම / ප ධ නි ස̇/

6. භූපාලි රාගයේ සර්ගම් ගීතයේ මුල් පාදය ගයන්න.

ස̇ ස̇ ධ ප / ග රි ස රි/ ග - ප ග / ධ ප ග - /

7. බිලාවල් රාගයට අයත් ස්වර අභ්‍යාසයක් ආරෝහණය ගායනය කරන්න.

ස රි ග ප, ග ප ධ නි, ප ධ නි ස̇, ධ නි ස̇

8. කාෆි රාගයට අයත් ස්වර අභ්‍යාසයක් ආරෝහණය ගායනය කරන්න.

ස ස, රි රි , ග ග, ම ම, ප ප, ධ ධ, නි නි, ස̇ -

9. භූපාලි රාගයට අයත් ස්වර අභ්‍යාසයක් ආරෝහණය ගායනය කරන්න.

ස රි ග - , රි ග ප -, ග ප ධ - , ප ධ ස̇ - ,

10 බිලාවල් රාගයේ මධ්‍යලය ගීතයක පළමු පාදය ගයන්න.

ම න නු ව/ න් පි න න/ මේ s අ රු / ණෝ s දේ s /

11 කාෆි රාගයේ මධ්‍යලය ගීතයක පළමු පාදය ගයන්න.

සැ ප රි සි/ දී s නෙ ක / අ ද රි න / මා s වැ ඩු /

12 භූපාලි රාගයේ මධ්‍යලය ගීතයක පළමු පාදය ගයන්න.

ජා උං තො රි / ච ර න ක / ම ල පර / වා s s රි

2 පියවර

1. ශිෂ්‍යයා අහඹු ලෙස තෝරා ගත් කුසපතේ ඇති කොටස ගායනය/ වාදනය කරවන්න.

ඇගයීමේ ක්‍රමය -

- ඉතා හොඳයි - ලකුණු 04

  හොඳයි - ලකුණු 03

  මධ්‍යස්ථයි - ලකුණු 02

  තව දුරටත් සංවර්ධනය විය යුතු යි - ලකුණු 01

නිර්ණායක.

(1) තෝරාගත් කොටසේ ස්වර ස්ථානවල නිවැරදිතාවයට - ලකුණු 04 යි

(2) තෝරාගත් කොටසේ ස්වරවල මිහිරි තාවයට - ලකුණු 04 යි

(3) සබකෝලයෙන් තොරව ඉදිරිපත් කිරීමට - ලකුණු 04 යි

(4) ක්ෂණිකව ස්වර ගායන/ වාදනයේ දක්ෂතාවයට -ලකුණු 04 යි

(5) සමස්ත ශිල්පීය දක්ෂතාවයට - ලකුණු 04 යි

මුළු ලකුණු - ලකුණු 20

1. ඇගයීම් අවස්ථාව :- 01 වාරය, උපකරණයේ අංකය 02
2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:- 2.1, 2.2, 2.3, 2.4
3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය -
   - ස්වර පුවරුවෙන් හා තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර හා කෝමළ <u>ග</u> <u>නි</u> සහිත ස්වර අභ්‍යාස හා ගීත වාදනය
4. උපකරණයේ ස්වභාවය:-
   - ප්‍රායෝගික ක්‍රියාකාරකම්
5. අරමුණු.
   - ශුද්ධ ස්වර සහිත අභ්‍යාස හා කෝමළ <u>ග</u> <u>නි</u> සහිත අභ්‍යාස වාදනය කරයි.
   - ශුද්ධ ස්වර සහිත ගීත හා කෝමළ <u>ග</u> <u>නි</u> සහිත ගීත වාදනය කරයි.
   - නිවැරදි ස්වර ස්ථාන මතු කරමින් වාදනය කරයි.
   - ගීතයේ මිහිර මතු කරමින් වාදනය කරයි.
   - දිනපතා අභ්‍යාසයේ යෙදීම තුළින් මතක ශක්තිය වර්ධනය කරයි.
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- මෙම ඇගයීමෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් ස්වර පුවරුව හෝ තෝරා ගත් වාද්‍ය භාණ්ඩය වාදනය කිරීමෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රායෝගික ඇගයීමක් බවට ළමුන් දැනුවත් කරන්න.
- සිසුන් වෙත ඉදිරිපත් කරන තෝරාගැනීම් අතුරින් සිසුවා අභිමත ලෙස තෝරා ගත් අංකය සහිත ප්‍රශ්නයට පිළිතුරු සැපයීය යුතු බවට උපදෙස් දෙන්න.
- සිසුන් අතට පත් කරන ප්‍රශ්න ඇතුළත් තුණ්ඩු.

1. ශුද්ධ ස්වර සහිත ගීතයක් ස්වර පුවරුවෙන් වාදනය කරන්න.

2. ශුද්ධ ස්වර සහිත ගීතයක් තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරන්න.

3. ශුද්ධ ස්වර සහිත අභ්‍යාස දෙකක් ස්වර පුවරුවෙන් වාදනය කරන්න.

4. ශුද්ධ ස්වර සහිත අභ්‍යාස දෙකක් තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරන්න.

5. කෝමළ <u>ග</u> <u>නි</u> සහිත ගීතයක් ස්වර පුවරුවෙන් වාදනය කරන්න.

6. කා්මළ <u>ග</u> <u>නි</u> සහිත ගීතයක් තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරන්න.

7. කෝමල ග නි සහිත අභ්‍යාස දෙකක් තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරන්න.

8. කෝමල ග නි සහිත අභ්‍යාස දෙකක් තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරන්න.

07. ශිෂ්‍යයාට උපදෙස් - ගුරුවරයා විසින් ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන අංක අතුරින් ඔබ විසින් අහඹු ලෙස අංකයක් තෝරාගත යුතු යි. එහි නම් කර ඇති ස්වර පුවරුවෙන් හෝ තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කර පෙන්විය යුතු ය. වාදනයේ නිවැරදිතාව, මිහිරි බව, තාලයේ නිවැරදිතාවය, මතකය හා දෛනිකව අභ්‍යාස කරන බව ප්‍රදර්ශනය වීම යන කරුණු මත ලකුණු හිමි වෙයි.

08. ඇගයීමේ ක්‍රමය - නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයට ලකුණු 05 බැගින් නිර්ණායක පහට මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

- ඉතා හොඳයි - ලකුණු 04
  හොඳයි - ලකුණු 03
  මධ්‍යස්ථයි - ලකුණු 02
  තව දුරටත් සංවර්ධනය විය යුතු යි - ලකුණු 01

නිර්ණායක.

(1) ස්වර ස්ථාන නිවැරදිව වාදනය කිරිම - ලකුණු 04 යි
(2) තාලයට අනුව වාදනය කිරීම - ලකුණු 04 යි
(3) වාදනයේ මිහිරි ඉරියව් - ලකුණු 04 යි
(4) මතකයේ නිවැරදි බව -ලකුණු 04 යි
(5) දිනපතා අභ්‍යාසයේ යෙදෙන්නෙකු බව ප්‍රදර්ශනය වීම - ලකුණු 04 යි

මුළු ලකුණු - ලකුණු 20

| නිර්ණායක / කණ්ඩායම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ නම | 1 | 2 | 3 | 4 | 5 | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |

1. ඇගයීම් අවස්ථාව :- 02 වාරය, උපකරණයේ අංකය 01

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:- 4.1, 5.1

3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය -
   - වන්නම්, ප්‍රශස්ති, නාඩගම්, නූර්ති, ශෛලීන් පිළිබඳ තොරතුරු
   - නිර්දේශිත ගීත
     4, 5, නිපුණතාවන්ට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂය කරුණු (ප්‍රශස්ති, වන්නම්, නාඩගම්, නූර්ති)

4. උපකරණයේ ස්වභාවය:-
   - කණ්ඩායම් ක්‍රියාකාරකම්
   - 4, 5 නිපුණතාවයන්ට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් ප්‍රායෝගික කොටස් ඇතුළුව සිසුන් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරණු ලබන ගොනුවක්/ පොත් පිංචක්, සහ ප්‍රාසාංගික හැකියා දැක්මක්

5. අරමුණු.
   - 4, 5 නිපුණතාවයන්ට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂය කරුණු සංවිධානාත්මකව රැස් කරයි.
   - විෂය කරුණු ක්‍රමවත් ලෙසට ගොනු කරයි.
   - අදාළ රංග ශෛලීන් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරයි.
   - ශෛලීන් අයත් නිර්දේශීත ගීත මිහිරි ලෙස ගායනා කරයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් -

   ගුරු උපදෙස්
   - දෙවන වාරයට නියමිත 4, 5 නිපුණතාවයන්ට අදාළ ව සිසුන් විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් සියල්ලම ආවරණය වන පරිදි නිමැවුමක් ඉදිරිපත් කිරීම. මෙම කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් අපේක්ෂා කෙරේ.
   - මේ පිළිබඳ ව දෙවන වාරය ආරම්භයේ දී ම සිසුන් දැනුවත් කරන්න.
   - මේ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
   - ඇමුණුම්වල සඳහන් වන විෂය කරුණුවලට අමතරව වීඩියෝ පට , ශ්‍රව්‍ය පට, රූප සටහන්, පරිශීලනයට අවශ්‍ය පොත් පත් ලබා දෙන්න.
   - කුසපත් ඇදීමෙන් එක් එක් කණ්ඩායම්වලට නියමිත ක්‍රියාකාරකම තෝරා ගැනීමට අවස්ථාව සලස්වන්න.
   - කණ්ඩායම් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවලට ලැබෙන පොදු ලකුණ කණ්ඩායමේ සියලුම සමාජිකයන්ට හිමිවේ.
   - කණ්ඩායම් ක්‍රියාකාරකම් ප්‍රසාංගාත්මකව ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී ගායන හැකියා, රංගන හැකියා මත එක් එක් ශිෂ්‍යයාගේ පෞද්ගලික දක්ෂතා ඇගයීමට ලක් කළ හැකි ය

07. ශිෂ්‍යයාට උපදෙස්

- ගුරුවරයාගේ මඟ පෙන්වීම මත ක්‍රියාකාරකමට අදාළ ව ඔබ මෙතෙක් අධ්‍යයනය කළ වන්නම්, ප්‍රශස්ති, නූර්ති, නාඩගම් පිළිබඳ ව තොරතුරු ඇතුළත් කරමින් ඔබගේ අධ්‍යයනයට පහසු වන පරිදි කුඩා ගොනුවක් / පොත් පිංචක් සාදා ගන්න.

- දෙවනුව, කුසපත් ඇදීමෙන් ඔබ තෝරාගත් කොටසට අදාළ ව කණ්ඩායම එක්වී එම ශෛලියට අදාළ කොටස ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.

  * එම කොටසට උචිත රංග වස්ත්‍රාභරණ තාල වාද්‍ය භාණ්ඩ, අංග චලන, විශේෂයෙන් ගායනය ඇතුළත්ව ඉදිරිපත් කිරීමට මුළු ලකුණු හිමි වේ.
- කණ්ඩායමේ සියලු දෙනා සහභාගී කරවා ගැනීමට වග බලා ගන්න.

08. ඇගයීමේ ක්‍රමය

-නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයට ලකුණු 04 බැගින් නිර්ණායක පහට මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

- ඉතා හොඳයි - ලකුණු 04

  හොඳයි - ලකුණු 03

  මධ්‍යස්ථයි - ලකුණු 02

  තව දුරටත් සංවර්ධනය විය යුතු යි - ලකුණු 01

නිර්ණායක.

| | | |
|---|---|---|
| (1) | කණ්ඩායම් වශයෙන් රැස්කරගත් තොරතුරුවල ප්‍රමාණාත්මක බව | - ලකුණු 04 යි |
| (2) | එම තොරතුරු නිරවද්‍යතාවය | - ලකුණු 04 යි |
| (3) | ඉදිරිපත් කරණු ලබන රංගශෛලීන්වල ප්‍රසාංගාත්මක බව | - ලකුණු 04 යි |
| (4) | ගායනයේ හා රංගනයේ මිහිරි බව හා ශිල්පීය දක්ෂතාවය | -ලකුණු 04 යි |
| (5) | කාර්යයෙහි නියැලීම, සහයෝගය, වගකීම් දැරීම සහ කාලයට අනුව වැඩ අවසන් කිරීම | - ලකුණු 04 යි |
| | මුළු ලකුණු | - ලකුණු 20 |

1. ඇගයීම් අවස්ථාව :- 03 වාරය, උපකරණයේ අංකය 03

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටමඃ- 6.1, 7.1

3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය -
   - රිද්ම රටා,
   - මූලික මත් ගණ තුන හා බැඳි රිද්ම රටා
   - රිද්ම රටාවන්ට ගැළපෙන ගී පද සහ ස්වර නිර්මාණය
   - සැදෑස්මත් ගීමත් ගණනය කිරිම
   - ගී පද ප්‍රස්තාරකරණය

4. උපකරණයේ ස්වභාවයඃ-
   - නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
   - විවිධ රිද්ම රටා ප්‍රායෝගිකව විදහා දක්වීම
   - රිද්ම රටාවන්ට ගැළපෙන සේ ගී පද නිර්මාණය කිරීම.
   - ගී පද මාලාවන්ට ස්වර යෙදීම
   - සදෑස්මත් ගීමත් ගණනය කිරිම
   - ගී පද ප්‍රස්තාර කිරීම

5. අරමුණු.
   - ගීත රිද්මයට අනුව තාල තබයි.
   - රිද්ම රටාවන්ට ගැලපෙන සේ ගී පද නිර්මාණය කරයි.
   - ගී පාද වලට උචිත ස්වර රටා යොදමින් තනු නිර්මාණය කරයි.
   - සැදෑස්මත් සහ ගීමත් ගණනය කරයි.
   - ගී පද ප්‍රස්තරකරණයේ යෙදෙයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් -

ගුරු උපදෙස්
   - අදාළ ඇගයීම් පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
   - සිසුන්ගේ නිර්මාණාත්මක හැකියා උරගා බැලීමෙන් ක්‍රියාකාරකමක් බැවින් එම ඇගයීමට අදාළ කරගන්නා විෂය කරුණු පිළිබඳව සිසුන්ට නැවත මතක් කිරීමක් කරන්න.
   - උචිත පරිදි සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
   - කණ්ඩායම්වලට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා දෙන්න.
   - කණ්ඩායම් ලෙසට හා තනි තනි ව නිර්මාණාත්මක කොටස් ඉදිරිපත් කළ යුතු බව පහදා දෙන්න.
   - විවිධ රිද්ම රටාවන්ට අයත් ගීත ගායනය/ වාදනය කර දක්වමින් ඒට ගැළපෙන රිද්මයට අනුව තාල තැබීමට සලස්වන්න. (අත්ලෙන් හෝ අවනද්ධ වාද්‍ය භාණ්ඩයකින්)
   - එම ක්‍රියාකාරකම්වලට හිමිවන පොදු ලකුණ කණ්ඩායමේ සියලු සාමාජිකයන්ට ලැබේ.

- සැදෑස්මත් හා ගීමත් පැහැදිලිව පෙන්නුම් කෙරෙන ගී පාද දෙකක් කණ්ඩායම්වලට ලබා දී එහි ඇති සැදෑස්මත් සහ ගී මත් ගණනය කිරීමට අවස්ථාව සලස්වන්න.
- එම ගී පාද ප්‍රස්තාර කිරීමට අවස්ථාව දෙන්න. කණ්ඩායම්වල ක්‍රියාකාරකම්, යෝජිත නිර්ණායක ඔස්සේ තක්සේරුකරමින් ලකුණු ප්‍රදානය කරන්න.
- අවශ්‍ය අවස්ථාවන්හී දී සිසුන්ට මග පෙන්වමින් උපස්ථම්බන ලබා දෙන්න.

07. ශිෂ්‍යයාට උපදෙස්

- ඔබගේ නිර්මාණාත්මක හැකියා අගය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති විෂය කරුණු පිළිබඳව ගුරුතුමා /තුමිය සමග සාකච්ඡා කර ඒ පිළිබඳ ව අවබෝධය ලබා ගන්න.
- කණ්ඩායම් වශයෙන් සහ ඒකල ව ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.
- ගුරුතුමා ඉදිරිපත් කරනු ලබන ගීත සඳහා උචිත රිද්මයන් හඳුනා ගන්න.
- විවිධ රිද්ම රටාවන් සඳහා ගැළපෙන ගී පද නිර්මාණය කරමින් (ස්වර යොදා) මිහිරි තනුවක් ලෙස නිර්මාණය කරන්න.

08. ඇගයීමේ ක්‍රමය

-නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයට ලකුණු 04 බැගින් නිර්ණායක පහට මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

- ඉතා හොඳයි - ලකුණු 04
  හොඳයි - ලකුණු 03
  මධ්‍යස්ථයි - ලකුණු 02
  තව දුරටත් සංවර්ධනය විය යුතු යි - ලකුණු 01

නිර්ණායක.

(1) ගීතවලට ගැළපෙන සේ තාල තබයි - ලකුණු 04 යි
(2) විවිධ රිද්මරටාවන්ට උචිත ලෙස ගී පද නිර්මාණය කරයි. - ලකුණු 04 යි
(3) උචිත ලෙස තනු නිර්මාණය කරයි - ලකුණු 04 යි
(4) සැදෑස්මත් හා ගී මත් නිවැරදි ලෙස ගණනය කරයි -ලකුණු 04 යි
(5) ගී පාද ප්‍රස්තාර කරයි - ලකුණු 04 යි

මුළු ලකුණු - ලකුණු 20

## වාර විභාග සඳහා ආදර්ශ ප්‍රශ්න

වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ගප මග ම රි ස -, රි ග̱ රි ම ග̱ රි ස -, ස රි ග - ප ග රි ස,

   ඉහත සඳහන් රාග සංගති අයත් රාග අනුපිළිවෙලින් ගත් කළ

   1. කාෆි, බිලාවල්, භූපාලි රාග වලට අයත් වේ.
   2. බිලාවල්, කාෆි, භූපාලි රාග වලට අයත්වේ.
   3. කාෆි, භූපාලි, බිලාවල් රාග වලට අයත්වේ.
   4. භූපාලි, කාෆි, බිලාවල් රාග වලට අයත් වේ.

2. ශුද්ධ ස්වර පමණක් යෙදෙන ඖඩව ජාති රාගයක සර්ගම් පාදයක් වන්නේ

   1. ස̇ස̇ධප/ ගරිසරි/ ග-පග/ ධපග-/
   2. ගපධනි/ ස̇-ධප/මගමරි/ සරිස-/
   3. සසරිරි/ගගමම/ ප--ම/පධනිස̇
   4. ග-මරි/ ගපධනි/ ස̇නිධප/ මගරිස

3. කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබූ ගීත විශේෂයක් වනුයේ

   1. හටන් ගී
   2. වන්නම්
   3. විරිදු
   4. සංදේශ කාව්‍ය

4. ස̇-ප-/ --ධ̱ප/ මධ̱පම/ ගරිසනි̱̣/

   මෙම ස්වර ප්‍රස්තාරය අයත් වන්නම වනුයේ

   1. නෛයියඩි වන්නම
   2. උකුසා වන්නම
   3. තුරඟා වන්නම
   4. හනුමා වන්නම

පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| මහතනි තිත<br>මැදුම්/මහ දෙතිත<br>මැදුම් තනි තිත | ගැටබෙරය<br>පහතරට බෙරය<br>දවුල | තානම<br>කවිය<br>කස්තිරම<br>සීරු මාරුව<br>අඩව්ව | මෝරා බීජයෙනා<br>ඉපිද එබෝසත්<br>ගිරෙන්ගිරට පැන |

5. උකුසා වන්නම ගැයෙන තිත ඇතුලත්ව ඇත්තේ

1. A 2. B 3. C 4.D

6. උඩරට වන්නමක කොටස් ඇතුළත් වන්නේ

1. B කොටසෙහි ය. 2. C කොටසෙහි ය. 3. A කොටසෙහි ය. 4. D කොටසෙහි ය.

7. D කොටසට ඇතුළත් වන ගී විශේෂය වන්නේ

1. ප්‍රශස්ති 2. වන්නම් 3. විරිදු 4. හටන් ගී

8. දොංදෝ / ජිංගත /ජිගත / දොංතක

මෙම බෙරපදයට වාදනය වන වන්නම ඇත්තේ

1. B 2. A 3. C 4. D

9. අර්ථය ප්‍රකාශ නොවන පද කොටසක් වන්නමක ඇත. එම කොටස හඳුන්වන්නේ

1. කවිය 2. අඩව්ව 3. කස්තිරම 4. තානම

10. සිතාරය වාදනය කිරීමේ දී භාවිතා කරණු ලබන උපකරණය හඳුන්වන්නේ

1. පික් 2. අළුව 3. මිස්රාබ් 4. කඩිප්පුව

11. මන්ද්‍ර සප්තකය හා උච්ච සප්තකය සම්පූර්ණයෙන් ම වාදනය කළ හැකි වාද්‍යභාණ්ඩය වන්නේ

1. සිතාරය 2. වයලීනය 3. සර්පිනාව (හාර්මෝනියම්) 4. එස්රාජය

12. ස්වර පුවරුවේ කළුයතුරු තුනක් එක ලඟ පිහිටා ඇති ස්ථානයේ මුල් ම කළු යතුරෙන් නිකුත්වන ස්වරය වන්නේ

1. ස 2. ධ 3. ම 4. ප

14. වයලීනය මෙන් අළුවකින් වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩය වන්නේ

1. එස් රාජය 2. සිතාරය 3. ස්වරපුවරුව 4. බටනලාව

| A | B | C | D |
|---|---|---|---|
| නිල් අහස්තලේ | දාදරා | X | සසසස/සසසස |
| රත්නදීප ජන්ම භූමි | ත්‍රිතාල් | 0 | සසස/සසස |
| | බෙම්ටො | 2 | සසස සසස |
| | ජප් තාලය | 3 | සස / සසස |

15. A කොටසෙහි 2 වන තීරුවෙහි ගීතයට අයත් තාලය සඳහන් වනුයේ

1. B කොටසෙහි 1 වන තීරුවෙහි ය.
2. B කොටසෙහි 2 වන තීරුවෙහි ය.
3. B කොටසෙහි 3 වන තීරුවෙහි ය.
4. B කොටසෙහි 4 වන තීරුවෙහි ය.

2 වන කොටස

1. සිතාරයේ දළ රූපසටහනක් ඇඳ එහි ස්වර පිහිටන ස්ථාන ලකුණු කරන්න
2. ගම්මැද්ද මහ විදුහලේ කලා උළෙල සඳහා ඉදිරිපත් කළ ප්‍රසාංග අංග කිහිපයක් විය. ඒ සඳහා ප්‍රශස්ති ගී ආභාෂයෙන් නිර්මාණය වූ සරල ගීතයක් ද ප්‍රසංගය වර්ණවත් කිරීමට යොදාගෙන තිබුණි.
    1. ප්‍රශස්ති ගී ආභාෂයෙන් නිර්මාණය වූ සරල ගීයක මුල් පාද දෙක ලියා දක්වන්න
    2. ගීතය ඉදිරිපත් කිරීමට යොදාගත් සංගීත භාණ්ඩ හතරක් ලියන්න
    3. ප්‍රශස්ති ගීතවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හතරක් ලියන්න

.

3. 1. වන්නම් නිර්මාණය වූයේ කුමන රජතුමාගේ කාලයේ ද ?
    2. උඩරට වන්නමක ඇතුළත් කොටස් ලියන්න.
    3. ඔබ කැමති වන්නමක තානම ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

4. ප්‍රශස්ති ගී යන්න කෙටියෙන් පැහැදිලිකරන්න
    1. ප්‍රශස්ති ගීයක පද පමණක් ප්‍රස්තාර කරන්න.
    2. උකුසා, නෛයඩි වන්නම් පිළිබඳ කෙටිවිස්තරයක් ලියන්න.

5. සංගීත නිර්මාණයේ දී ප්‍රස්තාර කිරීමේ සහ කියවීමේ කුසලතාව අත්‍යවශ්‍ය බව ඔබේ ගුරුතුමා / තුමිය ඔබට පවසා ඇත. ගීත ප්‍රස්තාර කිරීමේ දී විවිධ සලකුණු බටහිර සංගීතයේ මෙන් ම හින්දුස්ථානි සංගීතයේ දී ද වැදගත් වේ.
    1. බටහිර සංගීතයේ ස්වර සඳහා යොදාගන්නා සංකේත හතරක් ලියාදක්වන්න
    2. හින්දුස්ථානි සංගීතයේ තාල සංඥා හතරක් ලියාදක්වන්න

6. 1 2 3 4 / 5 6 7 8 ඉහත අංක යටතේ
    1. කාෆි රාගයට අයත් ආරෝහණ ස්වර ලියන්න.
    2. ඉහත අංක ක්‍රමය අනුව පහත සඳහන් ප්‍රස්තාරයේ අංකවලට අදාළ කාෆි රාගයේ ස්වර ලියා දක්වන්න.

i. 1 1 2 2/ 3 3 4 4/ 5 - - 4/ 5 6 7 8

ii. 7 6 5 4/ 3 3 2 2/ 2 5 4 5/ 4 3 2 1

7. රේඛා මණ්ඩලය මත බටහිර සංගීත ස්වර 7 ලියා දක්වන්න.

8. ඉහත කුසලතා වර්ධනය කරගැනීමට ප්‍රස්තාර කරණයේ ඇති වැදගත් කම කෙටියෙන් හඳුන්වන්න.

9. පර්දා වලින් සමාන, වාදනය කරන ආකාරය අසමාන, ප්‍රධාන තත සුසර කිරීමෙන් සමාන කම් දක්වන, භාණ්ඩ යුගලය සඳහා වඩාත් නිවැරදි කියමන නම්

   1. එස් රාජයේ ප්‍රධාන තත් 4 යි. සිතාරයේ තත් 7යි.
   2. සිතාරයේ තත් 4යි එස්රාජයේ 7යි.
   3. භාණ්ඩ යුගලය මිශ්‍රාභයෙන් වාදනය කරයි.
   4. භාණ්ඩ යුගලය ම වාදනය කරන ශෛලිය සමානවේ.

10. ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ මහනුවර යුගයේ ප්‍රචලිත වූ ගී විශේෂයන් දෙකක් පහත දැක්වේ. ඒවා සම්බන්ධ කරගනිමින් පහත දැක්වෙන වගුව පුරවන්න.

| | වන්නම් | ප්‍රශස්ති |
|---|---|---|
| 01. ගී වර්ගය කෙටියෙන් හඳුන්වන්න. | | |
| 02. මෙම ගී විශේෂයන් භාවිත කළේ කුමක් සඳහාද? | | |
| 03. විශේෂ කොටස් මොනවා ද? | | |
| 04. භාෂාව පිළිබඳ ඔබ දක්වන අදහස් කවරේ ද? | | |

11 i. ඔබ කැමති ගීතයක මුල්පාද දෙක ස්වර ප්‍රස්තාර කරන්න.

ii. එම ස්වර පාද දෙක බටහිර ක්‍රමයට අදාල සියලු සංකේත යොදමින් රේඛා මණ්ඩලයක් තුළ ප්‍රස්තාර කරන්න.

iii. එම ස්වර ප්‍රස්තාරයේ පහත දැක්වෙන කොටස් ඇත්නම් A,B,C,D, ........ආදී වශයෙන් වෙන්කර දක්වන්න.

   a. Staff නැතහොත් Stave
   b. Treble Clef
   c. Leger Line
   d. Minim,
   e. Crotchet
   f. Quaver